
වාර්ෂික වාර්තාව

வருடாந்திர அறிக்கை

ANNUAL REPORT

2020







ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

ஶ்ரீலங்கா ஆட்டோமிக் எனர்ஜி போர்டு

SRI LANKA ATOMIC ENERGY BOARD

පටුන

පිටු අංකය

1. සභාපතිතුමාගේ සමාලෝචනය **05-12**

2. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය **13**

3. විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය 2020 **14-29**

4. න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සේවා සැපයීම

4.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මඟින් සපයන ගැමා ප්‍රචිකිරණ සේවාවන් **30**

4.2 ජෛව විද්‍යා අංශය විසින් සපයනු ලබන න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා **31-39**

4.3 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන NDT සේවාවන් **40-46**

4.4 සාමාන්‍ය විද්‍යාත්මක අංශය මඟින් සපයනු ලබන සේවාවන් **47-52**

4.5 කර්මාන්ත යෙදවුම් අංශය: පර්යේෂණ සහ සංවර්ධන කටයුතු **52-58**

5. ජාත්‍යන්තර ආයතන සමඟ පවත්වන සහයෝගීතාවය **59-65**

5.1 IAEA සහ අනෙකුත් ආයතන හරහා සිදු කරන තාක්ෂණික සහයෝගීතා සේවාව

5.2 දැනුම ව්‍යාප්ත කිරීම

5.3 න්‍යෂ්ටික බලශක්ති සැලසුම් වැඩසටහන

6. පරිපාලන අංශය **65-75**

6.1 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි මුළු සේවක තොරතුරු

6.2 කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ලැයිස්තුව - 2020

6.3 කාර්ය මණ්ඩල ඉල්ලා අස්වීමේ ලැයිස්තුව - 2020

6.4 ලබාගත් ප්‍රාග්ධන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

7. මූල්‍ය ප්‍රකාශනය - 2020 **76-113**

8. විගණකාධිපතිගේ වාර්තාව - 2020 **114-126**

9. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා කලමනාකරණ පැහැදිලි කිරීම් හා පිළිතුරු **127-134**

අප ගැන

ශ්‍රී ලංකාව තුල න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ සියළු කටයුතු පාලනය කරන්නා වූ රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (ශ්‍රී ල. ප. බ. ම.) වේ.

ජාත්‍යන්තර සහයෝගය ඇතුව, ජාතික සංවර්ධන අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීම උදෙසා මහජනතාව, පරිසරය හා විශේෂයෙන් විකිරණ සේවකයින් හානිකර මට්ටමේ විකිරණයට පාත්‍ර වීමෙන් ආරක්ෂා කර ගැනීම ඇතුළුව සෞඛ්‍ය, කර්මාන්ත, කෘෂිකර්මාන්ත සහ පරිසරය යන ක්ෂේත්‍රයන් තුළ තාක්ෂණික හුවමාරුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය ඔස්සේ විවිධාකාර වූ සේවාවන් සපයනු ලබයි.

අපගේ දැක්ම

න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය තුළින් ජාතියේ තිරසර සංවර්ධනය.

අපගේ මෙහෙවර

සාමකාමී කටයුතු සඳහා න්‍යෂ්ටික තාක්ෂණ යොදා ගැනීම වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම සහ ධෛර්යමත් කිරීම මෙන්ම විකිරණ ආරක්ෂාව, සුරක්ෂිතතාවය සහ ප්‍රතිඵල තහවුරු කර ගනිමින් රටෙහි සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා එහි ඵල ප්‍රයෝජන භාවිත කිරීම.

හා

විකිරණ සේවකයන්, මහජනතාව හා පරිසරය, හානිකර මට්ටමේ විකිරණයට පාත්‍ර වීමෙන් ආරක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා විකිරණ ආරක්ෂණ සේවාව ලබාදීම.

අපගේ ප්‍රතිපත්ති හා හර පද්ධතීන්

ශ්‍රී ලාංකික ජාතියේ ඵල ප්‍රයෝජනය සහ සුභසාධනය උදෙසා න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සාමකාමී කටයුතු සඳහා යෙදවීමේදී, විකිරණ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ඉහල ප්‍රමිතියෙන් යුතු වෘත්තිය දක්ෂතා සහිත අචාරශීලී සේවයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්ය මණ්ඩලය කැපවී කටයුතු කරයි. සියළුම කටයුතු වලදී මෙම ප්‍රතිපත්ති හා හර පද්ධතීන් මූලික වන අතර, ඒ අනුව වැඩසටහන් දියත් කිරීමේදී අවශ්‍ය උපායශීලී දිශානතියන් පෙන්නුම් කරනු ලබයි.

- **විකිරණ ආරක්ෂාව, සුරක්ෂිතතාවය සහ තිරසර බව :** න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය භාවිතයේ දී හා තිරසර සංවර්ධන කටයුතු සඳහා දායක වීමේදී, විකිරණ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

- **අවංකකම සහ විවෘතභාවය**: ඵලදායී සන්නිවේදනය තුලින් ආයතනය සමඟ අනෙකුත් පාර්ශවකරුවන් විශ්වාසය හා ගරුත්වය ගොඩනගා ගැනීම.

- **සහයෝගීත්වය සහ ප්‍රතිචාර්යතාවය**: අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, සහයෝගීතාවය හා කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කිරීම, නව අදහස් හා නව නැඹුරුතාවයන් වටහා ගැනීම.

- **ප්‍රවීනත්වය හා වෘත්තීය දක්ෂතාවන්**: විශේෂිත දැනුම සම්බන්ධ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමට සහ එය අනෙකුත් පාර්ශවකරුවන් වෙත ලබා දීමට මහත් පරිශ්‍රමයක් දැරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය

2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතෙහි 06 වන කොටසට අනුව පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මෙහෙයවනු ලබයි. 2020 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූයේ:

නම	අධ්‍යක්ෂ මණ්ඩලයේ දරන තනතුර	වෘත්තීය මට්ටම හා අධ්‍යාපන සුදුසුකම්
මහාචාර්ය එස්. ආර්. ඩී. රෝස	සභාපති	මහාචාර්ය, භෞතික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය. භෞතික විද්‍යාව (විශේෂ උපාධිය), කොළඹ විශ්වවිද්‍යාලය - 1979, භෞතික විද්‍යාව සහ න්‍යෂ්ටික විද්‍යා ආචාර්ය උපාධිය - ඇමරිකා එක්සත් ජනපදය, පිට්ස්බර්ග් විශ්වවිද්‍යාලය - 1987.
වෛද්‍ය ඩබ්ලිව්. මීගොඩ	සාමාජික	විකිරණවේදී, සෞඛ්‍ය අමාත්‍යාංශයේ න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව සහ විකිරණවේදය පිළිබඳ උපදේශක වෛද්‍ය උපාධිය, ශල්‍ය වෛද්‍ය උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය, විකිරණ විද්‍යාව උපාධිය - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ආචාර්ය ජෙයසිංහම් ජේසුගීතන්	සාමාජික	ආචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (භෞතික විද්‍යාව පිළිබඳ) - න්‍යෂ්ටික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය ආචාර්ය උපාධිය (භෞතික විද්‍යාව), 2014
ආචාර්ය. සුනිල් ගමගේ	සාමාජික	බාහිර මහාචාර්ය - ජාත්‍යන්තර සබඳතා පිලිබඳ ජපානයේ (Hokkaido Bankyo) විශ්වවිද්‍යාලය
එච්.ටී කමල් පත්මසිරි මහතා	සාමාජික	හිටපු ලේකම් - අභ්‍යන්තර, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ශාස්ත්‍රපති (රාජ්‍ය පරිපාලන) - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2005 ශාස්ත්‍රවේදී - පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 1984
අරෝෂ රොඩ්රිගෝ මහතා	සාමාජික	හිටපු වරලත් ගණකාධිකාරී - ප්‍රයිස් වෝටර් හවුස් කූපර් විද්‍යා උපාධිය (කළමනාකරණය) (ගෞරව), Warwick විශ්වවිද්‍යාලය, ඇමරිකාව
කේ.ඩී. සුනන්දලාල් මහතා	සාමාජික	උපදේශක, උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) ශාස්ත්‍රපති සාමාන්‍ය උපාධිය (බාහිර) - කැලණිය විශ්වවිද්‍යාලය
කේ.එල්.ආර්.සී විජේසිංහ මහතා	අමාත්‍යාංශ නිරීක්ෂක	අධ්‍යක්ෂ - සැලසුම්, විදුලිබල අමාත්‍යාංශය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

නම	තනතුර	සුදුසුකම්
ටී.එම්.ආර්.තෙන්නකෝන් මහතා	අධ්‍යක්ෂ ජනරාල්	බි.එස්.සී (භෞතික විද්‍යාව-විශේෂ) ගෞරව - කොළඹ වි.වි එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව) - කොළඹ වි.වි එම්.ෆිල්. (ද්‍රව්‍ය ඉංජිනේරු)- මොරටුව වි. වී.
අනෝමා රත්නායක මහත්මිය	අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය	බී.එස්.සී ගෞරව (විවෘත වි.වි.) එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව)-කොළඹ වි.වි.
චම්පා දිසානායක මහත්මිය	අධ්‍යක්ෂ ජෛව විද්‍යා අංශය	බී.එස්.සී. (කෘෂිකර්මය) - රුහුණ වි.වි. එම්. ෆිල් (න්‍යෂ්ටික විද්‍යාව)-කොළඹ වි.වි.
ආචාර්ය විරාජ් එදිරිසිංහ මහතා	අධ්‍යක්ෂ කර්මාන්ත යෙදුම් අංශය	බී.එස්.සී ගෞරව-පේරාදෙණිය වි.වි. එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව)- කොළඹ වි.වි. පී. එච්. ඩී.(සමස්ථානික ජල විද්‍යාව)- පේරාදෙණිය වී.වී.
ප්‍රසාද් මහකුමාර මහතා	අධ්‍යක්ෂ සාමාන්‍ය විද්‍යාත්මක අංශය	බී.එස්.සී ගෞරව (පේරාදෙණිය වි.වි.), එම්.එස්.සී.(න්‍යෂ්ටික විද්‍යාව)-කොළඹ වි.වි.
එච්.එම්.එන්.ආර්.බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ ජාත්‍යන්තර සහයෝගිතා අංශය	බී.එස්.සී ගෞරව-සබරගමුව වි.වි. එම්.පී.එම (ස්ලිඩා)
මානෙල් චන්ද්‍රසේකර මහත්මිය	අධ්‍යක්ෂ පරිපාලන	බී.එස්.සී (ගෞරව)-කොළඹ වි.වි එම්.පී.එම (ස්ලිඩා) එම්.පී.ඒ(පී.අයි.එම්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
ඩී. අසරප්පෙරුම මහතා	අධ්‍යක්ෂ මුදල්	එම්.බී. ඒ(ඕස්ට්‍රේලියා),ඒ.සී.එම්.එ(යුකේ) සී.ජී.එම්.ඒ.(යූ.එස්) ඩී.බී.එෆ්.ඒ.(අයි.සී.ඒ.ඒස්.ඒල්)

1.0 සභාපතිතුමාගේ සමාලෝචනය



2020 වසර සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට අප හට අවස්ථාව ලැබීම ඉමහත් සතුටකි.

2020 වසර සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි අංශ මට්ටමේ ක්‍රියාකාරකම් හා ප්‍රධාන මූල්‍යමය කරුණු පහත සඳහන් පරිදි විස්තර කරමි.

1.1 සාමාන්‍ය විද්‍යාත්මක අංශය

විකිරණ සේවකයන්, සාමාන්‍ය ජනතාව සහ පරිසරය අනවශ්‍ය ලෙස විකිරණ වලට නිරාවරණය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය විකිරණ ආරක්ෂණ සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ. රටේ න්‍යෂ්ටික ආරක්ෂණය සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වන නියාමන අවශ්‍යතා පූරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීම ද මෙම අංශය මඟින් සිදු කෙරේ.

කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ වුවද, විකිරණ ආරක්ෂණ සේවා අඛණ්ඩව සහ කල් යැවීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු අංශය විසින් සම්පාදනය කර තිබිණි. මෙම අංශය අනු අංශ 08 කින් ක්‍රියාත්මක වන අතර ආයතනික සහ ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය දායකත්වය උපරිම වශයෙන් ලබා දීමට කටයුතු කර ඇත.

මෙම අංශයට අයත් න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ විද්‍යාගාරය මඟින් අධ්‍යාපනික ඉදිරිපත් කිරීම් සහ පරීක්ෂණ සඳහා සුදුසු විකිරණ මිනුම් උපකරණ තුනක් සහිත කට්ටලයක් දේශීයව නිෂ්පාදනය කර ඇත. එම කට්ටලයක ගයිගර්-මුලර් අනාවරකයක්, අතේ ගෙන යා හැකි විකිරණ මාපකයක් සහ විද්‍යුත් වළා කුටීරයකින් සමන්විත වන අතර, එවැනි කට්ටල 21ක් නිෂ්පාදනය කර උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී. නව විකිරණ මිනුම් උපකරණ නිර්මාණය කිරීම මෙන්ම එම තාක්ෂණය තුළ යොදා ගන්නා උපකරණ සඳහා අවශ්‍ය නඩත්තු සහ අලුත්වැඩියා කිරීමේ සේවා දේශීයව, අඩු මිලට ලබා දීම ද මෙම විද්‍යාගාරය මඟින් සිදු කෙරේ. 2020 වසර තුළ දී එවැනි උපකරණ අලුත්වැඩියා සේවා 26ක් ලබා දී තිබේ. නව උපකරණ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 2.5ක ආදායමක් ඉපැයීමට අංශය සමත්ව තිබේ.

එසේම, එසේ සංවර්ධනය කෙරුණු උපකරණ කට්ටලය වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කල "සහසක් නිමැවුම් 2020" ජාතික තරඟාවලියේ දී විවෘත අංශයේ, භෞතික විද්‍යා කාණ්ඩය යටතේ රන් සම්මානය හිමි වී ඇත.
විකිරණ මිනුම් උපකරණ සඳහා දීපව්‍යාප්ත ක්‍රමාංකන සේවා ලබා දීමත්, විකිරණ සේවකයන් සඳහා දීපව්‍යාප්ත මාත්‍රාමිතික සේවා ලබා දීමත් මෙම අංශයෙන් සිදු වේ. 2020 වර්ෂය තුළ සිදු කරන ලද සේවා සංඛ්‍යාව 26 කි.

එම සේවා ද්විත්වයම ISO/IEC 17025 අන්තර්ජාතික සම්මතයට අනුකූලව ප්‍රතිනය කර ඇත. 2020 වසර තුල එම සේවා ද්විත්වයම ISO/IEC 17025: 2017 නවතම ප්‍රතිනය මට්ටම තෙක් යාවත්කාලීන කරන ලදි. 2020 වසර තුළ දී මිනුම් උපකරණ 81 ක් සඳහා ක්‍රමාංකන සේවා ලබා දී ඇත.

සේවක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විකිරණ සේවකයන් 1950ක පමණ පිරිසක්, වසර පුරාම මාත්‍රාමිතික සේවය මඟින් අධීක්ෂණය කර තිබේ. එම සේවාව පහසු මිලට, උසස්ම විශ්වසනීයත්වය සහිතව ලබා දීම සඳහා අවශ්‍ය පියවර මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරේ. පාරිසරික විකිරණශීලීතාවය පිළිබඳව අධීක්ෂණ සේවා සහ රේඩෝන් (ස්වභාවිකව උත්පාදනය වන විකිරණශීලී වායුවකි) මිනුම් කටයුතු ද පවත්වාගෙන යන අතර, විකිරණ යෙදීම් කෙරෙන වැඩබිම් අධීක්ෂණය සඳහා වන සේවා අඛණ්ඩව ලබා දීම ද වසර මුළුල්ලේ සිදු කෙරිණි.

ජනතාවගේ සුරක්ෂිතතාවය තහවුරු කරනු වස්, න්‍යෂ්ටික සුරක්ෂිතතාවය වෙනුවෙන් විශේෂඥ සේවා ලබා දීම ද අංශය මගින් සිදු කර තිබේ. විශේෂයෙන් ම, "ඒකාබද්ධ න්‍යෂ්ටික සුරක්ෂිතතා සහයෝගිතා සැලැස්ම" (Integrated Nuclear Security Support Plan/INSSP) යටතේ ශ්‍රී ලංකාව තුල න්‍යෂ්ටික අනාවරණ ව්‍යුහය වැඩිදියුණු කිරීම සහ බලගැන්වීම සඳහා ඉමහත් තාක්ෂණික දායකත්වයක් අංශය විසින් ලබා දී තිබේ. ප්‍රධාන තොටුපල පරිශ්‍ර තුළ (බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපල සහ කොළඹ වරාය) සුරක්ෂිතතාවය තහවුරු කිරීමටත්, ප්‍රභූ ආරක්ෂාව සහ පොදු උත්සව අවස්ථා වල න්‍යෂ්ටික සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහාත් අවශ්‍ය වන මානව සම්පත් සංවර්ධනය සහ තාක්ෂණික උපාංග සැපයීම අංශය මඟින් සිදු කර තිබේ. ශ්‍රී ලංකා රේගුව, ගුවන්තොටුපල ආරක්ෂණ අංශ, ශ්‍රී ලංකා පොලීසිය සහ ත්‍රිවිධ හමුදාවන් සඳහා ද මාර්ගෝපදේශනය සහ තාක්ෂණික දායකත්වය ලබා දී ඇත.

එසේම, න්‍යෂ්ටික ආපදා පූර්ව හඳුනාගැනීමේ අනාවරක පද්ධතිය අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාමත්, අභාවිත විකිරණ ප්‍රභව සඳහා වන මධ්‍යම ගබඩාව පවත්වාගෙන යාමත් මෙම අංශය මඟින් සිදු කෙරේ.

සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශය, දීපව්‍යාප්ත, ලාභය මත පදනම් නොවන එහෙත් අත්‍යවශ්‍ය සේවා සැපයීම සිදු කරන නමුත්, 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 16.02 ක ආදායමක් උපයා තිබේ. එසේම, රු. මිලියන 3.8ක පමණ වටිනාකමකින් යුතු සේවා නොමිලේ ලබා දීමට ද අංශය ක්‍රියා කර ඇත.

1.2 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය

නිර්විනාශක පරීක්ෂණ සහ ඒ සම්බන්ධ අනිකුත් තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ලෝහ සහ අලෝහ මඟින් කරන ලද නිෂ්පාදන හා ඉදිකිරීම් වල පලුදු අවම මට්ටමින් පවත්වාගෙන යාම සහ එමගින් රටෙහි එවැනි නිෂ්පාදන සහ ඉදිකිරීම් වල ප්‍රමිතිය ඉහල නැංවීම නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම නිර්විනාශක පරීක්ෂණ සේවාව ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 04 ක් ඔස්සේ සිදු කරන ලදී.

ඒවා නම් ;

i. NDT පුහුණු සේවාව: සහතික කරන පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ, දේශන, කාර්මික පුහුණු, internship training, විභාග සහ පුද්ගල සහතිකකරණය;
ii. පරීක්ෂා කිරීම: NDT පරීක්ෂණ සේවා
iii. පර්යේෂණ: කාර්මික ක්ෂේත්‍රයේ හමුවන ගැටළු විසඳීම සඳහා සහ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා සිදු කරන කෙටි කාලීන හා දිගු කාලීන පර්යේෂණ;

iv. සංවර්ධන: තාක්ෂණික සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි පුහුණු ඒකකය මඟින් IAEA TECDOC 628 සහ ISO 9712 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව කරන පුහුණු පාඨමාලා වාර්ෂිකව පවත්වනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රතිතකරණ ආයතනය මඟින් ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතිතකරණයට ලක් කරන ලද නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ඒකකය (Certification Body for NDT) මඟින් ඉහත පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා ISO 9712 ප්‍රමිතියට අනුව විභාග පැවැත්වීම හා සහතිකකරණය සිදු කරනු ලබයි.

2020 වසර සඳහා වැඩමුළු, පුහුණු පාඨමාලා, විභාග සහ සහතිකකරණය යන කටයුතු වලට සම්බන්ධ වූ සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව 97 කි.

මීට අමතරව කාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සහ කාර්මික සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර සහ ලෝහ නිෂ්පාදන වල පලුදු අවම කිරීම උදෙසා නිර්විනාශක පරීක්ෂණ සේවාව NCNDT මඟින් පවත්වා ගෙන යනු ලබයි.

2020 වසරේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශ වල කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා නිර්විනාශක පරීක්ෂණ සේවාවන් 211 ක් ලබා දෙන ලදී.

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් 2020 වසර සඳහා අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 15 ක් වූ අතර, රුපියල් මිලියන 14.664 ක් ඉහත සියලු ක්‍රියාකාරකම් මඟින් උපයා ගන්නා ලදී. (වැට් බද්ද සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කවුන්සිලයෙන් ලබාගත් කුලිය හැර).

මීට අමතරව, පර්යේෂණ කටයුතු යටතේ, විශ්වවිද්‍යාල වල සිසුන් කිහිප දෙනෙකු ඔවුන්ගේ අධ්‍යයන කටයුතු හා සම්බන්ධ කෙටිකාලීන පර්යේෂණ කටයුතුවලට සහභාගී වූහ.

වසර පුරා ISO 17024 සහ ISO 9712 ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ප්‍රමිතිකරණයට භාජනය කර ඇති CBNDT හි කටයුතු නොනවත්වා සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

එසේම ISO 17020:2012 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව NDT ක්‍රමවේද 04ක් (Magnetic Practical Testing, Ultrasonic Testing, Liquid Penetrant Testing & Concrete Testing) ප්‍රතිතකරණයට ලක් කර ඇති අතර එම ප්‍රතිකරණ තත්වය නොකඩවා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රයේ සේවාවන් තවදුරටත් ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනයේ සහයෝගයෙන් ක්‍රියාත්මක වන IAEA TC project No. SLR 1009, 2016 – 2019 නැමති ව්‍යාපෘතිය 2020 වසර තුලත් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

1.3 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ එකම රජය සතු බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ පහසුකම වන ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC) බියගම අපනයන සැකසුම් කලාපයේ 2014 සිට ක්‍රියාත්මක වේ.

කර්මාන්ත, ව්‍යවසායකයින්, පර්යේෂණ ආයතන යනාදිය සඳහා ගැමා ප්‍රවිකිරණ සේවා සැපයීම මගින් රටට උපරිම ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය අවධානය යොමු කරයි. ප්‍රධාන වශයෙන් ගැමා ප්‍රවිකිරණ සේවාව වෛද්‍ය නිෂ්පාදන විෂබීජහරණය කිරීම, ඇසුරුම් ද්‍රව්‍ය

විෂබීජහරණය කිරීම, ආහාර හා ඖෂධ පැළෑටි වල ක්ෂුද්‍රජීවී විෂබීජ නාශනය හා කෘමීන් පාලනය කිරීම, ෆයිටෝ සනීපාරක්ෂක ප්‍රතිකාර, විකෘති අභිජනනය, ද්‍රව්‍ය වෙනස් කිරීම සහ රෝග පාලනය සඳහා විෂබීජ නාශක කෘමීන් යොදා ගැනීම යන කටයුතු සඳහා භාවිතයට ගෙන ඇත.

ප්‍රවිකිරණ කටයුතු සඳහා SLGC සතුව වාණිජ වාහක සහ සහායක වාහක (නියැදි වාහක) ඇති අතර ඒවාට එකිනෙකට ස්වායත්තව ක්‍රියා කළ හැකිය. වාණිජ වාහකය ප්‍රධාන වශයෙන් කැපවී ඇත්තේ මුලින් නිෂ්පාදන වලංගුකරණ අධ්‍යයන සිදු කරන සහ අඛණ්ඩ සැපයුමක නිරත පාරිභෝගිකයින් සඳහා වේ.

ප්‍රවිකිරනකයේ සුවිශේෂී ලක්ෂණයක් වන සහායක වාහකය, අඛණ්ඩ හෝ කුඩා පරිමාවන් ඇති විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල පර්යේෂකයන්ගේ සහ විවිධ කර්මාන්තවල කර්මාන්තකරුවන්ගේ පර්යේෂණ හා සංවර්ධන අරමුණු සඳහා වන සාම්පල ප්‍රවිකිරණය කිරීමට පහසුකම් සපයයි. එමෙන්ම,අභ්‍යන්තර ක්‍රමාංකන ක්‍රියාකාරකම් සහ අන්තර් සංසන්දනාත්මක අධ්‍යයන සඳහා නියැදි වාහකය අධික ලෙස භාවිත කරනු ලැබේ.

වාණිජ පරිමාණ මෙහෙයුම් තුළින් රු. 44,431,450.64 ක මුදලක් උපයා ගැනීමට SLGC ට හැකිවිය. සහායක වාහක ප්‍රවිකිරණ සේවාව මගින් රු. 443,878.76 ක මුදලක් උපයාගෙන ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ මුළු ආදායම රු. 44,875,329.40 ක් වේ.

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මඟින් ශ්‍රී ලංකාවේ සියලුම රජයේ රෝහල් සඳහා අවශ්‍ය ශල්‍ය අත්වැසුම් විෂබීජහරණය කිරීමෙන් ප්‍රවිකිරණ සේවා සපයනු ලබන්නේ රටේ ආර්ථිකයට විශාල වාසියක් අත්කර දෙමිනි. ප්‍රවිකිරණ සේවාව පහසුවෙන් ලබා ගත හැකි බැවින් ව්‍යවසායකයින් කිහිප දෙනෙකු නිෂ්පාදන පහසුකම් අලුතින් ආරම්භ කළ අතර සමහරු ආනයනය කරන ලද නිමි භාණ්ඩ ප්‍රවිකිරණය කරමින් සිටින අතර තවත් සමහරු සිරින්ජස් සහ ගෝස් සඳහා නිෂ්පාදන පහසුකම් ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටිති.

SLGC ප්‍රධාන විද්‍යාගාර තුනකින් සමන්විතය. එනම්, ඩොසිමෙට්‍රි විද්‍යාගාරය, ආහාර තාක්ෂණ විද්‍යාගාරය සහ ක්ෂුද්‍රජීව විද්‍යාගාරය. ඩොසිමෙට්‍රි විද්‍යාගාරය තත්ත්ව සහතිකකරණ විද්‍යාගාරය ලෙස ක්‍රියා කරන අතර එය ප්‍රවිකිරණය වන නිෂ්පාදන සඳහා ලබා දෙන මාත්‍රාව සහතික කරයි.

ක්ෂුද්‍රජීව විද්‍යාගාරය සහ ආහාර තාක්ෂණ විද්‍යාගාරය මූලික වලංගුකරණ සේවා, ක්ෂුද්‍ර ජීව විද්‍යා පරීක්ෂණ සේවා සහ අනෙකුත් පරීක්ෂණ සේවා සපයන අතර, සියලුම විද්‍යාගාර පර්යේෂණ පහසුකම් සපයයි. කාර්ය මණ්ඩලයේ, ගැමා ප්‍රභවයේ සහ පරිසරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රභවයට අවශ්‍ය ආරක්ෂාව සපයන අතර වාණිජ ප්‍රවිකිරකයක් ලෙස SLGC හි සුරක්ෂිත බව සහ ආරක්ෂාව සහතික කිරීම සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූල වීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කවුන්සිලය (SLAERC) මඟින් නිරන්තරයෙන් කරනු ලබන පරීක්ෂණ මඟින් වරින් වර ආරක්ෂිත කටයුතු , වෛද්‍ය නිරීක්ෂණ වැඩසටහන්, පුද්ගලික මාත්‍රා අධීක්ෂණ වැඩසටහන් යනාදිය මඟින් මෙහි ආරක්ෂක පියවරයන්හි ඵලදායි බව සහතික කෙරේ. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයෙහි ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය නංවාලීම සඳහා දේශීය හෝ ජාත්‍යන්තරව මෙන්ම වෙනත් විකිරණ ආරක්ෂණ වැඩසටහන් වලට සහභාගී වේ.

සේවා සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා අදාළ තත්ත්ව කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම මඟින් එහි සේවාවේ ගුණාත්මකභාවය ඉතා ඉහල මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි. ISO 9001 සහ ISO 13485 (වෛද්‍ය උපකරණ - තත්ත්ව කළමනාකරණ පද්ධති - නියාමන අරමුණු සඳහා අවශ්‍යතා).

වරින් වර පාරිභෝගිකයන් සමඟ කරන සාකච්ඡා, පාසල්, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතනවල සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් යනාදිය හරහා ගැමා ප්‍රවිකිරණ තාක්ෂණය සහ අදාළ සේවාවන් පිළිබඳව ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය දැනුවත් කරයි. විවිධ කර්මාන්ත සඳහා ගැමා ප්‍රවිකිරණය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් සිදුකරන පර්යේෂණ මඟින් කරනු ලබයි.

1.4 ජෛව විද්‍යාත්මක අංශය

පාරිභෝගික ආරක්ෂාව උදෙසා ආනයනික කිරිපිටි විකිරණශීලීතාව හේතුවෙන් අපවිත්‍ර වී ඇත්දැයි පරීක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නියාමන අවශ්‍යතා සඳහා කාර්යක්ෂම හා ඵලදායී න්‍යෂ්ටික විශ්ලේෂණ සේවාවක් සැපයීම සඳහා **ජෛව** විද්‍යා අංශය (LSD) වගකීම දරයි.

ඊට අමතරව, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව පාරිභෝගික ඉල්ලීම් සහ අධ්‍යයන පර්යේෂණ කටයුතු සඳහා සේවාව සපයනු ලබන අතර, මෙම අංශය රටේ සමාජ-ආර්ථික සංවර්ධන අරමුණු ඉටු කරලීම සඳහා ක්‍රියාකාරීව දායක වේ.

2020 වර්ෂය තුළ, **ජෛව** විද්‍යා අංශයේ විද්‍යාගාර මඟින් ආහාර (කිරිපිටි ආදිය), කෘෂිකාර්මික නිෂ්පාදන (තේ, පොල්, කුළුබඩු, සත්ව ආහාර හා ඖෂධ), පාරිසරික සාම්පල (පාංශු, අවසාදිත, ජලය ආදිය) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය, බිම ඇතිරුම් ගල් (උළු, වැලි) වල විකිරණශීලීතා මිනුම් බහු මූලද්‍රව්‍ය සංයුතිය සඳහා විවිධ නියැදි අනුකෘති විශ්ලේෂණය කරන ලදී.

මුළු සාම්පල 4167 ක් විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීමෙන් ආසන්න වශයෙන් රු මිලියන 53.7 ක ආදායමක් උත්පාදනය කරන ලදී. 2006 වසරේ සිට ගැමා වර්ණාවලීක්ෂ විද්‍යාගාරය, ISO IEC 17025: 2005 නමැති විද්‍යාගාර පරීක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රතිතනයට අනුව තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) පවත්වා ගෙන යයි. 2020 පෙබරවාරි මාසයේදී ISO IEC 17025: 2017 හි නව ක්‍රමවේදයකට අනුව සියලුම ලේඛන සහ ක්‍රියාවලීන් ඇතුළුව තත්ත්ව කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

2020 දී නව විශ්ලේෂණ සේවා දෙකක් ආරම්භ කරන ලදී, එනම් දළ ඇල්ෆා බීටා මිනුම් ලෙස හැඳින්වෙන පානීය ජලය සහ අපජලය ඇතුළු විවිධ නියැදි න්‍යාසයන්හි විකිරණ මට්ටම් නිරීක්ෂණය කිරීම සඳහා, නව විශ්ලේෂණ ක්‍රමවේදයක් ලෙස ස්ථාපිත කිරීම සහ ප්‍රේරක Coupled Plasma Mass Spectrometry service සඳහා අංශුමාත්‍ර මූලද්‍රව්‍ය විශ්ලේෂණ (analysis of trace elements).

දළ ඇල්ෆා බීටා සේවාව යටතේ, ප්‍රවීණතා පරීක්ෂණ සාම්පල වලට අමතරව අප ජලයෙහි ඇති ඇල්ෆා සහ බීටා විමෝචන රේඩියෝනියුක්ලියයිඩ් වල (emitting radionuclide) විකිරණ මට්ටම පරීක්ෂා කිරීම සඳහා නියාමන අවශ්‍යතාවයක් ලෙස සේවා සාම්පල තුනක් පරීක්ෂා කරන ලදී.

අළුතින් පිහිටුවන ලද සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික මානය (Isotope Ratio Mass Spectrometry - IRMS) රසායනාගාරය දැන් සේවා සාම්පල භාර ගැනීමට සුදානම් කරනු ලැබ ඇත. මෙම ක්‍රමවේදය තවදුරටත් සංවර්ධනය සඳහා කාබන් සහ නයිට්‍රජන් ස්ථායී සමස්ථානික සඳහා ශාක සාම්පල 400 ක් පමණ විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක සහතික කළ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා සියලු නව විශ්ලේෂණ ක්‍රමවේදයන් සඳහා ජාතික ප්‍රතිතනය ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවාවක් සැපයීමට අමතරව, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ තාක්ෂණික සහයෝගයෙන් සෞඛ්‍ය හා පරිසර, ආහාර හා කෘෂිකාර්මික යන ක්ෂේත්‍රවල ජාතික වශයෙන් වැදගත් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සඳහා ජෛව විද්‍යා අංශය සම්බන්ධ වී ඇත.

1.5 කර්මාන්ත යෙදවුම් අංශය

කර්මාන්ත යෙදවුම් අංශය (IAD) යටතේ න්‍යෂ්ටික සමස්ථානික හා ඒ ආශ්‍රිත තාක්ෂණය රටේ පරිසරය, කර්මාන්ත, සෞඛ්‍ය සහ කෘෂිකර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි යොදවනු ලැබේ. කර්මාන්ත යෙදවුම් අංශය මඟින් පාර්ශවකරුවන්ගේ ආයතන සහ අදාළ පර්යේෂණ ආයතන සහ සංවිධාන සඳහා උපදේශන සහ විශ්ලේෂණ සේවා ද සපයයි. ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි ජාතික අවශ්‍යතා සපුරාලීම අරමුණු කොට කර්මාන්ත යෙදවුම් අංශයෙහි ප්‍රමුඛ පර්යේෂණ ක්‍රියාවලිය සිදුවේ. කර්මාන්ත යෙදවුම් අංශය යටතේ සමස්ථානික ජල විද්‍යා අංශය (IHS) සහ විකිරණ පිරිසැකසුම් අංශය (RPS) ක්‍රියාත්මක වේ.

රට තුළ පැවති කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් 2020 දී පර්යේෂණ ව්‍යාපෘති බොහොමයකට බාධා එල්ල වුවද සමස්ථානික ජල විද්‍යා අංශය යටතේ සමහර ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ හැකි විය.

කොළඹ සිට මීගමුව දක්වා මුහුදු ප්‍රදේශයේ නොගැඹුරු භූගත ජලධරය දූෂණය වීමේ අවදානම පරීක්ෂා කිරීම සඳහා, IAEA RCA -RAS 7035 ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරු ලෙස කටයුතු කරන ජල සම්පත් මණ්ඩලය සමඟ එක්ව සාම්පල් පරීක්ෂා කිරීමේ වැඩ සටහනක් නිම කරන ලදී.
ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියෙහි ජාතික ව්‍යාපෘතිය වන SRL 7006 යටතේ භූගත ජල ආරෝපණය, මූලාරම්භය, මිශ්‍ර වීම සහ ස්වාභාවික අපද්‍රව්‍ය එකතුවීම වැනිදේ හඳුනා ගැනීම සඳහා මල්වතු ඔය ද්‍රෝණියේ සහ පහළ මහවැලි ද්‍රෝණියේ භූගත ජල සාම්පල එකතු කිරීමේ වැඩසටහන් දෙකක් සම්පූර්ණ කරන ලදී.ඉහත සඳහන් කටයුතු හා සම්බන්ධ සමස්ථානික හා රසායන විද්‍යාව සඳහා වූ ජල සාම්පල විශ්ලේෂණය 2020 දී අවසන් කරන ලදී. මේ අතර, ජලයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීම පිළිබඳ QA/QC සම්බන්ධ බොහෝ වාර්තාමය කටයුතු නිම කරන ලදී.
එසේම, 2020 දී සමස්ථානික ජල විද්‍යා අංශය (HIS) මඟින් යාපනය අර්ධද්වීපයේ සහ වලවේ ගංඟා ද්‍රෝණියේ භූගත ජල තක්සේරුව පිළිබඳ පර්යේෂණ සොයා ගැනීම් සමීක්ෂිත සමාලෝචන සහරා වල ප්‍රකාශයට පත් කරන ලදී.

විකිරණ පිරිසැකසුම් අංශය(RPS) යටතේ සමහර රසායනාගාර විශ්ලේෂණ සිදු කරන ලදී. සංස්කෘතික උරුමයන් සඳහා ආලේපන යෙදීම සඳහා සුදුසු රසායනික සංයුතියක් සෙවීම සඳහා සාම්පල 72 ක විශ්ලේෂණ කටයුතු 2020 දී අවසන් කරන ලදී. එයට සම්බන්ධව කැලණිය විශ්වවිද්‍යාලයේ ආධාරයෙන් රසායනාගාර අත්හදා බැලීම් ක්ෂේත්‍ර පරීක්ෂණ දක්වා පුළුල් කරන ලදී.

තවද, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ ඉල්ලීම මත මැණික් සාම්පල 48 ක් විකිරණය කර තක්සේරු කරන ලදී. එසේම, කඩදාසි සංරක්ෂණය සඳහා ගැමා විකිරණ මඟින් සිදු කරන ලද බද්ධ සම-බහුඅවයවීකරණය යෙදීම පිළිබඳ සොයා ගැනීම් 2020 දී RPS යටතේ ප්‍රකාශයට පත් කරන ලදී. එසේම, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සඳහා අගය එකතු කිරීමේ ක්‍රමයක් ලෙස විකිරණ ආධාරයෙන් උසස් ද්‍රව්‍ය සංස්ලේෂණය පිළිබඳ නව පර්යේෂණ යෝජනාවක් RPS මඟින් සැලසුම් කර ඊළඟ IAEA TC චක්‍රයට ඉදිරිපත් කරන ලදී.

ඉහත අංශ දෙකෙහි ක්‍රියාකාරකම් වලින් ඔබ්බට ගොස් කෘෂිකාර්මික භෝග සඳහා ප්‍රශස්ත ජල අවශ්‍යතාවය සෙවීම සඳහා හඳුනා ගත් නව පර්යේෂණ යෝජනාවක් , කලාපීය ව්‍යාපෘති යෝජනාවක් දක්වා දියුණු කර 2022-2024 RCA ව්‍යාපෘති චක්‍රය සඳහා සලකා බැලීම සඳහා IAEA වෙත ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාව අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය මඟින් සමාලෝචනය කරන ලද අතර ඒ අනුව එය 2020 දී නැවත සකස් කර අවසන් කරන ලදී. එසේම පැලැටි ජලය ලබා ගැනීම සඳහා රසායනාගාර යටිතල පහසුකම් සංවර්ධනය වෙමින් පවතී. කර්මාන්ත යෙදවුම් අංශය යටතේ යෝජිත සමස්ථානික පරිසර විද්‍යා වැඩසටහන යටතේ මේ සියලු කටයුතු සිදු කෙරිණි.

පාසල් අධ්‍යාපන වැඩසටහන ද කර්මාන්ත යෙදවුම් අංශය යටතේ සම්බන්ධීකරණය කළත්, පාසල් ළමුන් සඳහා සැලසුම් කර තිබූ වැඩමුළු, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන ආදිය වසංගත තත්ත්වය යටතේ 2020 දී පැවැත්වීමට නොහැකි විය. "ස්මාර්ට් බුක්" නමින් වෙබ් පදනම් කරගත් අධ්‍යාපනික මොඩියුලයක් 2020 දී බොහෝ දුරට අවසන් වූ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව 2021 දී එය දියත් කිරීමට සැලසුම් කළේය.

1.6 ජාත්‍යන්තර සහයෝගිතා අංශය

එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ කටයුතු කරන සංවිධානයක් වන ලොව "සාමය හා සංවර්ධනය සඳහා වූ පරමාණු" ලෙස පුළුල් ලෙස හඳුන්වන අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) ජාතික සම්බන්ධතා කාර්යාලය ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සහයෝගිතා අංශය කටයුතු කරයි. ජාත්‍යන්තර සහයෝගිතා අංශය එහි තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ තාක්ෂණික ආධාර ලබා ගැනීම සඳහා අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.
ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් විවිධ ව්‍යාපෘති යටතේ අධිශිෂ්‍යත්ව, විද්‍යාත්මක සංචාර, විශේෂඥ මෙහෙවර සහ රසායනික මූලද්‍රව්‍ය උපකරණ ලබාදීම මඟින් සිය තාක්ෂණික සහාය සාමාජික රටවලට ලබා දෙයි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ හා තාක්ෂණික වෘත්තීයවේදීන්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා මාර්ගගත ක්‍රමවේදය යටතේ විශේෂඥ සහාය කිහිප වතාවක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. අදාළ ජාතික ආයතන වල විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ පර්යේෂකයින් සඳහා විදේශ පුහුණුවීම්, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ ආදියට සහභාගී වීමට අවස්ථා අටක් ලැබුණි. ඊට අමතරව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය කලාපීය හා අන්තර් කලාපීය තාක්ෂණ සහයෝගිතා ව්‍යාපෘති යටතේ මාර්ගගත ක්‍රම ඔස්සේ තාක්ෂණය ඔස්සේ සංවිධානය කර තිබූ වැඩසටහන් කිහිපයකට සහභාගී වීමට අපේ විද්‍යාඥයින්ට සහ තාක්ෂණවේදීන්ට අවස්ථා ලැබුණි.
2020-2021 කාල සීමාව සඳහා ජාතික තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති හතරක් (04) ක් සඳහා යුරෝ 963,809 ක තාක්ෂණික ආධාර (ආසන්න වශයෙන් මිලියන 193 ක්) ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇත.
න්‍යෂ්ටික තාක්ෂණය යෙදවිය යුතු යැයි හඳුනාගත් රටේ ප්‍රමුඛතා අනුව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා 08 ක් ඊළඟ තාක්ෂණික සහයෝගිතා චක්‍රය 2022/2023 සඳහා සලකා බැලීම සඳහා අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය වෙත ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 08න් තෝරාගත් ව්‍යාපෘති යටතේ තාක්ෂණික ආධාර ලබා ගැනීමට නියමිතය. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2022 දී ආරම්භ කෙරේ.

මීට අමතරව කර්මාන්ත යෙදවුම් අංශයේ ද සහාය ඇතිව මෙම අංශය මඟින් අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය සමඟ සම්බන්ධීකරණය කර පී.සී.ආර් (PCR) යන්ත්‍ර තුනක් සහ ඒවාට සම්බන්ධ අනෙකුත් අයිතම පරිත්‍යාග වශයෙන් ලබා ගත් අතර, මෙම යන්ත්‍ර කොළඹ විශ්වවිද්‍යාලය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මහනුවර සහ මහනුවර මහ රෝහල යන ආයතන වෙත බෙදා දෙන ලදී.රටේ කාර්මික විවිධාංගීකරණය හේතුවෙන් දිනෙන් දින ඉහළ යන රටේ අනාගත බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා විකල්පයක් ලෙස න්‍යෂ්ටික බලය උපයෝගී කර ගැනීමේ හැකියාව සොයා

බැලීම සඳහා න්‍යෂ්ටික බලය අධ්‍යයනය හා සැලසුම් කිරීමේ වැඩ සටහන් සම්බන්ධීකරණය කරන ලදී. එමෙන්ම පිරිසිදු හා හරිත බලශක්තියක් වන න්‍යෂ්ටික බලය ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිවලට අනුව, කාබන් විමෝචනය අවම කිරීමේ ක්‍රියාමාර්ගවලටද අනුකූල වේ.

මෙම අංශය , දකුණු කොරියාවේ කලාපීය සහයෝගිතා ගිවිසුම් කලාපීය කාර්යාලය (RCARO), ජපානයේ අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන (MEXT), න්‍යායික භෞතික විද්‍යාව සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICTP) වැනි අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ ද කටයුතු සම්බන්ධීකරණය කරයි. රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය දියුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබා ගැනීම අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය දකුණු සාමාජික රටවල් (MS) සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම, ශ්‍රී ලංකාවට තාක්ෂණික සහය ලබා ගැනීමේ හැකියාව සහ න්‍යෂ්ටික දැනුම කළමනාකරණ (NKM) සම්බන්ධීකරණය මෙම අංශය මඟින් සිදු කෙරෙන අනෙකුත් වැදගත් කාර්යන් වේ.

1.7 මූල්‍ය කාර්යසාධනය

2020 දී සපයන ලද බාහිර පාරිභෝගික සේවාවන්ගෙන් ආදායම

(වටිනාකම රු. මිලියන)

	ආදායම් ප්‍රභවය	ඉලක්ක ගත ආදායම	ලැබූ ආදායම
1	න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා	52.00	53.73
2	ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ආදායම	49.00	47.30
3	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ආදායම	13.20	12.92
4	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා	1.80	1.74
5	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ කුලී ආදායම (SLAERC වෙතින්)	7.00	7.00
6	සාමාන්‍ය විද්‍යාත්මක සේවා	15.75	16.00
7	සමස්ථානික ජල විද්‍යා අංශයේ ආදායම	0.10	0.05
8	වෙනත් ආදායම්	11.75	3.39
	එකතුව	**150.6**	**142.13**

තරඟකාරී වෙළඳපොල වාතාවරණය යටතේ වුවද, ඉහත සඳහන් වැඩ සටහන් සාර්ථකව කර ගෙන යාමට සහයෝගය දැක්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි සියළුම කාර්ය මණ්ඩලයට මම ස්තූතිය පළ කරමි.



මහාචාර්ය එස්. ආර්. ඩී රෝස
සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

2.0 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය



දෛනික ජීවිතයේ මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්න ගණනාවක් න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය මඟින් විසඳිය හැකිය. ආරක්ෂාකාරීව හා මනා සංයමයෙන් යුතුව න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය යොදා ගන්නා විට සෑම ආකාරයටම යහපත් ප්‍රතිඵල ලබාදේ. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින පහසුකම් යොදාගෙන න්‍යෂ්ටික විද්‍යාවේ හා තාක්ෂණයේ අපරිමිත දායාදයන් ප්‍රයෝජනයට ගැනීම අත්‍යාවශ්‍යය.

1969 දී ආයතනය ආරම්භ කළ කාලයේ සිට එහි යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා වැඩි කැපවීමක් කළ අතර මේ වන විට නොයෙකුත් ක්ෂේත්‍ර තුල ආයතනික ක්‍රියාකාරකම් කැපී පෙනෙන ආකාරයට දියුණු වී ඇත.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට මේ සම්බන්ධව පුළුල් වගකීමක් ඇති අතර එහි මූලෝපායික මෙහෙවර වන්නේ න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදීම් මහජනතාවට ලබාදී, එම තාක්ෂණය යොදා ගැනීමට දිරි දීම මෙන්ම එමඟින් ලබාදෙන වාසි ශ්‍රී ලංකාවේ ආර්ථික සාමාජීය සංවර්ධනය උදෙසා යොදාගන්නා අතරතුර විකිරණ සේවකයන් මෙන්ම මහජනතාව හා පරිසරය ද අයනීකරණ විකිරණ වල අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමයි.

මම මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව සාඩම්බරයෙන් ඉදිරිපත් කරමි. මෙම වාර්තාව ආයතනයේ ප්‍රගතිය සාරාංශ කරමින් 2020 වසරේ මූල්‍ය තත්වය විදහා දක්වයි. 2021 ඉදිරි වර්ෂය අප ආයතනයට අභියෝගාත්මක වසරක් වනු ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කාර්යක්ෂම සංවිධානයක් බවට මෙම ආයතනය සංවර්ධනය කිරීමට අපි නොකඩවා ඇපකැප වී සිටිමු.

සමස්තයක් වශයෙන් ගත් කල, කොවිඩ් -19 වසංගත තත්ත්වයට අපි දරුණු ලෙස මුහුණ දී සිටියත්, 2020 වසර සඳහා එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අප ආයතනය සමත් වූ බව මම විශ්වාස කරන අතර, අභියෝගාත්මක වුවත් තෘප්තිකර සාර්ථක ඉදිරි වසරක් උදාවේ යැයි බලාපොරොත්තු වෙමි.

ටී.එම්.ආර්.තෙන්නකෝන්
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

3.0 විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය 2020

2020 වර්ෂයේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

a) කමල් පත්මසිරි මහතා - විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති
b) අරෝෂ රොඩ්රිගෝ මහතා - කමිටු සාමාජික (01 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී වැඩබලන සභාපතිවරයා ලෙස කටයුතු කරන ලදී.)
c) ආචාර්ය ඩබ්ලිව්. මීගොඩ-කමිටු සාමාජික (08-09-2020 දක්වා)
d) ජයසිංහම් ජෙයසුගිතන් මහතා - කමිටු සාමාජික

ඉහත සඳහන් සාමාජිකයන් සිව්දෙනා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වන අතර, මූල්‍ය, පරිපාලනමය, නීතිමය හා විද්‍යාත්මක ක්ෂේත්‍ර සම්බන්ධ පුළුල් පලපුරුද්දක් සහිත අය වේ.

විගණකාධිපති නියෝජනය කරමින් නියෝජිතයෙකු ලෙස විගණන අධිකාරි (ආර්.කරුණාරත්න මහතා) හා විදුලිබල අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක (බී.ඒ.ඩී.ඒ.අබේවර්ධන මහත්මිය) ද නිරීක්ෂකවරුන් ලෙස රැස්වීම්වලට සහභාගි විය.

අභ්‍යන්තර විගණක, විගණන හා කළමනාකරණ කමිටුවේ කැදවුම්කරු ලෙස ක්‍රියාකරන අතර, අවශ්‍ය වාර්තා ආදිය ඉදිරිපත්කර කමිටුවට සහය විය. අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් විගණන හා කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස ක්‍රියාකරන ලදී. අධ්‍යක්ෂක ජනරාල්, ටී.එම්.ආර්.තෙන්නකෝන් මහතා හා අධ්‍යක්ෂ (මූල්‍ය) අසරප්පෙරුම මහතා යන දෙදෙනා ද කමිටු රැස්වීම්වලට සහභාගි වූහ. අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද අවශ්‍ය අවස්ථාවල දී විගණන හා කළමනාකරණ කමිටු කැදවීමෙන් රැස්වීම්වලට සහභාගි වූහ.

2020 වර්ෂයේ 03 වන කාර්තුව දක්වා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පැවැත්විය. නමුත් සමහර අභ්‍යන්තර ගැටලු හේතුවෙන් 04 වන කාර්තුවේ රැස්වීම පැවැත්වීමට නොහැකි විය. අවසානයේ, එම ගැටලුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර එය විසඳන ලදී.

3.1 කමිටුවේ කාර්යයන්:

2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55 හි අර්ථ දක්වා ඇති අරමුණු, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 'යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශය' සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුව විගණන හා කළමනාකරණ කමිටුව එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගන්නා ලදී.

මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතිවල පැවැත්ම සහ කාල වකවානු වල ප්‍රමාණවත් බව, මෙහෙයුම් වල නොඑකඟවීම්, මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයේ හෙලිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව යනාදිය කමිටුව විසින් සමාලෝචනය කල යුතු වේ.

තවද මූල්‍ය වාර්තාකරණයේදී අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, එම ප්‍රතිපත්තීන් මූල්‍ය වාර්තා සකස් කිරීමේදී සංගතව යොදාගෙන තිබේදැයි තහවුරු කල යුතු වේ.

3.2 විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2020 වර්ෂය තුල සිදු කරන ලද කාර්යන්:

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශ සහ ජාතික විගණන පනතේ අවශ්‍යතා සපුරාලීමට කමිටුව උපරිම උත්සහය දරා ඇත.
- 2020 අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා කමිටුව අනුමැතිය ලබා දෙන ලදී.
- විගණන හා කළමනාකරණ කමිටුව සඳහා යොමු කොන්දේසි(TOR) සකස් කිරීම සහ ඒ සඳහා 2020 සැප්තැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.
- තවද විගණන හා කළමනාකරණ කමිටුව විසින් විගණකාධිපති වාර්තාව -2019 හි පෙන්වා දී ඇති ප්‍රධාන ගැටළු පිළිබඳව සමාලෝචනය කර ඇමුණුමේ සඳහන් පරිදි විසඳුම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.
- තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දායකත්වය ලබාදීමේ ක්‍රමවේදයක් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා අංශ ප්‍රධානීන්ට ආරාධනා කිරීම.
- වර්ෂය තුළ නොවිසඳුන විගණන විමසීම් සහ කළමනාකරණ ගැටලු වලට පිළිතුරු ලබාදීමට පියවර ගන්නා ලදී.
- විගණන විමසීම් වලට කිසිදු ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීම අධීක්ෂණය කිරීම සඳහා පද්ධතියක් සැකසීමට කටයුතු කරන ලදී.

එච්.ටී කමල් පද්මසිරි මහතා
විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

රැස්වීම් පැවැත් වූ දිනයන් සහ න්‍යාය පත්‍ර අයිතම අංකය	**රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු/ ප්‍රධාන දෝෂ**	**දෝෂ නිරාකරණය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව ලබාදුන් නිර්දේශ**	**SLAEB මගින් දෝෂ නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග**
රැස්වීම් දිනය- 2020-02-26 න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-01-03	**<u>2020 අභ්‍යන්තර විගණන සැලැස්ම</u>** අභ්‍යන්තර විගණන වාර්තාවලින් ඉදිරිපත් කල නිර්දේශ මණ්ඩලයේ කලමනාකරණය විසින් ක්‍රියාත්මක කිරීම දුර්වල මට්ටමක පවතින බව කමිටුව විසින් සාකච්ඡා කරන ලදි. **2019** දී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය මෙන්ම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ද කමිටුව නිරීක්ෂණය කරන ලදී. විවිධ අංශ වලින් ඉල්ලුම් කරන ලද තොරතුරු හා ලිපි ලේඛන නියමිත වේලාවට ලබානොදීමේ දුෂ්කරතා සිදු වී ඇති බවත් අභ්‍යන්තර විගණන අංශය කමිටුවට දැනුම් දෙන ලදී.	2020 අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා කමිටුව අනුමැතිය ලබා දෙන ලදි. අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් පිළිබඳව ආයතනයේ අදාළ අංශ වැඩි අවධානයක් යොමු කළ යුතු බව කමිටුව පෙන්වා දෙන ලදි.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර එම සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දී ඇත.
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-01-04	**<u>මූල්‍ය ප්‍රකාශන</u>** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ යම් ප්‍රමාදයක් සිදුවී ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර මූල්‍ය ප්‍රකාශන අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව සඳහන් කරමින් මූල්‍ය අංශය විසින් සභාපතිවරයා වෙත ඉල්ලීමක් කර ඇත. අභ්‍යන්තර විගණන අංශයට මූල්‍ය අංශයෙන් ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් සමහර ප්‍රධාන අයිතමයන්ගේ සංඛ්‍යා වල පරස්පරතාවයක් ඇති බව, අභ්‍යන්තර විගණක විසින් පෙන්වා දෙන ලදි.	2019 වර්ෂයේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන කමිටුව නිරීක්ෂණය කල අතර එය තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා නැවත යොමු කරන ලදි.	2020-06-12 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2019 වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-01-05	**අභ්‍යන්තර විගණන වාර්තා-2020** 1. **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2019 වසරේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිරීක්ෂණ** **2020** මාර්තු **13** වන දින පැවැත්වීමට නියමිතව **තිබූ** මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ **2019 -** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ ඉදිරිපත් කරන බවට අභ්‍යන්තර විගණක එකඟ විය.	---	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2019 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ වල සාරාංශය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර අභ්‍යන්තර විගණන නිරීක්ෂණ වල සවිස්තර වාර්තාව සමාලෝචනය කිරීමට විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දෙන ලදී.

න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-01-06	**<u>2018 වසරේ විගණකාධිපති වාර්තාව සහ කළමනාකරණය විසින් ඉදිරිපත්කල පිලිතුරු සහ රජයේ විගණන විමසීම්</u>** 1. **විගණන විමසුම** විකිරණශීලිභාවයෙන් **තොර ආනයනික කිරිපිටි පරිභෝජනයට ඇති හැකියාව ඇගයීම) සහ කළමනාකරණ පිලිතුරු** ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය නිසි තක්සේරුවකින් තොරව, ආනයනික කිරිපිටි වල විකිරණශීලිතාවය මැනීම සඳහා අයකරන පරීක්ෂණ ගාස්තු වැඩි කළ බව රජයේ විගණන අධිකාරිවරයා පැහැදිලි කරන ලදී. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ අරමුණු වලට අනුව, පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින් සමාජයට ලබා දිය හැකි සේවාවන් ගැන වඩාත් සැලකිලිමත් විය යුතු බවද එම නිසා මෙම මිල වැඩි කිරීම පිළිගත නොහැකි බවද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. තවද, වෙළඳපොලෙන් සොයා ගත හැකි කිරිපිටි අහඹු ලෙස පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය ඔහු පැහැදිලි කළේය. අහඹු ලෙස පරීක්ෂා කිරීම සඳහා බහාලුම් තෝරා ගැනීමට නිසි යාන්ත්‍රණයක් නොමැති බව ඔහු සඳහන් කළේය.මෙම ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට පමණක් නොව නියාමන සභාවට ද මෙහි ප්‍රධාන වගකීම පැවරේ. ඉහත විමසුම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය දැනටමත් පිළිතුර ඉදිරිපත් කර ඇති බව අභ්‍යන්තර විගණක සඳහන් කරන ලදී. මෙම මිල වැඩි කිරීම හේතුවෙන් කිරිපිටි සපයන්නන්ට එතරම් විශාල බලපෑමක් සිදු නොවන බව අධ්‍යක්ෂ (මූල්‍ය)සඳහන් කරන ලදි.	2020 සැප්තැම්බර් මාසයේදී පැවති කමිටු රැස්වීමේදී ආහාර සාම්පල පරීක්ෂණය සඳහා මිල ඉහළ දැමීම සාධාරණ බව කමිටු සභාපති ප්‍රකාශ කරන ලදි.	---
	<u>2. 2018 වසරේ විගණකාධිපති වාර්තාව සහ කළමනාකරණ පිලිතුරු</u> 2018 විගණකාධිපති වාර්තාව සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ලබාදුන් පිලිතුරු වාර්තාව දැනටමත් සකස් කර ඇති බව අභ්‍යන්තර විගණක සඳහන් කරන ලදි.	---	---
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-01-07	**<u>වෙනත් කරුණු</u>** 1. 2019 වර්ෂයේ 04 වන කාර්තුවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා	එම තොරතුරු කමිටුව නිරීක්ෂණය කරන ලදි.	---

	2. 2019 වර්ෂයේ 04 වන කාර්තුවේ ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව (අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත)		
	3.රාජ්‍ය ආයතනවල (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය) අධීක්ෂණ කාර්යභාරය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත පැවරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද ලිපිය 2020 වසරේ සිට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ස්වයං තිරසාර වීමට සැලසුම් කර ඇති බවත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය එම අරමුණ ලගා කරගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අවධාරණය කළේය. ඒ අනුව, 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මිලියන 44 ක අතිරික්තයක් ලබා ගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී. රාජ්‍ය ව්‍යාපාර ආයතනවල ඉලක්ක කරා ළඟාවීම සඳහා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය නව මෙහෙයුම් වැඩසටහන් වලින් සමන්විත වේ. ඒවා අතර, කොකෝ ෆීට් ව්‍යාපෘතිය වැදගත් වේ.	එම තොරතුරු කමිටුව නිරීක්ෂණය කරන ලදි.	----
	<u>ආර් කරුණාරත්න මහතාගේ නිරීක්ෂණයන් (විගණකාධිපතිවරයාගේ නියෝජිත)</u> විගණන අධිකාරිවරයාගේ නිරීක්ෂණ රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 4 සහ 5 හි සඳහන් කර ඇත.	---	---
	<u>අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ</u> අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 6 හි සඳහන් කර ඇත.	---	---
		පවතින විගණන හා කළමනාකරණ කමිටුවේ භාණ්ඩාගාර නියෝජිතයෙකු අන්තර්ගත නොවන අතර එබැවින් ප්‍රතිකර්ම කළ නොහැකි හානියක් මෙන්ම උසස් මහ පෙන්වීම් නොමැතිකම හේතුවෙන් ආයතනයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන බව අරෝෂ රොඩ්රිගෝ මහතා (කමිටුවේ වැඩ බලන සභාපති) විසින් පෙන්වා දෙන ලදී. ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ රජයේ චක්‍රලේඛ, උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ඇතැම් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරන සියලුම	---

		අධ්‍යක්ෂවරුන් රජයේ චක්‍රලේඛ උපදෙස් රාමුව අවබෝධ කරගෙන සිටිය යුතු බව අරෝෂ රුද්‍රිගු මහතා අවධාරණය කළේය.	
		ඊළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ප්‍රසම්පාදන හා සම්බන්ධ ප්‍රධාන ගැටළු තුනක් පිළිබඳ සාරාංශ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස රොඩ්රිගෝ මහතා අභ්‍යන්තර විගණක වෙත උපදෙස් ලබා දෙන ලදි. තවද, ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ට ඇගේ නිරීක්ෂණ ලිඛිතව ඉදිරිපත් කළ හැකි බව ඔහු පෙන්වා දෙන ලදි.	
රැස්වීම් දිනය- 2020-09-08 න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-02-11	<u>සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම -2020</u> අභ්‍යන්තර විගණන අංශයේ දුෂ්කරතා පිළිබඳව කමිටුව අවධානය යොමු කරන ලදී. අභ්‍යන්තර විගණන අංශයේ සීමිත කාර්ය මණ්ඩලය පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. අභ්‍යන්තර විගණක විසින් විගණන අංශයේ සීමිත කාර්ය මණ්ඩලයක් සිටින බව ප්‍රකාශ කරන ලදී. මීට පෙර (2020 මැයි දක්වා) අභ්‍යන්තර විගණන අංශයට කළමනාකරණ සහකාරවරුන් 03 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර මේ වන විට කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු සිටින බැවින් නියමිත වේලාවට කාර්යයන් ඉටු කිරීම දුෂ්කර බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී. තවද කොවිඩ්-19 වසංගතය ද අංශයේ කටයුතු වලට බාධාවක් වූ බව ඇය විසින් ප්‍රකාශ කරන ලදී. තවද, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ඉඩම් සහ ගොඩනැගිලි තොරතුරු පිළිබඳ වාර්තා, NCNDT ඉදිකිරීම් සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ප්‍රගතිය පිළිබඳ වාර්තා (කාර්ය සාධන විගණනය) වැනි රේඛීය අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටි සැලසුම් නොකළ වැඩ/විගණන කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවීමට ඔවුන්ට සිදු වූ බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදී. කෙසේ වෙතත්, අභ්‍යන්තර විගණන අංශයේ කළමනාකරණ සහකාර සඳහා සේවක මණ්ඩලයේ තනතුරක් නොමැති බවත් අභ්‍යන්තර විගණන අංශයේ පවතින සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට සඳහා දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇති	සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම -2020 සඳහා කමිටුව අනුමැතිය ලබා දෙන ලදි.	සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එම සංශෝධිත සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී.

	බවත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පැහැදිලි කරන ලදී. කෙසේ වෙතත්, ඉදිරියේදී අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යාසලාභී පුහුණු නිලධාරියකු අනුයුක්ත කිරීමට හැකියාව ඇති බව ප්‍රකාශ කරන ලදී.		
නාය පත්‍ර අයිතම අංකය - 2020-02-12	**<u>අභ්‍යන්තර විගණන වාර්තා</u>** <u>1. 2020 වර්ෂයේ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය (2020 අගෝස්තු 31 දක්වා)</u> <u>• IA/(R)/2020/01- ගෙවීම් වවුචර් පෙර විගණනය</u> සාරාංශ වාර්තාවේ සඳහන් පරිදි අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු ලබා නොදීමට හේතුව පිළිබඳව කමිටු සභාපති විමසන ලදි.	විගණන හා කළමනාකරණ කමිටුව වෙත පැමිණෙන සියලුම නිලධාරීන්ට රැස්වීම් වාර්තාවල පිටපත් යැවිය යුතු යුතු බව විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා සහ විගණකාධිපතිවරයාගේ නියෝජිතයා අවධාරණය කරන ලදී. අනෙක් අතට, එම සියලුම නිලධාරීන් ඔවුන්ට අදාළ රැස්වීම් වාර්තා වල අන්තර්ගතය සඳහා වගකිව යුතුය. වැරදි ලෙස ක්‍රියා කරන නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයට පිළිතුරු දීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටු තීරණ මූල්‍ය, විගණන සහ පරිපාලන අභ්‍යන්තර වක්‍රලේඛ වලට අනුකූලව සිදු වේ. ඒ නිසා සෑම නිලධාරියෙක්ම නිවැරදිව ක්‍රියා කළ යුතුයි.	---
	• <u>IA/(R)/2020/02- (2019 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සහ අධ්‍යක්ෂ මූල්‍ය විසින් ලබා දුන් පිලිතුරු)</u> **සටහන 03- ජංගම වත්කම් - (බැංකු මුදල්)** **සටහන-05- වෙළඳ සහ ලැබිය යුතු අනෙකුත් දෑ (**5.1 **වෙළඳ ණය ගැතියන්)** **සටහන 06 - තොග (රසායනික තොගය) - රු. මිලියන** 1.28 **සටහන-**8.3-**වෙනත් ජංගම වත්කම් (ආදායම් බදු අත්තිකාරම් රු.** 17,158)	--- විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා ණය ගැතියන් සඳහා කාල විශ්ලේෂණ සකස් කිරීම පිළිබඳව විමසන ලදී. සෑම අංශයකම දත්ත අදාළ අධ්‍යක්ෂවරුන් හරහා එක්රැස් කිරීම මුල්‍ය අධ්‍යක්ෂවරයාගේ වගකීම බවද අවසාන වශයෙන්, අවසාන භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය අධ්‍යක්ෂවරයාගේ වගකීම බවද විගණන හා කළමනාකරණ සභාපතිතුමා අවධාරණය කරන ලදී. අදාළ බැංකුව හරහා මෙම ගැටළුව විසඳා ගන්නා ලෙස විගණන හා කළමනාකරණ කමිටු	---

	සටහන-08.11- **මිලදී ගැනීමේ අත්තිකාරම් (රු.** 529,168/-)	සභාපතිවරයා මූල්‍ය අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙන ලදී. ---	
	සටහන-09- අදියර II සහ සැලසුම් (රු. මිලියන 1.99)	විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා විසින් **2020** අගෝස්තු **14** වැනි දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය යොමු කරන ලදී. ඒ අනුව, **ECL (**ඉංජිනේරු උපදේශක සමාගම) හරහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩල ගොඩනැගිල්ලේ **2** වන අදියරේ සැලැස්ම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියෝග කර ඇත.	---
	සටහන-09.4- විකිරණශීලි නිරාවරණ කාමරය (Radiation Exposure Room) ඉදිකිරීම - (NCNDT රු. මිලියන 37)	ගොඩනැගිල්ල භාර දෙන තුරු ගෙවීම් නතර කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා මූල්‍ය අධ්‍යක්ෂවරයා වෙත උපදෙස් ලබා දෙන ලදි.	---
	සටහන-10- දේපල පිරියත සහ උපකරණ (SLAEB ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය) SLAEB හි මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොමැති වත්කම් ගණනාවක් නිරීක්ෂණය විය. **ප්‍රධාන ගොඩනැගිල්ල** **විද්‍යාත්මක උපකරණ පරිත්‍යාග**	විශේෂ විමර්ශන වාර්තා ලබාගැනීමේ අවශ්‍යතාවක් නොමැති බව විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා දැනුම් දෙන ලදී. (වැදගත් කරුණක් වන්නේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අවශ්‍ය පියවර ගැනීමයි.)	--- ---
	සටහන-12.1-SLLRDC (NCNDT ඉදිකිරීම් සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 30)	---	---
	සටහන-12.1.12 - CRP ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම් - රුපියල් මිලියන 20.35	චක්‍රලේඛ අංක **PS/SP/SB/06/2019** සලකා බලා මීළඟ විගණන හා කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී.	---
	සටහන-13- විශ්‍රාමික ප්‍රතිලාභ වෙන් කිරීම.	---	---

	සටහන-15 සහ 16- ප්‍රාග්ධන සහ සංචිත	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අදහස් ලබා ගන්නා ලෙසට විගණන හා කළමනාකරණ කමිටුව විසින් උපදෙස් දෙන ලදී.	---
	2.ප්‍රසම්පාදන ගැටළු සම්බන්ධ අභ්‍යන්තර විගණන වාර්තා (විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ඉල්ලුම් කල) **i.** CCTV **පද්ධතිය** ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර විගණන වාර්තාව**:** මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් බව අභ්‍යන්තර විගණකපෙන්වා දුන්නේය. කෙසේ වෙතත්, මෙම ස්ථාපනය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් නොමැත.	එම වාර්තා පිලිබඳව රැස්වීමේ දී සාකච්ඡා කර නොමැත**.** විකිරණශීලි නිරාවරණ කාමරය ඉදිකිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වෛද්‍ය රක්ෂණය සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	---
නාය පත්‍ර අයිතම අංකය - 2020-02-13	<u>2019 විගණකාධිපති වාර්තාව සහ කළමනාකරණ විසින් ඉදිරිපත් කල පිලිතුරු</u> 1.<u>රජයේ විගණන විමසුම (විකිරණශීලිතාවයෙන් තොර ආනයනික කිරිපිටි පරිභෝජනයට ඇති හැකියාව ඇගයීම) සහ කළමනාකරණ විසින් ඉදිරිපත් කල පිලිතුරු</u> 2. <u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ඔවුන්ගේ 2019 විගණකාධිපති වාර්තාව සඳහා පිලිතුරු මාස 3ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු බව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ප්‍රකාශ කරන ලදී.</u> 2019 විගණකාධිපති අවසන් වාර්තාව නිකුත් කිරීමට විගණකාධිපතිවරයා සහනික කර ඇති බව වැඩිදුරටත් විගණන අධිකාරීවරයා ප්‍රකාශ කරන ලදී. එබැවින්, ඉහත කෙටුම්පත් වාර්තා සඳහා කළමනාකාරීත්ව පිලිතුරු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට වැඩි යමක් නොමැති බැවින් 2019 වර්ෂය සඳහා වන කළමනාකරණ ඉදිරිපත් කල පිළිතුර වාර්තාව 13 (7) (අ) සාකච්ඡා කිරීම සඳහා වහාම විශේෂ රැස්වීමක් කැඳවීමට යෝජනා කල යුතු බව ඔහු ප්‍රකාශ කරන ලදී.	මෙම මාතෘකාව රැස්වීමේදී සාකච්ඡා නොකරන ලදි. ---	---
	<u>විගණන අධිකාරිවරයාගේ (විගණකාධිපතිවරයාගේ නියෝජිත) නිරීක්ෂණ</u> විගණන අධිකාරිවරයාගේ (විගණකාධිපතිවරයාගේ නියෝජිත) නිරීක්ෂණ රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 6 සහ 7 හි සඳහන් කර ඇත.	සියලුම විද්‍යාත්මක අධ්‍යක්ෂවරුන්ට මීළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගිවීමට ආරාධනා කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු සභාපති අභ්‍යන්තර විගණක වෙත උපදෙස් ලබා දුන් අතර එමඟින් යම් යම් අක්‍රමිකතා අවම කිරීමට හේතුවන බවද එපමණක් නොව රජයේ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් පරිපාලන දැනුමක් ඔවුන්ට ලබාගැනීමට හැකි බවද ඔහු ප්‍රකාශ කරන ලදී.	---

න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-02-14	**වෙනත් කරුණු (කමිටුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම)** 1. **ජාතික විගණන පනතේ 40 වැනි වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ලිපිය.** 2. **බදු නිදහස් වාහන බලපත්‍රය ලබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අනෝමා රත්නායක මහත්මියගේ (අධ්‍යක්ෂක – SLGC) ලිපිය.** 3. **විගණන සහ කළමනාකරණ කමිටු විෂය පථය ඇතුලත් යොමු කොන්දේසි කෙටුම්පත** 4. **කළමනාකරණය විගණකාධිපති වාර්තාවට ඉදිරිපත් කල පිළිතුරු වාර්තාව සම්බන්ධයෙන් සැප්තැම්බර් 24 වැනි දින විශේෂ රැස්වීමක් පැවැත්වීමට විගණන හා කළමනාකරණ කමිටුවතීරණය කරන ලදි.**	ඉදිරිපත් කල තොරතුරු කමිටුව නිරීක්ෂණය කරන ලදි. මෙවැනි කාරණයකට මැදිහත් වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා හට පූර්ණ අයිතිය ඇති බව විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා පැහැදිලි කරනු ලදී. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණ සමඟ මේ සම්බන්ධයෙන් ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුවඋපදෙස් දෙන ලදි. --- අරෝෂ රොද්‍රිගු මහතා (විගණන හා කළමනාකරණ කමිටු සාමාජික) මෙම ලේඛනය නිරීක්ෂණය කිරීමට භාර ගන්නා ලදී.	---
Meeting Date- 2020-09-24 න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-03-16	2019 විගණකාධිපති වාර්තාව සහ කළමනාකරණ ඉදිරිපත් කල පිලිතුරු විගණන අධිකාරී කරුණාරත්න මහතාගේ පැහැදිලි කිරීම රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 2 සහ 3 හි දක්වා ඇත. අභ්‍යන්තර විගණක සභාපතිවරයා වෙත වාර්තා කළ යුතු බව විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා පැහැදිලිව පෙන්වා දෙන ලදී. නමුත් ආයතනයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කලයුතු බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදී. 2018 වාර්ෂික වාර්තාව	සියලුම බාහිර පාර්ශවයන් වෙත යැවෙන ලිපි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ යැවිය යුතු බව විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා විසින් පෙන්වා දෙන ලදී	---

	විගණන අධිකාරීවරයාගේ පැහැදිලි කිරීම රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 3 හි දක්වා ඇත.		
න්‍යාය පත්‍ර අයිතම අංකය 2020-03-17	**<u>විශේෂ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ අරමුණ</u>** විශේෂ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ අරමුණ විගණකාධිපතිවරයාගේ නියෝජිතයා විසින් පැහැදිලි කරන ලදී. 2019 කෙටුම්පත් විගණකාධිපති වාර්තාව පිලිබඳව විගණකාධිපතිවරයා වෙත යොමු කරන ලද 2020-07-16 දිනැති ලිපියේ සඳහන් කර ඇති කරුණු ගැන සඳහන් කරමින්, මෙම විශේෂ විගණන හා කළමනාකරණ කමිටුරැස්වීම පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේහි ගැටළු නිරාකරණය කරගැනීම සඳහාය.	---	---
	1.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 1.2.1 (ඇ), (ඈ) සහ කළමනාකරණය ඉදිරිපත් කල පිලිතුරු වල අයිතම අංක 14 (2) (ඇ)), (ඈ)(ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් බැහැර වීම) **i. වත්කම් ප්‍රථ්‍යාගණනය කිරීම.** විද්‍යාත්මක උපකරණ සම්බන්ධයෙන් යම් යම් නොවිසඳුණු ගිණුම් දක්නට ලැබේ. මෙයට පිළියමක් ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කළමනාකාරීත්වය දන්වා ඇත්තේ මෙම ගැටලුව සමාලෝචනය කර සමථයකට පත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බවයි. නමුත් මෙම කමිටුවේ ප්‍රගතියක් නොමැති බව අභ්‍යන්තර විගණන අංශය පෙන්වා දෙන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් ලබා දී ඇති පිළිතුර ප්‍රමාණවත් සහ පිළිගත හැකි බව විගණන අධිකාරිවරයා ප්‍රකාශ කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සැලසුමක් නොමැති බවත් අභ්‍යන්තර විගණන සැලැස්මේ අයිතමයන් ගැන සඳහන් කරන බවත් අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි. **ii. පාරිතෝෂික දීමනා සඳහා අරමුදල් වෙන් කිරීම** 2019 විගණකාධිපති වාර්තාව අනුව, මෙම 14 (2) (සී) අයිතමය වාර්තාවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී.	---	---

	තක්සේරු කිරීම් කටයුතු සඳහා සීමිත පුද්ගලයන් සිටින බවත් කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මූල්‍ය බලාපොරොත්තු වන පැහැදිලි කරන ලදී.		
	2.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 1.2.2 (අ), (i), (ii), (iii) (iv) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 1(4) (3) (අ), (ආ,1,2,3)(ගිණුම්කරණ අඩුපාඩු) **i. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය** පැරණි ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ස්ථාපිත කර ඇත. ඉදිකිරීම් ඇස්තමේන්තුවට අනුව, එය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයවෙත වාසිදායකය. එබැවින්, මෙම ගිණුම් 2019/04/19 දින ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගිණුම්වලින් ඉවත් කරන ලදී. එමගින් ගිණුම්වල බලපෑමක් සිදු නොවේ.	---	---
	කෙසේ වෙතත්, එමගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ තීරණවලට බලපෑමක් විය හැක. නමුත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ හිමිකාරිත්වය සහ වත්කම් කෙරෙහි කිසිදු බලපෑමක් නැත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කළමනාකාරිත්වය 2020 වර්ෂයේදී අවශ්‍ය පියවර ගැනීමට නියමිත බව පෙන්වා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කළමනාකාරිත්ව විසින් ලබාදුන් පිළිතුර **1(4) (3) (අ), (ආ,1,2,3)** ප්‍රමාණවත් සහ පිළිගත හැකි බව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ප්‍රකාශ කරන ලදී.	---	---
	3.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.2 (අ) (ආයතන සංග්‍රහය XII) • **කෙටි නිවාඩු** කරුණාරත්න මහතාගේ පැහැදිළි කිරීම සහ මෙම කරුණ පිළිබඳ අභ්‍යන්තර විගණකගේපැහැදිලි කිරීම රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 5 හි සඳහන් කර ඇත.	ප්‍රමාද කාලය ආවරණය කරමින් කෙටි නිවාඩු ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව අවධාරණය කරමින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කෙටි නිවාඩු සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු සභාපතිවරයා අධ්‍යක්ෂ පරිපාලනට උපදෙස් දෙන ලදී. කෙටි නිවාඩුවක් පැය 1.5 කට පමණක් සීමා වන අතර මසකට කෙටි නිවාඩු දෙකක් ලබා ගත හැක.	---

	4. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.2 (ආ), (මුදල් රෙගුලාසි 128 (1) (ඇ)) සහ කළමනාකරණය ඉදිරිපත් කල පිලිතුරු වල අයිතම අංක 1. 6 (ආ) • **2005 සිට ක්‍රියාත්මක වන පරිදි පෙර පැවතිබඳවා ගැනීමේ පටිපාටිය / SOR මත පදනම් වූ උසස්වීම් සහ ඔවුන්ගේ වැටුප්** කරුණාරත්න මහතාගේ දීර්ඝ පැහැදිලි කිරීම රැස්වීම් වාර්තා සටහන් වල පිටු අංක 5 සහ 6 හි (අංක 04 අයිතමය යටතේ) සඳහන් කර ඇත.	2010/05/25 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයට අනුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වැටුප් පියවරයන් සහ එම නිලධාරීන් නිවැරදි වැටුප් පියවරකට තැබීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා අධ්‍යක්ෂ පරිපාලනට නියෝග කරන ලදි. එබැවින්, මෙම වාර්තාව අංශයේ අනෙකුත් සාමාන්‍ය කටයුතු සිදු කරන අතර තුර සති දෙකක් ඇතුළත සකස් කරන ලෙස අධ්‍යක්ෂ පරිපාලන වෙත කමිටුවේ සභාපතිවරයා විසින් උපදෙස් දෙන ලදි.	---
	• **වෘත්තීය දීමනා ගෙවීම් පිළිබඳ ගැටළුව** වෘත්තීය දීමනාවට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව, තීරණයක් ගැනීම සඳහා දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බවත්, එවැනි කරුණක් පිළිබඳව මනා දැනුමක් ඇති කමල් පත්මසිරි මහතාට (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික) සුපරීක්ෂාකාරීව පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ කාරණය මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට තීරණයක් ගැනීමට යොමු කර ඇති බවත්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැහැදිලි කළේය. • **වාහන බලපත්‍ර පිළිබඳ ගැටළුව** විගණන විමසුමෙන් පීඩාවට පත් නිලධාරීන්ට වාහන බලපත්‍රයක් ලබා ගැනීමේ වරප්‍රසාදය, තවත් වසර 5 කින් වෙනස් කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩල කළමනාකාරිත්වය තීරණය කර ඇති අතර එම කරුණ පිළිගන්නා ලදී. මෙහිදී පැන නැගුන ගැටළු 02ක් පිලිබඳව විගණන අධිකාරී කරුණාරත්න මහතාගේ පැහැදිලි කිරීම වාර්තාවේ පිටු අංක 6 සහ 7 පිටුවල සඳහන් කර ඇත.	---	---
	5. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.3 (අ) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 3. 4 (ආ) • **ආනයනික කිරිපිටි පරීක්ෂා කිරීමේ ගාස්තු වැඩි කිරීම**	වසර 5 කට පසු ආනයනික කිරිපිටි සඳහා වන පරීක්ෂණ ගාස්තු ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ඉහළ දැමූ බව විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා පැහැදිලි කළේය. ආයතනය සම්පූර්ණයෙන්ම තිරසාරවන	---

	විගණන අධිකාරීවරයාගේ පැහැදිලි කිරීම වාර්තාවේ පිටු අංක 7 හි සඳහන් කර ඇත.	තුරු, මෙම ගාස්තු අඩු කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට හැකියාවක් නොමැති බව සභාපතිවරයා ප්‍රකාශ කරන ලදී.	
	6.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.4 (අ) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 3. 5 • රජයේ නිවාඩු (වෙළඳ නොවන) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සාප්පු සහ කාර්යාල පනත සහ ආයතන සංග්‍රහය යන ක්‍රමවේද දෙකම භාවිතා කරනු ලබයි. කෙසේ වෙතත්, ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතන සංග්‍රහය මත රඳා පැවතිය නොහැක. ඊට සමගාමීව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩල කාර්ය මණ්ඩලය වාර්ෂික ප්‍රසාද දීමනා මෙන්ම ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීමද ලබා ගනී. එනිසා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් කාර්යය පටිපාටි සංග්‍රහයක් සකස් කර අවශ්‍ය අනුමැතිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව විසින් එම කාර්ය පටිපාටි සංග්‍රහය සමාලෝචනය කරන ලද අතර ඔවුන් පොදුවේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා මාර්ගෝපදේශයක් සකස් කරමින් පවතින බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට දන්වා ඇත.	මෙසේ කටයුතු කිරීම සුදුසු නොවන බවත්, මේ සම්බන්ධයෙන් මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ පරිපාලන වෙත විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා උපදෙස් දෙන ලදී.	---
	7.**2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.5 (ආ) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 1. 4 (4)** • SC/FR/662/2010 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 2008/09/03 දිනැති ලිපිය සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන 2008/10/13 දිනැති ලිපිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් JM වැටුප් පරිමාණයේ සිටි සියලුම නිලධාරීන් MM වැටුප් පරිමාණයට පත් කිරීමට SLAEB තීරණය කර ඇති බවයි. එවැනි තීරණයක් "අභිමත බලය" ලෙස අර්ථ දැක්විය හැකි අතර එම තීරණය ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට එවැනි බලයක් නොමැති බව කරුණාරත්න මහතා ප්‍රකාශ කරන ලදී. අනෙක් අතට, එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව නොමඟ යවන සුළු බව (BP: 2016-07- 99) සහ අධ්‍යක්ෂ මණ්ඩලයට එවැනි තීරණයක් ගත නොහැකි	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2010/05/25 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශයට අනුව නිලධාරීන් නිවැරදි වැටුප් පියවර මත තබා වාර්තාවක් සකස් කරන ලෙස තමන් දැනටමත් අධ්‍යක්ෂ පරිපාලනට උපදෙස් දී ඇති බව විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා සඳහන් කරන ලදී. එම වාර්තාව සකස් කිරීමෙන් පසු එය මේ සඳහා යොදාගත හැකි බවත් එම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබුණු පසු අධ්‍යක්ෂ මණ්ඩලයට මේ සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.	---

	අතර එය සමස්ත පරිපාලන ක්‍රියා පටිපාටියම උල්ලංඝනය කිරීමට හේතු වන බව වැඩිදුරටත් ඔහු සඳහන් කරන ලදී.		
	8.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.5 (ඉ) (iii) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 4.3 (ආ) • ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයෙන් සේවා ලබාගනු ලබන්නේ එක් ගනුදෙනු කරුවකු (ලලාන්) පමණක් බවත් ඔවුන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ආපසු ගැණුම් ඇණවුමක් ලබා ගැනීමට අපොහොසත් වුවහොත්, ඔවුන්ගේ සේවා සැපයීම සම්බන්ධයෙන් ගැමා ආයතනයට පැහැදිලි අදහසක් නොමැති බව කරුණාරත්න මහතා පැහැදිලි කරන ලදී. ලලාන් ආයතනය තවත් වසර 10 කට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ආපසු ගැණුම් ඇනවුමක් ලබාගෙන ඇති බවත් එබැවින් මෙම කාලයේදී එමගින් ආරක්ෂාවක් සැපයෙන බව අධ්‍යක්ෂ (මුදල්) පැහැදිලි කරන ලදී.	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සිදුකරන ආකාරය පිළිබඳ ගැටළුවක් පවතින බව විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා පෙන්වා දෙන ලදී. මෙම කාරණයේදී, තවත් වසර 10 කට පසු ඇප සහතිකය ලලාන් සමාගම විසින් ලබාගෙන ඇති බව සඳහන් කිරීම අත්‍යවශ්‍ය වන අතර මේ පිලිබඳව පිළිතුරෙහි අන්තර්ගත කර නොමැති බැවින් එය විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ දුර්වලතාව පෙන්නුම් කරන බවත් කමිටු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.	---
	9. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 2.5 (ඊ) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 3.3 • කැලණි-පාලම් ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරා ගැනීම රේඛීය අමාත්‍යාංශයේ සහයෝගයෙන් මෙම ගැටළුව විසඳීමට උත්සාහ කරන බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය දැනුම් දී ඇත. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ලබා දුන් පිළිතුර ජාතික විගණන කාර්යාලය විසින් පිළිගෙන ඇත.	---	---
	10.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංකය 3.6 (ඇ) සහ කළමනාකරණ පිලිතුරු වල අයිතම අංක 3.8 (පුනරාවර්තන වියදම්) • ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්තුමාට පැහැදිලි අවබෝධයක් තිබිය යුතු අතර මෙම සැලැස්ම මාස තුනකින් ඇගයිය යුතුය. එම නිසා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් දෙන ලද පිළිතුර පිළිගත නොහැකිය.	---	---
	11. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 3.9 • තිරසාර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘති රාශියක් ඇති බව කරුණාරත්න මහතා පැහැදිලි කරන ලදී. එමනිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ ඇගයීමට නිසි සැලැස්මක් තිබිය යුතුය.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සහ දැනට පවතින සියළුම ව්‍යාපෘති සලකා බලා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින් තිරසාර ඉලක්ක සපුරා ගැනීමේ ආකාරය පිළිබඳ,ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල	---

		රැස්වීමටඅධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති අධ්‍යක්ෂ ජනරාල්තුමාවෙත යෝජනා කරන ලදි.	
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2020-03-18	**<u>වෙනත් කරුණු</u>** 1. ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කාර්යයන් යථාර්ථවාදී විය යුතුය. එම ක්‍රියාව සමඟ යම් යම් සීමා කිරීම් තිබේ නම් එය පැහැදිලිව සඳහන් කළ යුතුය. එමගින් විගණන විමසීම් අවම කිරීමට විශාල පිටුවහලක් ලැබේ. මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට ඊළඟ විගණන හා කළමනාකරණ කමිටුව වෙත අදාළ සියළුම ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් දෙන ලදි. 2. ආදායම් බදු අත්තිකාරම රු. **17,158** 3.අවසාන වශයෙන්, මෙම විශේෂ රැස්වීම තුළින් සියලු විගණන ගැටළු නිරාකරණය කර ගත හැකි බව විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා අවධාරණය කරන ලදී.	විගණකාධිපති හමුවීමක් අවශ්‍ය නොවන බව සඳහන් කරමින් සභාපතිවරයා වෙනුවෙන් ලිපියක් සකස් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතවිගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති උපදෙස් දුන්නේය. තවද, එම ලිපිය සඳහා අවශ්‍ය අනුමැතිය සහ සභාපතිවරයාගේ අත්සන් ලබා ගන්නා ලෙස විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති නියෝග කරන ලදි.	---

4.0 නාෂ්ටික විද්‍යා හා තාක්ෂණ සේවා සැපයීම

නාෂ්ටික විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රතිලාභ සැබවින්ම දැක ගත හැක්කේ සේවදායකින්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සහ ගැටළු වලට විසඳුම් ලබා දීම තුලින්ය. රාජ්‍ය ආයතනයක් ලෙස නාෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධව සිය සුවිශේෂී හැකියාවන් තුලින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය කර්මාන්ත, කෘෂිකාර්මික, සෞඛ්‍ය, පරිසර, අධ්‍යාපනය යන ක්ෂේත්‍ර සඳහා අනුපමේය සේවාවක් ලබා දෙයි.

4.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මගින් සපයන ගැමා ප්‍රවිකිරණ සේවාවන්



රූපය 1: ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය - ගැමා ප්‍රවිකිරණය

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මගින් වෛද්‍ය ක්ෂේත්‍රය, ආහාර ක්ෂේත්‍රය සහ අදාළ අනෙකුත් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන ගැමා ප්‍රවිකිරණ සේවා සපයනු ලබයි.

2020 ජනවාරි 01 වන විට කොබෝල්ට් - 60 ප්‍රභවයෙහි ආරම්භක සක්‍රියතාවය 193.6 kCi ක් වූ අතර 2020 දෙසැම්බර් 31 වන විට එහි සක්‍රියතාවය 169.7 kCi. ක් විය. ගැමා ප්‍රවිකිරණ සේවාව ප්‍රධාන වශයෙන් භාවිතා කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සියලුම රජයේ රෝහල් සඳහා විෂබීජහරණය කරන ලද ශල්‍ය අත්වැසුම් අවශ්‍යතාවය සපුරාලන, එම අත්වැසුම් නිෂ්පාදකයෙකු වන ලලාන් රබර්ස් (පුද්) සමාගමට සේවා සැපයීම සඳහාය. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයන් මඟින් 2020 දී ප්‍රවිකිරණය කරන ලද මුළු ශල්‍ය අත්වැසුම් පරිමාව කියුබික් මීටර් 3493.28 විය.

තවද, ග්‍රිප්ටෙක්, පෙට් බෝතල්, ගෝස් ස්වැබ්ස් , ශල්‍ය ඇප්‍රෝන් නිෂ්පාදනය කරන අනෙකුත් වෛද්‍ය නිෂ්පාදන ආයතනයන්ටද ප්‍රවිකිරණ සේවා සැපයීමට ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සමත් විය. එබැවින් 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මඟින් ප්‍රවිකිරණය කරන ලද වෛද්‍ය උපකරණවල මුළු පරිමාව කියුබික් මීටර් 3539.48 විය.
කුඩා පරිමාණ ගනුදෙනුකරුවන් විසින් ගැමා ප්‍රවිකිරණය සඳහා සහායක වාහකය (නියැදි වාහකය) භාවිත කර ඇත. සනීපාරක්ෂක තුවා, මුත්‍රා එකතු කිරීමේ බෑග් සහ බෝතල්, ශල්‍ය ඇප්‍රෝන්, උපස්ථර කුඩු, පොලිතින් බෑග්, වැනි වෛද්‍ය , ආහාර, ශාක ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය යන වර්ගීකරණයන් යටතේ වන විවිධ ද්‍රව්‍ය ප්‍රවිකිරණය කර ඇත්තේ සහායක වාහකය භාවිතා කරයි.

4.2 ජෛව විද්‍යා අංශය විසින් සපයනු ලබන න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා

වාණිජ පරිමාණ මෙහෙයුම් තුළින් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයට රු. මිලියන 46.86 මුදලක් උපයාගත හැකිවිය. සහායක වාහකය භාවිතයෙන් (පර්යේෂණ වාහක) ප්‍රවිකිරණය මගින් රු. මිලියන 0.44 මුදලක් උපයන ලදී. 2020 වර්ෂයේ මුළු ආදායම රු. මිලියන 47.30 කි.

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මගින් ප්‍රවිකිරණයට භාජනය කරනු ලබන සෑම නිෂ්පාදනයක් සඳහාම දෛනික මාත්‍රාව සහතික කිරීම ඩොසිමෙට්‍රි විද්‍යාගාරය මඟින් සිදු කරනු ලබයි. මීට අමතරව පර්යේෂණ කටයුතු සඳහා අඩු මාත්‍රාවන් මගින් ආහාර ද්‍රව්‍ය ප්‍රවිකිරණය කර දීම ඩොසිමෙට්‍රි විද්‍යාගාරය සිදු කරනු ලබයි.

සේවකයන්, පරිසරය හා මහජනතාව අනවශ්‍ය විකිරණවලින් ආරක්ෂා කිරීමට හොඳින් ස්ථාපිත ආරක්ෂිත ක්‍රමවේද මධ්‍යස්ථානයේ විකිරණ ආරක්ෂණය සඳහා යොදා ගනු ලබයි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කවුන්සිලය මඟින් විකිරණ පහසුකමේ විකිරණ අධීක්ෂණය හා විකිරණ මිනුම් කටයුතු සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ තත්ත්ව කළමනාකරණ පද්ධති පවත්වාගෙන යාමට ISO - 13485: 2016 තත්ත්වයට අනුකූල බාහිර විගණනය සීමාසහිත ඇසෙන්ට් ලංකා (පුද්ගලික) සමාගම තත්ත්ව සහතික කිරීමේ පද්ධතිය මඟින් සිදු කරන ලද අතර, ISO 9001 : 2015 ට අනුකූල සෝදිසි කිරීමේ විගණනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විගණකවරුන් විසින් සිදුකරන ලදි. වරින් වර සිදු කෙරෙන පරීක්ෂණ මඟින් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය අඛණ්ඩව පවත්වා ගෙනයන ලද අතර එමගින් ගුණාත්මක සේවාවක් පාරිභෝගිකයන්ට ලබා දීමට හැකි වේ.

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් පාරිභෝගිකයින් සමඟ ව්‍යාපාරික සාකච්ඡා ආරම්භ කිරීමට නොහැකි වූ අතර 2020 වසර තුළදී ගෘහස්ථ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවා අවසන් කිරීමට නොහැකි විය. නමුත්, සෞඛ්‍ය සේවකයින්ට සෘජුවම සම්බන්ධ වූ සෞඛ්‍ය සේවා විකිරණ ලබා ගැනීමට අවශ්‍ය උපදේශකයින් කිහිප දෙනෙකුගෙන් විමසීම් කිහිපයක් සිදු කෙරිණි. නමුත්, කොවිඩ් 19 වසංගතය තුළ අතිරික්ත විකිරණශීලී ප්‍රභව ශක්තියක් නොමැති වීම හේතුවෙන් ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට නොහැකි විය.

මේ අතර, 2020 දී Co-60 විකිරණශීලී ප්‍රභවය 250 kCi කින් වැඩි කිරීමට අදාල පරිපාලන කටයුතු සහ මූලික සූදානම් කිරීමේ කටයුතු සිදු කරන ලදී.



රූපය 2: ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය - ගැමා ප්‍රවිකිරණය

ජෛව විද්‍යා අංශයේ (LSD) ස්ථාපනය කර ඇති අති නවීන න්‍යෂ්ටික විශ්ලේෂණ සහ අදාළ තාක්ෂණික පරීක්ෂණ සේවා, ප්‍රතිඵල වල නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පර්යේෂණ කටයුතු සඳහා සහ නියාමන කටයුතු සඳහා භාවිත කරයි.

මෙම න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා, නිෂ්පාදන දේශීය වෙළඳපොලට යොමු කිරීමට පෙර හෝ අපනයනය කිරීමට පෙර එම නිෂ්පාදනවල විකිරණශීලී මූලද්‍රව්‍ය අඩංගු නොවන බව සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. අනෙකුත් තාක්ෂණයන් හා සසඳන විට න්‍යෂ්ටික හා සමස්ථානික විශ්ලේෂණ තාක්ෂණය මඟින් පුළුල් පරාසයක සංයෝග හා මූලද්‍රව්‍ය පිලිබඳව වඩාත් වේගවත් හා නිවැරදි ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව ඇත. එපමණක් නොව එම විශ්ලේෂණ තාක්ෂණය යෙදීමේදී එහි ඇති ස්වාභාවික තත්වය වෙනස් නොවී \සාම්පල ආපසු ඒ ආකාරයෙන්ම ලබා ගත හැකි අතර හානි වීමේ අවදානමක් නොමැත.

මෙම විශ්ලේෂණාත්මක සේවාවන් ජෛව විද්‍යා අංශයේ හොඳින් ස්ථාපිත විශ්ලේෂණාත්මක විද්‍යාගාර මඟින් සපයනු ලැබේ. එම විද්‍යාගරයන් වන්නේ ගැමා වර්ණාවලීක්ෂ විද්‍යාගාරය, XRF (එක්ස් කිරණ ප්‍රතිදීප්ත) විද්‍යාගාරය, ඇල්ෆා වර්ණාවලීක්ෂය සහ දළ ඇල්ෆා බීටා විද්‍යාගාරය, ICP-MS විද්‍යාගාරය සහ IRMS විද්‍යාගාරයයි. මෙම විද්‍යාගාර වල ස්ථාපිත අති නවීන විශ්ලේෂණ උපකරණ අතර ගැමා වර්ණාවලීක්ෂ, (High Purity ජර්මනියම් අනාවරක [HPGe], සෝඩියම් අයඩයිඩ් අනාවරක), XRF (එක්ස් කිරණ ප්‍රතිදීප්ත වර්ණාවලීක්ෂකය, සම්පූර්ණ අභ්‍යන්තර පරාවර්තනය සහිත XRF සහ අතේ ගෙන යා හැකි XRF උපකරණය), ඇල්ෆා බීටා කවුන්ටරය, අනාවරක 08 ක් සහිත ඇල්ෆා වර්ණාවලීක්ෂය, ප්‍රේරක සම්බන්ධිත ප්ලාස්මා ස්කන්ධ වර්ණාවලීක්ෂකය (ICPMS) සහ සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂකය (IRMS) උපකරණය ඇතුළත් වේ.


ජෛව විද්‍යා අංශය මඟින් ලබා දෙනු ලබන විශ්ලේෂණාත්මක සේවාවන්, පරීක්ෂණ අරමුණ මත පදනම්ව පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකිය.

i. ස්වාභාවික විකිරණශීලීතා මට්ටම නිර්ණය කිරීම

ii. කිසියම් විකිරණශීලී දූෂණයක් තිබේදැයි පරීක්ෂා කිරීම.

iii. සාම්පල වල මූලද්‍රව්‍ය හඳුනා ගැනීම, සොයාගත් මූලද්‍රව්‍යයන්ගේ සාන්ද්‍රනයේ සංයුතිය හෝ ප්‍රමාණය තීරණය කිරීම.

2020 වර්ෂය තුළදී, ආනයන හා අපනයන අංශය, දේශීය කර්මාන්ත සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන සඳහා ජෛව විද්‍යා අංශය මඟින් විශ්ලේෂණාත්මක සේවාවන් ලබා දී ඇති අතර සාම්පල 4292 ක් පරීක්ෂා කර වාර්තා නිකුත් කර ඇත. 2015 වසරේ සිට 2020 වසර දක්වා පරීක්ෂා කරන ලද සාම්පල පිළිබඳ දත්ත විශ්ලේෂණයක් ගණන රූපය 3 මඟින් දැක්වේ.



රූපය 3: **ජෛව විද්‍යා අංශය මඟින්** 2015 සිට 2020 දක්වා පරීක්ෂා කරන ලද මුළු සාම්පල ගණන දැක්වෙන සටහන

විශ්ලේෂණ කරනු ලබන සාම්පල අතරට පහත සාම්පල වර්ග ඇතුළත් වේ:


- ආනයන කරුවන්ගේ කිරි නිෂ්පාදන
- තේ, වියලි පොල්/පොල්, අපනයනකරුවන්ගේ කුළු බඩු
- ජලය, පස වැනි පාරිසරික සාම්පල සහ කාර්මික අංශයෙන් නිශ්චිත මිශ්‍ර ලෝහ/ලෝහ ද්‍රව්‍ය.

විශ්ලේෂණ සේවා සැපයීමට අමතරව, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විශ්ලේෂණාත්මක දත්ත සැපයීමද ජෛව විද්‍යා අංශය මඟින් වාර්ෂිකව සිදු කරනු ලබයි. මෙහිදී ඉහත සඳහන් කල සාම්පල වර්ග සඳහා මෙම විශ්ලේෂණ තාක්ෂණ යෙදීම ප්‍රධාන වශයෙන් සිදු වන අතර විකිරණ හා විෂ ද්‍රව්‍ය වලින් පරිසරය සහ මිනිසුන් ආරක්ෂා කිරීම සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. එසේම ළදරු කිරිපිටි සිට පූර්ණ යොදය සහිත කිරිපිටි දක්වා සියලුම වර්ගයේ දේශීයව නිෂ්පාදනය කරන සහ ආනයනය කරන ලද කිරිපිටිවල විකිරණශීලී අපද්‍රව්‍ය අඩංගුදැයි පරීක්ෂා කිරීම ජෛව විද්‍යා අංශයේ ප්‍රමුඛ අරමුණු අතරවේ.

මෙම ක්‍රියාකාරකම යටතේ 2020 ජනවාරි සිට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 12 ක් ආවරණය වන පරිදි දේශීය වෙළඳපොලේ ඇති ආනයනික කිරිපිටි සාම්පල 65 ක් එකතු කරන ලදි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන සැලසුම් කළ පරිදි අඛණ්ඩව කරගෙන යාමට නොහැකි විය. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ විකිරණශීලී අපද්‍රව්‍ය අඩංගුදැයි පරීක්ෂා කිරීම සඳහා සාම්පල 35 ක් විශ්ලේෂණය කරන ලදී.

ඒ අනුව ඉහත කිරි පිටි සාම්පල් වල මනිනු ලැබූ විකිරණශීලී මට්ටම් 1995.07.21 දිනැති ගැසට් පත්‍රය මඟින් නියම කරන ලද සීමාවන් තුළ තිබෙන බව විශ්ලේෂණය කිරීමෙන් සොයා ගන්නා ලදී.

ජෛව විද්‍යා අංශය මඟින් න්‍යෂ්ටික විශ්ලේෂණාත්මක සේවාවන් සැපයීම තුළින් 2020 දී උපයන ලද ආදායම රුපියල් මිලියන 53.7 ක් වූ අතර 2015 සිට 2020 දක්වා කාලය තුළ උත්පාදනය කළ දල ආදායම පිළිබඳ නැඹුරුතා විශ්ලේෂණය පහත රූප සටහනෙහි දක්වා ඇත.



රූපය 4: පෛව විද්‍යා අංශය මඟින් 2015 සිට 2020 දක්වා උපයන ආදායම දැක්වෙන සටහන

අංශුමාත්‍ර මූලද්‍රව්‍ය විශ්ලේෂණය සහ ස්ථායී සමස්ථානික විශ්ලේෂණය සඳහා අලුතින් පිහිටුවන ලද විද්‍යාගාර විශ්ලේෂණ සේවා ආරම්භ කර ඇති අතර එම කටයුතු නිතිපතා විදිමත්ව සිදු කරනු ලැබේ. අපජලය සඳහා දළ ඇල්ෆා බීටා මිනුම් විශ්ලේෂණාත්මක සේවාව, මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) නියාමන අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ආරම්භ කර ඇත. මේ සඳහා පෛව විද්‍යා අංශයේ රසායනාගාර මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පරිසර දූෂණය පාලනය හා කළමනාකරණය පිළිබඳ උපදේශනය හා පරීක්ෂණ සේවා සැපයීම සඳහා 2020 වනවිට ලියාපදිංචි කරන ලදී.

පෛව විද්‍යා අංශය පරීක්ෂණාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රතීතන සහතිකය ISO IEC 17025: 2005 යටතේ ගැමා වර්ණාවලීක්ෂ විද්‍යාගාරය සඳහා 2006 වර්ෂයේදී ලබාගත් අතර එහි තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) වාර්ෂිකව ඉතා ඉහල මට්ටමකින් පවත්වා ගෙන යයි. මෙම ප්‍රතීතන තත්වය ISO IEC 17025: 2017 හි නව අනුවාදයට අනුකූලව සම්පූර්ණ තත්ව පාලන පද්ධතියම, සියළුම ලියකියවිලි හා ක්‍රියාවලියන් ද ඇතුළත්ව වැඩි දියුණු කරන ලද අතර 2020 පෙබරවාරි මාසයේදී නව ප්‍රතීතන තත්වය සහතිකය ලබා ගන්න ලදී.

විද්‍යාගාර තුල ස්ථාපිත තත්ත්ව කළමනාකරණ පද්ධතිය දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද පැවැත්වෙන තත්ත්ව සහතික කිරීම සහ තත්ත්ව පාලනය (QA/QC) වැඩසටහන් සඳහා අඛණ්ඩව සහභාගී වීම තුළින් තවදුරටත් ශක්තිමත් කිරීමට පෛව විද්‍යා අංශය සමත් විය.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (Sri Lanka Accreditation Board) සහ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනය (International Atomic Energy Agency) විසින් පවත්වනු ලබන අභ්‍යන්තර හා බාහිර ප්‍රවීණතා පරීක්ෂණ අභ්‍යාස, තත්ත්ව විගණන, නිතිපතා තක්සේරු කිරීම් විද්‍යාගාර තුළ සිදු කරනු ලබයි.

විද්‍යාගාර මඟින් ලබාදෙන පරීක්ෂණ ප්‍රතිපලවල වලංගුතාවය හා නිරවද්‍යතාව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික නිපුණතාව සහ කළමනාකරණ හැකියාවන් යන දෙකම පෛව විද්‍යා අංශය මඟින් පෙන්නුම් කර ඇත.

ජෛව විද්‍යා අංශය මඟින් මඟින් කරන ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු

ජාතික සමාජ ආර්ථික සුභසාධනය ඉදිරියට ගෙන යාමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්හි පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් හා ව්‍යාපෘති ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම, වඩා හොඳ වෛද්‍ය සේවාවන් සැපයීම, කාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ තරඟකාරී බව ඉහළ නැංවීම සහ පරිසරය ආරක්ෂා කිරීම වැනි විවිධාකාර අවශ්‍යතා සපුරාලීම සඳහා න්‍යෂ්ටික හා විකිරණ යෙදුම් ප්‍රයෝජනවත් බව ඔප්පු වී ඇත.

ජෛව විද්‍යා අංශය න්‍යෂ්ටික හා ඒ ආශ්‍රිත විශ්ලේෂණ තාක්ෂණයන් මත පදනම් වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති කිහිපයකට සම්බන්ධ වන නමුත් ගෝලීය කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 සඳහා සැලසුම් කළ පරිදි පර්යේෂණ හා සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි විය.

i) “ලංකා තේ” සම්භවය තහවුරු කිරීම සඳහා භූ රසායනික ප්‍රවේශය පිළිබඳ නියමු ව්‍යාපෘතිය

ජාතික වැදගත්කමක් සහිත නියමු ව්‍යාපෘතියක් වූ **“ලංකා තේ”** සම්භවය තහවුරු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් 2020 දෙසැම්බර් 18 වෙනිදා අත්සන් කරන ලදී (රූපය 05).

මෙම නියමු ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සමස්ථානික අනන්‍යතාවය සහ මූලද්‍රව්‍ය සංයුතිය පදනම් කරගෙන වෙනත් තේ වලින් ලංකා තේ වෙන්කර වෙනස හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක සත්‍යාපන ක්‍රමයක් දියුණු කිරීමය.



රූපය **5:** පාර්ශව තුන විසින් ත්‍රිත්ව ගිවිසුම අත්සන් කිරීම.

මෙම ව්‍යාපෘතියේදී භාවිතා කරන ප්‍රධාන න්‍යෂ්ටික විශ්ලේෂණ තාක්ෂණික ක්‍රමවේදයන් වන්නේ මූලද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ICP-MS සහ තේ වල සමස්ථානික අනන්‍යතාවය සොයා ගැනීම සඳහා IRMS යන තාක්ෂණික මෙවලම්ය.

මෙම ව්‍යාපෘතිය සඳහා එක් එක් පාර්ශවයන්ගේ භූමිකාවන් සහ වගකීම්, නියැදි උපායමාර්ගය සහ අරමුදල් සම්පාදනය කිරීමේ යාන්ත්‍රණය මෙම ගිවිසුම මඟින් පැහැදිලිව හඳුනාගෙන ඇත. ඉහළ වර්ධන, මධ්‍යම වර්ධන සහ අඩු වර්ධන (high grown, medium grown and low grown) යන සියළුම තේ වගා කරන ප්‍රදේශ නියෝජනය කරමින් ප්‍රමුඛ පෙළේ තේ කර්මාන්තශාලා වලින් විවිධ තේ වර්ග, ශ්‍රේණි සහිත ඕතඩොක්ස් කළු තේ (orthodox black tea) සාම්පල 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට එකතු කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ ගෝලීය තේ වෙළඳපොල තුල "Ceylon Tea" වල උසස් තත්ත්වය රැක ගනිමින් ඉහළ මිලක් ලබා ගැනීම සහ නිශ්චිත භූගෝලීය දර්ශකයේ GI සහිත නිෂ්පාදනයක් ලෙස ලොව පුරා Ceylon Tea සඳහා ලියාපදිංචි කිරීමට සහාය වීමයි.

ii) බියගම අපනයන සැකසුම් කලාපයේ, කාර්මික පරිසරය තුල වායුගෝලයේ තත්ත්ව අධීක්ෂණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය (BOI) විසින් පාලනය කෙරෙන බියගම නිදහස් වෙළඳ කලාපයේ වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණ කටයුතු මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරන ලදී. සාම්පල් රැස් කරන උපකරණය (ජෙන්ට් සාම්පලර්) බී කලාපයේ පිහිටි අධ්‍යක්ෂක නිල නිවාස පරිශ්‍රයේ (06 ° 57'53.8380 "N, 080 ° 00'16.6500" E) ස්ථාපනය කර ඇත.

වාතයේ ඇති වායු අංශු පදාර්ථ (Air particulate Matter) පිළිවෙලින් සියුම් හා රළු අංශු වශයෙන්, සිදුරු ප්‍රමාණය අනුව 0.4 µm ට අඩු සහ 8 µm යන වායු පෙරහන වෙත එකතු කරන ලදී. පසුගිය 2018 නොවැම්බර් සිට 2020 සැප්තැම්බර් දක්වා සතියකට වරක් වන ලෙස වායු පෙරහන සාම්පල එකතු කල අතර එම කාලය තුල වායු පෙරහන සාම්පල 160 ක් (සියුම් හා ගොරෝසු පෙරහන් සාම්පල යුගල 80 ක්) එකතු කරන ලදී.

කොවිඩ් 19 ගෝලීය වසංගතය හේතුවෙන් මෙම කාලය තුළ එකතු කරන ලද සාම්පල ගණන සීමා සහිත විය. මෙයට හේතුවන්නේ 2020 මාර්තු සිට 2020 මැයි දක්වා මුළු රටම වසංගත තත්ත්වය හේතුවෙන් අගුලු දමා තිබීමත් පසුව සේවා කරන දින සහ සේවා කාලය සීමා වීමත්, එසේම එම වායු පෙරහන නියැදි ලබා ගැනීමේ ප්‍රදේශයට ප්‍රවේශ වීම සීමා වීමත්ය.

PM 2.5 සහ PM 10 යන අංශු ප්‍රමාණ දර්ශක ගණනය කිරීම සඳහා එකතු කරන ලද සියුම් හා ගොරෝසු අංශු පෙරහන වල ගුරුත්වාකර්ෂණ (ස්කන්දය) මිනුම් පෙව විද්‍යා අංශයේදී සිදු කරන ලද අතර ඉන්දුනීසියාවේ ව්‍යවහාරික න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය හා ජාතික න්‍යෂ්ටික බලශක්ති ඒජන්සියේ කාරුණික දායකත්වයක් ලෙස සිහින් අංශු පෙරහන් 44 ක් සඳහා EDXRF තාක්ෂණය භාවිතා කර මූලද්‍රව්‍ය මිනුම් සිදු කරන ලදී.


මොන්ගෝලියාවේ උලාන්බතාර් නුවර 2019 ජූනි 24-26 දිනවල පවත්වන ලද පර්යේෂණ සම්බන්ධීකරණ රැස්වීම කාලය තුළ නිර්දේශිත පරිදි ලංකාවේ වායු දූෂණ අධ්‍යයනයට සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) සහ ඉන්දුනීසියාවේ ව්‍යවහාරික න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය හා ජාතික න්‍යෂ්ටික බලශක්ති ඒජන්සිය (BATAN) අතර අවබෝධතා ගිවිසුමක් සකස් කල අතර එම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම අවසන් අදියර දක්වා ක්‍රියාත්මක නොවුනි.

බියගම අපනයන සැකසුම් කලාපයේ, කාර්මික පරිසරය තුල රැස් කරන ලද අංශු පෙරහන වල අඩංගුව තිබූ මූලද්‍රව්‍ය 16 ක් (ඇලුමිනියම්, සිලිකන්, සල්ෆර්, පොටැසියම්, කැල්සියම්, ටයිටෙනියම්, වැනේඩියම්, ක්‍රෝමියම්, මැන්ගනිස්, යකඩ, නිකල්, තඹ, සින්ක්, ඊයම්, ආසනික්, හා ක්ලෝරීන්) විශ්ලේෂණයේදී

හඳුනා ගෙන ඇත. මෙයට අමතරව බියගම කර්මාන්ත කලාපයට ආසන්න ප්‍රදේශ වලින් මතුපිට පස් සහ ශාක භෝග (එළවලු, පලතුරු බෝග) වැනි පාරිසරික සාම්පල 2019 වර්ෂය (1 වන හා 2 වන කාර්තුව) සහ 2020 වර්ෂය (2 වන කාර්තුව) තුළ එකතු කරන ලදී.

මෙසේ එකතු කරන ලද මතුපිට පාංශු සාම්පල දහහතරක් 14ක් (වායු සාම්පල නියැදි ලබාගත් ප්‍රදේශයෙන් සහ ඒ අසල පිහිටි කර්මාන්ත ශාලා වලින්) සහ ශාක භෝග (පළතුරු සහ එලවළු) සාම්පල විසි දෙකක (22) බැර ලෝහ විශ්ලේෂණය සඳහා සකස් කරන ලදී. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ රසායනාගාර වලදී EDXRF තාක්ෂණය භාවිත කර තෝරාගත් බැර ලෝහ, එනම් නිකල්, තඹ, සින්ක්, ආසනික්, රසදිය හා ඊයම් විශ්ලේෂණය කරන ලදී. මතුපිට පස් සාම්පල නියැදි විශ්ලේෂණය කිරීම සඳහා උදුනෙන් වියලන ලද අතර අංශු ප්‍රමාණය 63 µm ට අඩු සියුම් අංශු ලබා ගන්න ලදී. පිරිසිදු කරන ලද බෝග සාම්පල විශ්ලේෂණය කිරීමට පෙර උදුනෙන් වියලා කුඩු කර ගන්න ලදී. තත්ත්ව සහතික කිරීම සහ තත්ත්ව පාලනය (QA/QC) වැඩසටහන් සඳහා සහතික කරන ලද සම්මත රසායන ද්‍රව්‍ය භාවිත කරන ලදී.

භෝග සාම්පල වලින් ලබා ගන්නා මූලද්‍රව්‍ය සාන්ද්‍රණයන්ට අනුව, වැඩිම මූලද්‍රව්‍ය සාන්ද්‍රණයන් වටුවන් නැමති තණකොළ සාම්පලයෙන් නිරීක්ෂණය කරන ලදී. විශ්ලේෂණය කරන ලද එළවළු ගැන සලකා බැලීමේදී වෙරි (දේශීය වෙරි වර්ගයකි), වම්බටු, නිවිති, බටු හා කරවිල ආදියෙන් වැඩිම යකඩ මූලද්‍රව්‍ය සාන්ද්‍රණයක් දක්නට ලැබුණ අතර දක්වා ඇති පිළිවෙලට අනුක්‍රමයෙන් අඩුවීමක් පෙන්වනලදී. මෙම අධ්‍යයනය කරන ලද ශාකමය සාම්පල වාර්තා කරන ලද තඹ සින්ක්, ඊයම් මූල ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මත අවසර ලත් සීමාවන් (1996) පහත රූපයේ දක්වා ඇත (රූපය 6).



පස් සහ එළවළු වල බැර ලෝහ වල උපරිම අවසර ලත් සීමාවන් ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) වැනි සම්මත නියාමන ආයතන විසින් පහත වගුවේ දක්වා ඇති පරිදි ස්ථාපිත කර ඇත.

මූල ද්‍රව්‍ය	පසෙහි තිබිය යුතු ඉලක්කගත අගය (මිලිග්‍රෑම්/කිලෝග්‍රෑම්)	ශාකය තුල අවසර ලත් මට්ටම (මිලිග්‍රෑම්/කිලෝග්‍රෑම්)
කැඩ්මියම්	0.8	0.02
සින්ක්	50	0.60
තඹ	36	10
ක්‍රෝමියම්	100	1.30
ඊයම්	85	2
නිකල්	35	10

වගුව 1: පස් හා එළවළු වල බැර ලෝහ වල උපරිම අවසර ලත් සීමාවන්

ප්‍රකාශන ලැයිස්තුව - 2020

1. **W.A.T.L Weerakkody, C.K Dissanayake**, A.G. Chandrapala, **M.D. Kalpage, T.N. Attanayake**, K.M.A. Kendaragama - Estimating soil erosion using fallout caesium-137 and Lead- 210 in cultivated land of micro catchment in Dolosbage, Sri Lanka, 4th Annual congress on soil, plant and water sciences, Barcelona, Spain on 25th -26th November 2020 (oral presentation).

2. **W.A.T.L Weerakkody, C.K Dissanayake**, A.G. Chandrapala, M.D. Kalpage, **T.N. Attanayake**, K.M.A. Kendaragama, Hettiarachchi A.K. (2020) Estimating soil erosion using fallout caesium-137 and Lead- 210 in cultivated land of micro catchment in Dolosbage, Sri Lanka, International Journal of Research in Environmental Science and Toxicology Vol. 9(3) pp. 51-61, October, 2020. (impact factor= 1.12).https://www.interesjournals.org/research-environmental-science-toxicology/articles-in-press.html
3. A.G. Chandrapala, **C.K. Dissanayake**, K.M.A. Kendaragama, S.K. Wetthasinghe, **M.D. Kalpage, A.M.T.N. Attanayake,** A.K. Hettiarachchi. Assessment of soil erosion under different land uses in Nalanda reservoir catchment and Kuruwita , Kaluganga sub catchment using nuclear techniques, Annals of the Sri Lanka Department of Agriculture (ASDA 2020) pp11 (22).

4. Tania Warnakulasuriya, Senani Williams, **Thiwanka Weerakkody**, Mangala Dabarera, Kusum Rodrigo, **Vajira Waduge**, Dileepa Ediriweera, Niroshan Siriwardena and Rajitha Wickremasinghe **(2020)**BACKGROUND RADIATION LEVELS NEAR A MINERAL SAND MINING FACTORY IN SRI LANKA: CORRELATION OF RADIATION MEASUREMENTS WITH MICRONUCLEI FREQUENCY. *Radiation Protection Dosimetry* (2020), Vol. 189, No. 1, pp. 114–126 (Impact factor=1.0)

5. Method Validation of In-Situ Gamma Spectroscopy for quantification of Naturally Occurring Radioactive Materials (NORM) K-40, Th-232 and U-238 in Soil. **DABARE, *Poshitha*** *(Sri Lanka Atomic Energy Board); Prof. MAHAWATTA, Palee (University of Colombo, Nuclear Science Department, Sri Lanka); Mr MAHAKUMARA, Prasad Dhananjaya (Sri Lanka Atomic Energy Board)*, International Conference on the Management of Naturally Occurring Radioactive Materials (NORM), 19-30 October 2020, Vienna, AustriaAccepted/submitted for publishing 2020:

6. Ilya Strashnova, Nuwan Bandara Karunarathna, Biyagamage Ruchika Fernando, **Champa Dissanayake, Kasun Madusanka Binduhewa**. An Isotope Dilution Liquid Chromatography-Mass Spectrometry method for detection of melamine in milk powder. Journal: Food Additives and Contaminants

7. ***Thiwanka Weerakkody, Champa Dissanayake****, A.G. Chandrapala,* ***Maheshika Kalpage, Thilaka Attanayaka, Indrani Dissanayake, Kasun Binduhewa*** *(2021)* Gamma spectrometry analytical determination of terrestrial radiation level in Kuruwita area, Rathnapura district, Sri Lanka was submitted to Second **International Conference on Applications of Radiation Science and Technology** (ICARST-2021)

8. A.G. Chandrapala, **C.K. Dissanayake**, K.M.A. Kendaragama, S.K. Wetthasinghe, **M.D. Kalpage, A.M.T.N. Attanayake**, A.K. Hettiarachchi. Assessment of soil erosion under different land uses in Nalanda reservoir catchment and Kuruwita, Kaluganga sub catchment using nuclear techniques (2020) accepted in the journal of Tropical Agriculturist.

9. **Thiwanka Weerakkody, Lakmali Handagiripathira, Poshitha Dabare, Thisari Guruge** (2021) Determination of Gross Alpha and Gross Beta Activity in Water samples by iSolo Alpha/Beta Counting System accepted as an oral presentation at ICRER 2021 : *23th International Conference on Radioecology and Environmental Radioactivity to be held in Vienna, Austria* during Jun 21-22, **2021**

10. **Thiwanka Weerakkody, Champa Dissanayake**, A.G. Chandrapala, **Maheshika Kalpage, Thilaka Attanayaka, Indrani Dissanayake, Kasun Binduhewa** (2021) "Terrestrial background radiation study in Bathalegoda, North western province Sri Lanka" has been accepted for **oral presentation** at the Ninth International Conference on Radiation in Various Fields of Research (RAD 2021), *Herceg Novi, Montenegro, from 14th to 18th of June, 2021.*

4.3. නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන නිර්විනාශක පරීක්ෂණ සේවාවන්



7 රූපය: නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය

නුවර පාර, කැලණිය, බුලුගහ හංදියෙහි පිහිටා ඇති ශ්‍රී පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය (NCNDT) මඟින් නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සිදු කරනු ලබයි. එය රජයට අයත් ආයතනයක් වන අතර ඉතා පුළුල් මට්ටමින් නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සපයනු ලබයි.

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි මූලික අරමුණ වන්නේ නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධව පුහුණු හා පරීක්ෂණ සේවාවන් සැපයීමයි. ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදයන්ට අනුව කර්මාන්ත හා සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා සියලුම වර්ගයේ නිර්විනාශක, පරීක්ෂණ සේවාවන් සැපයීම සඳහා ඉතා නවීන උපකරණ වලින් පරිපූර්ණ ප්‍රතීතකරණය කරන ලද විද්‍යාගාර පවත්වාගෙන යාම අපේක්ෂා කරනු ලබයි. (7 රූපය).

4.3.1 නිර්විනාශක පරීක්ෂණ පුහුණු සේවා:

නිර්විනාශක පරීක්ෂණ පුහුණු කටයුතු ඉහල නැංවීමට කටයුතු කරන අතර ISO 9712 සහ ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව කටයුතු කරන නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ජාතික ආයතනය (National Certification Body for NDT -NCBNDT) පිහිටුවීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මෙම NCBNDT ආයතනය, ප්‍රතීතකරණයට ලක් කර ඇත.

එසේම NCBNDT ආයතනය, නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ ජාත්‍යන්තර කමිටුවේ (ICNDT) පිරිස් සහතිකකරන ආයතනය (Personnel Certification Body-PCB) සඳහා වන බහුපාර්ශවිය පිළිගැනීමේ සම්මුතියෙහි (MRA) ලියාපදිංචි වී ඇත.


ISO 9712 ට අනුව NCBNDT මගින් මෙහෙයවනු ලබන විභාග හා සහතිකකරන ක්‍රියාවලියට සහභාගී වීම සඳහා, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ පුහුණු ඒකකය මඟින් පවත්වනු ලබන සහතිකකරන පාඨමාලා, NCBNDT මඟින් පිළිගනු ලැබ ඇත.
එසේම, 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධානවලට අනුකූලව NCNDT පුහුණු ඒකකය මඟින් පවත්වනු ලබන සහතික කිරීමේ පාඨමාලා තෘතීයික හා වෘත්තීය

අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති අතර සංවර්ධන සැලැස්ම අංක 887/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි පළ කර ඇත (1995 සැප්තැම්බර් 7 දිනැති).

මීට අමතරව, ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් මත පදනම්ව වාර්ෂිකව නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි වැඩමුළු සහ විශේෂ පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ.

2020 දී ඉහත සියළු ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂකයන් 97 ක් සහභාගී වූහ. මෙම ක්‍රියාකාරකම් යටතේ උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 1.2 කි (බදු හැර). 2020 සඳහා ඉලක්කය වූයේ සිසුන් 120 ක් සහභාගී වී රුපියල් මිලියන 3.52 ක් උපයා ගැනීමයි.

කොවිඩ් 19 ගෝලීය වසංගතය හේතුවෙන් මෙම වසර තුල ලබා දීමට හැකිවූ මෙම සේවාවන් ඉතාමත් අවම මට්ටමක පැවතුනි.



8 රූපය: පුහුණු / සුදුසුකම් ලත් / සහතිකලත් NDT අපේක්ෂකයින් සංඛ්‍යාව

<u>නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ජාතික ආයතනයෙහි ප්‍රතීතන කටයුතු පවත්වාගෙන යෑම:</u>

නිර්විනාශක පරීක්ෂණ සුදුසුකම් සහ පිරිස් සහතික කිරීම සඳහා වන නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ **ජාතික** ආයතනයෙහි (National Certification Body for Qualification and Certification of Non-Destructive Testing Personnel ; NCBNDT) ප්‍රතීතන කටයුතු ISO 17024:2012 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සාර්ථකව පවත්වාගෙන යාමට අදාල කටයුතු සිදු කල අතර පහත සඳහන් ක්‍රියාකාරකම්ද ඊට අමතරව සිදු කරන ලදී.

සහතිකකරණ **ඒකකය:**

i) දාහත්දෙනෙකු සඳහා නිර්විනාශක පරීක්ෂණ සහතික නිකුත් කිරීම.
ii) දහඅටදෙනෙකුගේ නිර්විනාශක පරීක්ෂණ සහතික අළුත් කිරීම.
iii) ICNDT MRA උපලේඛණ අංක 2 යටතේ ලියාපදිංචි පිරිස් සහතික කිරීමේ ආයතනයක් (PCB) ලෙස NCBNDT අළුත් කිරීම ලබා ඇත

iv) NCBNDT හි පළමු නිරීක්ෂණ තක්සේරුව (surveillance assessment) සිදු කරන ලදී

v) නිවැරදි කිරීමේ ක්‍රියාවන් (06) ලේඛණ ගත සාක්ෂි සමඟ ඉදිරිපත් කරන ලදී.

vi) CBNDT හි කවුන්සිල සාමාජිකයින්ගේ ලැයිස්තුව සංශෝධනය කරන ලදි.

vii) කවුන්සිල සාමාජිකයින්ගේ පෞද්ගලික ලිපි ගොනු සකස් කරන ලදි.

viii) නව තාක්ෂණික උපදේශක කමිටු සාමාජිකයින් 06 දෙනෙකු පත් කරන ලදී.

ix) තාක්ෂණික උපදේශක කමිටු සාමාජිකයින්ගේ පෞද්ගලික ලිපි ගොනු සකස් කරන ලදි.

x) ප්‍රධාන ලේඛණය (CBNDT/MLD) සංශෝධනය කරන ලදී.

xi) සුදුසුකම් සහ පිරිස් සහතික කිරීම සඳහා වන නිර්විනාශක පරීක්ෂණ මාර්ගෝපදේශනය සකස් කරන ලදී.

xii) සහතික කිරීමේ ක්‍රමවේදය සම්බන්ධ තොරතුරු ඇතුලත් අත් පත්‍රිකාවක් සකස් කරන ලදි.

xiii) CBNDT වෙබ් පිටුව යාවත්කාලීන කරන ලදි.

xiv) TAC සඳහා TOR සකස් කරන ලදී.

xv) “NDT කාර්මික පළපුරුදු සටහන් පොත” සංශෝධනය කොට නව ලොග් පොතක් සකස් කරන ලදී.

xvi) “Safe Guarding Impartiality-Risk Analysis” වාර්තාව සකස් කරන ලදි.

xvii) විභාග සහ සහතික කිරීම් සම්බන්ධව ඉල්ලුම්කරුවන්ගේ අදහස්/ඇගයීම් ලබාගන්නා ආකෘති පත්‍රය සමාලෝචනයට ලක් කෙරිණි.

xviii) මූලික සහතික කිරීමේ ගාස්තුව, සහතික කිරීම් අලුත් කිරීමේ ගාස්තුව, නැවත සහතික කිරීමේ ගාස්තුව යන ගාස්තු සංශෝධනය කරන ලදී

xix) අභ්‍යන්තර තත්ත්ව විගණනය පවත්වන ලදී

xx) තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් පැවැත්විණි.

xxi) MT,UT,RT, ET සහ PT යන ක්‍රම සඳහා NDT පුහුණු විෂය නිර්දේශ සමාලෝචනය කරන ලදී.

xxii) මූලික සහතික කිරීම, සහතික අලුත් කිරීම සහ නැවත සහතික කිරීම සම්බන්ධ ක්‍රමවේදයන් සමාලෝචනය කරන ලදී.

CBNDT හි විභාග කමිටුව (EC):

i. NDT විභාග 09 ක් පහත පරිදි පැවැත්විණි
   - මූලික විභාග: 05
   - පළමු වර නැවත කරන විභාග (first repeat) ගණන: 02
   - දෙවන වර නැවත කරන විභාග (second repeat) විභාග ගණන: 02

ii. MT, PT, UT, ET සහ RT යන NDT ක්‍රමවේද වල පළමු, දෙවන හා තෙවන මට්ටම්වලට අදාල මූලික විභාගය, පළමු වර නැවත කරන විභාගය, දෙවන වර නැවත කරන විභාගය යන විභාගවල ප්‍රතිඵල පත්‍රිකා සංශෝධනය කරන ලදී - පත්‍රිකා 90 ක්.

iii. පළමු , දෙවන හා තෙවන මට්ටම්වලට අදාල මූලික විභාගය, පළමු වර නැවත කරන විභාගය, දෙවන වර නැවත කරන විභාගය, නැවත සහතික කිරීමේ මූලික විභාගය එහි නැවත කරන විභාග යන විභාගවල විභාග පිරිවැය තක්සේරු සකස් කරන ලදී.

iv. RT 1 විභාගයට අදාල ප්‍රයෝගික පරීක්ෂණ සඳහා ලකුණු දීමේ ක්‍රමය සංශෝධනය කරන ලදි.

v. MT 2 විභාගයට අදාල ප්‍රයෝගික පරීක්ෂණ සඳහා වන මූලික වාර්තාව (master report) සකස් කරන ලදි.

vi. MT1, UT1 සහ RT1 යන NDT ක්‍රමවේද වල විභාග අපේක්ෂකයින් සඳහා ලබාදෙන තොරතුරු පත්‍රිකා සංශෝධනය කරන ලදි.

vii. විභාග කාර්ය මණ්ඩලයට අදාළ පුද්ගලික ලිපි ගොනු සකස් කරන ලදි.

viii. අලුතින් පත් කළ විභාග කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි ලැයිස්තු සකස් කරන ලදී.

ix. විභාග අපේක්ෂකයින් සඳහා ගිවිසුමක් සකස් කරන ලදී.

x. විභාගවලට ඇතුළත් වීමේ ආකෘතිය සංශෝධනය කරන ලදි.

xi. විභාග මාර්ගෝපදේශ පිළිබඳ නව ලේඛණයක් සකස් කරන ලදී.

xii. ප්‍රයෝගික පරීක්ෂණ සඳහා වන විභාග සාම්පලවල ඉන්වෙන්ටරි සකස් කරන ලදී.

xiii. NCBNDT-EC හි පළමු නිරීක්ෂණ තක්සේරුවට අදාල තක්සේරු කරුවන්ගේ යෝජනා සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග SLAB වෙත ඉදිරිපත් කරන ලදී.

xiv. “සුදුසුකම් සහ සහතික කිරීම සඳහා වන NCBNDT මාර්ගෝපදේෂය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xv. "NCBNDT හි විෂය පථය" සංශෝධනය කරන ලදී.

xvi. NDT විභාග ප්‍රතිඵල ඇගයීම් වාර්තා දෙකක් සකස් කරන ලදී.


4.3.2 නිර්විනාශක පරීක්ෂණ සේවා:

ඉහතින් විස්තර කරන ලද නිර්විනාශක පරීක්ෂණ පුහුණු සේවා වලට අමතරව NCNDT මගින් පරීක්ෂණ සේවා කර්මාන්ත ක්ෂේත්‍රය වෙත ලබා දෙයි. එමඟින් කාර්මික ඵලදායිතාව සහ සුරක්ෂිතතාව ඉහල නැංවීමේ අරමුණින් යන්ත්‍ර සුත්‍ර සහ ඒ ආශ්‍රිත ලෝහ කොටස් වල පැවතිය හැකි හානිකර පලුදු පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය(SLAB) මගින් ISO 17020 ට අනුව ප්‍රතීතකරණය කරන ලද NDT සේවා ඒකකය (NDT Inspection Body) මඟින් මෙම සේවා ලබා දෙනු ලබයි.

ISO /IEC 17011ට අනුව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානය (International Organization for Accreditation, Bodies - ILAC) මඟින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පිළිගෙන ඇත. පරීක්ෂණ සේවා ආයතන, වෛද්‍ය පරීක්ෂණ විද්‍යාගාර, අනිකුත් පරීක්ෂණ විද්‍යාගාර, ක්‍රමාංකන විද්‍යාගාර යන ආයතන පිළිවෙලින් ISO 17020, ISO 15189, ISO 17025 යන ජාත්‍යන්තර සම්මත ක්‍රමවේදයන්ට අනුව ප්‍රතීතකරණයට ලක්කිරීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් සිදු කරනු ලබයි.

ඒ අනුව NCNDT හි විද්‍යාගාර වලට අයත් චුම්බක අංශු පරීක්ෂාව , ද්‍රාව විදාවුත් පරීක්ෂාව, අතිධ්වනි ශබ්ද තරංග පරීක්ෂාව සහ කොන්ක්‍රීට් ආකෘති පරීක්ෂාව යන ක්‍රමවේදයන් හතර ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් ප්‍රනතකරණයට ලක් කර ඇත.

ඉතා හොඳින් පුහුණු කර සහතිකකරණයට ලක් කර ඇති දක්ෂ කාර්ය මණ්ඩලයක් මඟින් මෙම NDT සේවා සපයනු ලබයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශ සඳහා NDT සේවා **211** ක් 2020 වසරේදී ලබා දී ඇති අතර එමඟින් රුපියල් මිලියන **12.92** ක ආදායමක් (excluding tax) උපයා ගෙන ඇත.



9 රූපය: 2015 සිට 2020 දක්වා සපයන ලද NDT පරීක්ෂණ සේවා සංඛ්‍යාව

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය එහි මූලික පරමාර්ථය වන රටේ කාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ ලෝහමය සංරචක, එකලස් කිරීම් සහ ව්‍යුහයන් වල මෙන්ම සිවිල් ඉදිකිරීම් වල ද ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වන අරමුණු සාක්ෂාත් කර ගන්නා අතරම ඉදිරි දශකය තුල මහා භාණ්ඩාගාරයට බරක් නොවන තිරසර සංවර්ධිත ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ.

ප්‍රතීතනය කරන ලද නිර්විනාශක පරීක්ෂණ සේවා ඒකකය නඩත්තු කිරීම:

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි NDT පරීක්ෂණ ඒකකය **(NDT Inspection Body/IB)** , ISO / IEC 17020; “Conformity assessment - Requirements for the operation of various types of bodies performing inspection” වලට අනුව 2017 වර්ෂයේ සිට චුම්බක අංශු පරීක්ෂාව (MT), ද්‍රව විනිවිද යාමේ පරීක්ෂාව (PT), අතිධ්වනි පරීක්ෂාව (UT), සහ කොන්ක්‍රීට් ව්‍යුහ පරීක්ෂාව (CST) සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) මගින් ප්‍රතීතණය කර ඇති අතර එම ප්‍රතීතණ කටයුතු **පවත්වාගෙන යාම** සාර්ථකව අඛණ්ඩව සිදු කරන ලදී. මේ මත පදනම්ව 2020 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් සිදු කරන ලදී;

i. අපක්ෂපාතීත්වය තක්සේරු කිරීම (impartiality assessment) / අවදානම් විශ්ලේෂණය (risk analysis) සිදු කරන ලදී.
ii. අභ්‍යන්තර තත්ත්ව විගණනය (internal quality audit) සිදු කරන ලදී.
iii. ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන (proficiency testing) සම්පූර්ණ කරන ලදි.

iv. NCNDT හි පරීක්ෂණ සේවා ඒකකයෙහි (Inspection Body-IB) හි දෙවන අධීක්ෂණ තක්සේරුව යටතේ අදාල තක්සේරුකරුවන්ගේ යෝජනා හතර සඳහා නිවැරදි කිරීම් SLAB වෙත ඉදිරිපත් කරන ලදී.

v. දැනට පවතින සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs), පෝරම , ලැයිස්තු සහ ආකෘති සමාලෝචනය කර සංශෝධනය කරන ලදි.

vi. NCNDT හි IB හි ගුණාත්මක අත්පොත (Quality Manual) සමාලෝචනය කර සංශෝධනය කරන ලදි.

vii. නව SOPs, ආකෘති පත්‍ර, අභ්‍යන්තර ක්‍රමාංකන ක්‍රියාපටිපාටි සහ උපදෙස් ලේඛණ සකස් කරන ලදි.

viii. අලුතින් පත් කළ IB කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි ලැයිස්තු සකස් කරන ලදි.

ix. නිර්විනාශක පරීක්ෂණ උපකරණවල අභ්‍යන්තර හා බාහිර ක්‍රමාංකන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී.

x. කළමනාකරණ සමාලෝචන රැස්වීම් පැවැත්විණි.

xi. NCNDT-IB හි නැවත තක්සේරු කිරීම් SLAB තක්සේරුකරුවන්ගේ සහය ඇතිව දුරස්ථව සිදු කරන ලදී.

xii. තක්සේරුකරුවන් විසින් යෝජිත කරුණු තුන (03) සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග SLAB වෙත ඉදිරිපත් කරන ලදී.

<u>පැස්සුම් ශිල්පි යෝග්‍යතා ඒකකය</u> **<u>(Welder Qualification Facility)</u>**

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ "පැස්සුම් ශිල්පි යෝග්‍යතා ඒකකය" (Welder Qualification Facility-WQF) එහි වාණිජ මෙහෙයුම් 2020 ජූනි මස 23 දින සිට ආරම්භ කරන ලදී. මෙම ඒකකය ස්ථාපිත කරන ලද්දේ ජාත්‍යන්තර ව පිළිගත් පැස්සුම් කරුවන්, පැස්සුම් අධ්‍යක්ෂක වරුන් හා පරීක්ෂකවරුන් වැනි වෘත්තිකයින් බිහි කිරීම සඳහාය. මෙම ඒකකය, ක්‍රමාංකිත පැස්සුම් උපකරණ, සුරක්ෂිත වැඩ පරිසරය හා CWI, CSWIP වැනි ආයතන වලින් සුදුසුකම් ලැබූ දක්ෂ සම්පත් දායක මණ්ඩලයකින් සමන්විත වනු ඇත.

මෙම පැස්සුම් ශිල්පි යෝග්‍යතා ඒකකය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ:

i. ශ්‍රී ලංකාවේ පැස්සුම් ශිල්පීන් සහතික කිරීමේ වැඩසටහනට පහසුකම් සැපයීම.

ii. පැස්සුම්කරුවන් ASME Section IX වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ සේවාදායකයාගේ සමාගමේ ප්‍රමිතීන් සපුරාලන්නේ නම් ඒ සඳහා ඔහුට සහතිකයක් ලබා දීමෙන් ඔහුගේ නිපුණතාවය සහ කුසලතාවය සහතික කිරීම. NCNDT මගින් නිකුත් කරනු ලබන මෙම සහතිකය ජාත්‍යන්තරව පිළිගනු ඇත.

iii. පැස්සුම් ක්ෂේත්‍රයේ පවතින පටිපාටි සඳහා සුදුසුකම් සේවා සැපයීම.

iv. ASME Section IX වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ සේවාදායකයාගේ සමාගමේ ප්‍රමිතීන් සපුරාලන නිපුණතාවයකින් සහ කුසලතාවයකින් සමන්විත පැස්සුම් ශිල්පින් තේරීම.

v. පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්.

vi. වෙල්ඩින් ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීය නිපුණතාවයකින් සමන්විත ප්‍රජාවක් ගොඩනැගීම.

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය (NCNDT) මගින් මෙම වැදගත් ව්‍යාපෘතිය නිර්මාණය කිරීම නිසා පැස්සුම් ශිල්පීන්ට බහුවිධ ප්‍රතිලාභ ලබා ගත හැකි අතර ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි රැකියා අවස්ථාවන් සඳහා අවශ්‍ය වෘත්තීය සුදුසුකම අත්පත් කරගත හැකිය. තවද, ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමෙන් මෙය ඔවුන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් 2020 දී සිදු කරන ලදී:

i. අවශ්‍ය වෙල්ඩින් උපකරණ සහ උපාංග මිලදී ගැනීමේ කටයුතු ඉදිරියට කරගෙන යාම.
ii. වාණිජමය කටයුතු ආරම්භ කිරීම.
iii. අවශ්‍ය වෙල්ඩින් උපකරණ වල අභ්‍යන්තර හා බාහිර ක්‍රමාංකන ක්‍රියාවලිය කිරීම.
iv. 2020 වර්ෂය සඳහා වෙල්ඩින් අධීක්ෂකයින් සහ වෙල්ඩින් විභාග පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන වැඩසටහන අවසන් කිරීම.
v. WQF සඳහා අවශ්‍ය ගොඩනැගිලි අයිතම, ආරක්ෂිත අයිතම, වෙල්ඩින් උපකරණ සහ වෙල්ඩින් මෙවලම් වල ඉන්වෙන්ටරි සකස් කරන ලදි.
vi. අලෙවිකරණ කටයුතු ආරම්භ කරන ලදි.
vii. තත්ත්ව කළමනාකරණ පද්ධති ලේඛණ සකස් කිරීම ආරම්භ කරන ලදි.
viii. වෙල්ඩර් සුදුසුකම් පරීක්ෂණය, ක්‍රියා පටිපාටි සුදුසුකම් සහ වෙල්ඩර් පරීක්ෂා කිරීම යන සේවාවන් සඳහා අය කලයුතු ගාස්තු සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
ix. ආරක්ෂිත ලෝහ චාප වෙල්ඩින් (SMAW) හි 6G සඳහා ක්‍රියා පටිපාටි සුදුසුකම් වාර්තාව (PQR) සකස් කරන ලදි.

<u>නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය තව දුරටත් වැඩිදියුණු කිරීම සඳහා IAEA TC-SRL 1009 ව්‍යාපෘතිය හරහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහාය ලබාගැනීම.</u>

ව්‍යාපෘති ප්‍රතිඵලය (Outcome):

කාර්මික නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු ව්‍යුහයන් වැනි නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා නිර්විනාශක පරීක්ෂණ හා ඊට අදාළ තාක්ෂණ ක්‍රමවේදයන් සම්බන්ධව තිරසාර හා ස්වාධීන පුහුණු මධ්‍යස්ථානයක් සහ සේවා මධ්‍යස්ථානයක් ලෙස නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම.


ව්‍යාපෘති ප්‍රතිදානය (Output):

- ISO 17020 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතිනතය ලත් පරීක්ෂණ ආයතනයක් හරහා සාම්ප්‍රදායික (conventional) **නිර්විනාශක පරීක්ෂණ** ක්‍රමවේදයන් භාවිතයෙන් සේවා ලබා ගත හැකිවීම.
- ISO 17020 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතිනතය ලත් පරීක්ෂණ ආයතනයක් හරහා කොන්ක්‍රීට් පරීක්ෂණ සඳහා **නිර්විනාශක පරීක්ෂණ** සේවා ලබා ගත හැකිවීම.
- ISO 9712 / ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිර්විනාශක **පරීක්ෂණ** ශිල්පින් පුහුණු කිරීම, සුදුසුකම් ඇගයීම සහ සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් පද්ධතියක් පැවතීම.
- වැල්ඩින් ශිල්පින්ගේ සුදුසුකම් ඇගයීම සහ සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් පද්ධතියක් පැවතීම.
- සාම්ප්‍රදායික නොවන **නිර්විනාශක පරීක්ෂණ** ක්‍රම භාවිතයෙන් පරීක්ෂණ සේවා ලබා ගත හැකිවීම.


2020 වර්ෂයේ ප්‍රගතිය:

වසර පුරා ව්‍යාපෘති සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

4.4 සාමාන්‍ය විද්‍යාත්මක අංශය



10 රූපය: විකිරණ ආරක්ෂාව පිලිබඳව දැනුවත් කිරීම්



11 රූපය: J012 ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්

නාෂ්ටික තාක්ෂණය භාවිත නොකරන රාජ්‍යයක් ලෙස මේ වන විට ශ්‍රී ලංකාව නාෂ්ටික ඉන්ධන චක්‍රයට අදාල කිසිදු ක්‍රියාකාරකමක් සිදු නොකරයි. කෙසේ නමුත්, විකිරණශීලී ද්‍රව්‍ය හා එම තාක්ෂණය, වෛද්‍ය, කර්මාන්ත, පර්යේෂණ සහ පාරිසරික සංරක්ෂණය වැනි ක්ෂේත්‍ර වල බහුලව භාවිත කරනු ලැබේ.

විකිරණ තාක්ෂණය මානව වර්ගයාගේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට සම්බන්ධ කාර්යයන් හි නිරත වන විකිරණ ශිල්පින් 1,950 ක් පමණ රට තුළ විසිරී සිටිති. දිවයින පුරා විකිරණ සේවකයන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ නියාමන අවශ්‍යතාවය සපුරාලීම සඳහා විකිරණ ආරක්ෂණ හා සුරක්ෂිතතාවය සම්බන්ධ සේවා ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම අංශය මඟිනි.

විකිරණ භාවිත කරන ආයතන වල විකිරණ සුරක්ෂිතතාවය සම්බන්ධ ක්‍රමවේද වඩා ශක්තිමත් කිරීම සඳහා "වැඩබිම් පරීක්ෂාව" හඳුන්වා දී, සේවා සැපයීම සිදු කෙරේ.

විකිරණ ආරක්ෂණ ක්ෂේත්‍රයට සමගාමීව රටේ විකිරණශීලී ප්‍රභවයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තාක්ෂණික නිපුනතාවය අත්‍යවශ්‍ය වේ. එමඟින් විකිරණ ප්‍රභව සොරකම් කිරීම, විකිරණ භාවිත කරන ආයතන වල ක්‍රියාකාරිත්වය කඩාකප්පල් කිරීම, හානිකර ක්‍රියා සඳහා විකිරණශීලී ප්‍රභව අනිසි ලෙස භාවිත කිරීම හෝ අනවසර භාවිතයෙන් සිදු කරන වෙනත් ද්වේශ සහගත ක්‍රියාකාරකම් සිදුවීම නැවැත්වීම සඳහා ද අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදෙනු ලැබේ.

විකිරණ භාවිත කරන ආයතන වල නාෂ්ටික සුරක්ෂිතතාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද, ක්‍රියාපටිපාටි සහ මානව සම්පත් සංවර්ධන කිරීම අත්‍යවශ්‍ය නියාමන අවශ්‍යතාවයන් වේ. එය මහජනතාවගේ, විකිරණ සේවකයින්ගේ සහ පරිසරයේ ආරක්ෂාව තවදුරටත් සහතික කිරීම සඳහා දායක වේ.

අනිවාර්ය ජාත්‍යන්තර සම්මතයක් ලෙස අධිවිකිරණ නිරාවරණයෙන් මහජනතාව හා පරිසරය ආරක්ෂා කරගැනීම සහ විකිරණ ප්‍රභව වල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා තාක්ෂණික හා විද්‍යාත්මක සහය සැපයීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි ප්‍රධාන වගකීමකි. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2020 වර්ෂය තුලදී අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් හා සේවාවන් ක්‍රියාත්මක කර ඇත

4.4.1 පුද්ගල විකිරණමිතික සේවාව තුලින් විකිරණ ශිල්පින් අනවශ්‍ය ලෙස විකිරණ නිරාවරණයට ලක් වීම පාලනය කිරීම

අනිවාර්ය නියාමන අවශ්‍යතාවයක් ලෙස විකිරණ ශිල්පින් සඳහා වෘත්තීමය විකිරණ නිරාවරණ පාලන (Occupational Exposure Control) වැඩසටහනක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇත.

විකිරණශීලී ප්‍රභව භාවිත කරන ආයතන වල පාලිත ප්‍රදේශ වල සේවය කරන සියලුම විකිරණ සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙම සේවාව ලබා ගත යුතුය. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ පුද්ගල විකිරණමිතික සේවාව මඟිනි.

ISO 17025: 2005 ට අනුව ප්‍රතීතනය කරන ලද පුද්ගල විකිරණමිතික සේවාව විද්‍යාගාරය (Personnel Radiation Monitoring Laboratory) මගින්, තාප සංදීප්ත මාත්‍රාමාපක (Thermo-Luminescent Dosimeters -TLDs) භාවිතයෙන් පුද්ගල විකිරණමිතික සේවාව දීප ව්‍යාප්තව ලබා දීම සිදු කෙරේ.

2020 වසර තුල දී එම ප්‍රතීතන සහතිකය ISO 17025: 2017, නවතම ජාත්‍යන්තර මට්ටම වෙත යාවත්කාලීන කරන ලදි. එම සේවාව 2020 වසරේදී දිවයින පුරා ආයතන 168 ක සේවය කරන විකිරණ ශිල්පින් 1927 ක් භාවිතා කල TLD මාපක පත් 7,107 ක් නිරීක්ෂණය කර වාර්තා සකස් කිරීම සඳහා සේවා සපයන ලදි. මෙම සේවාව මඟින් රු. මිලියන 16 ක ආදායමක් 2020 වසර තුල උපදවා ඇත. එසේම, විකිරණ සේවකයන් 210ක් පමණ විකිරණ ආරක්ෂණය පිළිබඳව පුහුණු කිරීම ද සිදු කර තිබේ.

2020 වර්ෂය තුලදී විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය විසින් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) විසින් පවත්වන ලද වෘත්තීය විකිරණ ආරක්ෂණ ඇගයීම් සේවා වැඩසටහනේ (Ocupatianal Radiation Protection Appraisal Service - ORPAS) නිර්දේශ සහ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර, ඒ සඳහා එම වැඩසටහන වෙත සහභාගී වූ සියලුම ආයතන වල දායකත්වය ද ලබා ගනිමින් සිටියි. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ජාතික පිළිකා මර්දන ව්‍යාපෘතියේ ආරාධනය මත, "වෛද්‍ය අංශ වල විකිරණ ආරක්ෂණය සඳහා වන ජාතික මාර්ගෝපදේශන සංග්‍රහය" සහ "විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා වන යොමුකිරීම් අනුදේශ" යන තාක්ෂණික සංග්‍රහයයන් නිර්මාණය කර දීම ද අංශය විසින් එම වසර තුල දී අවසන් කරන ලදි.

4.4.2 ද්විතියික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකන සේවාව (Secondary Standard Dosimetry Service)

විකිරණ උපකරණ ක්‍රමාංකනය කිරීම, උපකරණ වල ක්‍රියාකාරිත්වයේ නිවැරදිතාවය සහතික කරන අත්‍යාවශ්‍ය විකිරණ ආරක්ෂණ ක්‍රියාපටිපටියකි. විශේෂයෙන් රෝග විනිශ්චය සහ චිකිත්සක විකිරණවේදය සිදු කරන රෝහල් වලට මෙම සේවාව ලබා දිය යුතුය.

ISO 17025:2005 ට අනුව ප්‍රතීතනය කරන ලද ද්විතියික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකන විද්‍යාගාරය (SSDL) විකිරණ මාපක, විකිරණ ක්ෂේත්‍ර මාපක, විකිරණ තැවරුම් අධීක්ෂණ උපකරණ වැනි මිනුම් උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා දී දීපව්‍යාප්ත සේවාවන් සපයයි.

එහි ප්‍රවිකිරණ ප්‍රමිතීන් IAEA සහ BIPM ප්‍රාථමික ප්‍රමිතීන්ගෙන් ලබා ගෙන ඇත. 2020 වසරේ දී, එම විද්‍යාගාරයේ ප්‍රතීතන මට්ටම ද ISO 17025:2017 වෙත යාවත්කාලීන කරන ලදි.

ISO 4037 ට අනුකූලව වෛද්‍ය සම්මත X-කිරණ කදම්බයක්ද පවත්වාගෙන යාම මෙම විද්‍යාගාරය මඟින් සිදු කෙරේ. එය පටු වර්ණාවලි X -කිරණ මිනුම් සහ X -කිරණ ජනනය කිරීමේ උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා යොදා ගනී.

විකිරණ ආරක්ෂාව සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස 2020 වර්ෂය තුලදී විද්‍යාගාරය මඟින් විකිරණ මිනුම් උපකරණ 81 ක් සඳහා ක්‍රමාංකන සේවා ලබා දී ඇත. මෙම සේවාව මඟින් රු. මිලියන 0.73 ක ආදායමක් 2020 වසර තුල උපයාගෙන ඇත.

4.4.3 න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවා

න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවා සැපයීම සඳහා ඇති එකම දේශීය විද්‍යාගාරය ලෙස විකිරණ හඳුනා ගැනීම සහ විශ්ලේෂණය සඳහා තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීමේ වගකීම න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ විද්‍යාගාරය (Nuclear Instrument Laboratory) වෙත පැවරී ඇත. එහි කර්තව්‍යය වන්නේ න්‍යෂ්ටික මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික සහය සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමයි.

විශේෂයෙන් මණ්ඩලයෙහි පිහිටුවා ඇති විකිරණ උපකරණ සහ පද්ධති සඳහා මෙම සේවාව ලබා දෙනු ලැබේ. මෙම අංශය මඟින් උපකරණ තෝරා ගැනීම, දෝෂ හඳුනා ගැනීම, භාවිතය සහ නඩත්තු කිරීම සඳහා උපදේශන සේවා ද ආරම්භ කර ඇත. 2020 වසර තුළදී න්‍යෂ්ටික උපකරණ විද්‍යාගාරය මගින් සේවාදායකයින්ගේ ඉල්ලීම් 26 ක් සඳහා වාණිජ මට්ටමේ අලුත්වැඩියා සේවාවන් ලබා දී ඇත. එසේම ගයිගර්මුලර් අනාවරකයක්, අතේ ගෙන යා හැකි විකිරණ මාපකයක් සහ විද්‍යුත් වළා කුටීරයකින් සමන්විත උපකරණ කට්ටල 21ක් නිෂ්පාදනය කර ඇත. අධ්‍යාපන ආදර්ශය හා පර්යේෂණ වෙනුවෙන් නිෂ්පාදනය කල මෙම උපකරණ කට්ටල උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීම මගින් රු. මිලියන 2.5ක පමණ ආදායමක් උපයා ඇත. එසේම, එසේ සංවර්ධනය කෙරුණු උපකරණ කට්ටලය වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කල "සහසක් නිමැවුම් 2020" ජාතික තරඟාවලියේ දී විවෘත අංශයේ, භෞතික විද්‍යා කාණ්ඩය යටතේ රන් සම්මානය හිමි වී ඇත.

අලුත්වැඩියා කිරීම් සේවා සඳහා රු. මිලියන 0.20 ක ආදායමක් න්‍යෂ්ටික විද්‍යා උපකරණ ඒකක විසින් 2020 වර්ෂය තුල උපයා ඇත.

4.4.4 න්‍යෂ්ටික සුරක්ෂිතතාවය

න්‍යෂ්ටික සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ගෝලීය ප්‍රජාව තුළ මතු වෙමින් පවතින අවශ්‍යතා අනුව කටයුතු සම්පාදනය කිරීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් බවට පත්ව ඇත.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහයෝගය සමග, ජාත්‍යන්තර න්‍යෂ්ටික ආරක්ෂණ වැඩපිළිවෙල සඳහා විශිෂ්ඨ දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට හැකි වී තිබේ. සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශය මේ සම්බන්ධයෙන් වන ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති (Coordinated Research Project - CRP) දෙකකට පහත සඳහන් පරිදි එම නියෝජිතායතනය සමග සම්බන්ධ වී ඇත.

- නියාමන පාලනයෙන් බැහැර න්‍යෂ්ටික හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන විකිරණ අනාවරක උපකරණ වැඩි දියුණු කිරීම. (J02012)
- විකිරණ හඳුනාගැනීමේ උපකරණවලින් ජනනය කෙරෙන අනතුරු ඇඟවීම් සංඥා විශ්ලේෂණ ක්‍රමවේද වැඩි දියුණු කිරීම. (J02005).

J02005 ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය කොළඹ වරාය මූලික කොට ගෙන සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර, මේ වන විට එය අවසාන අදියරේ පවතී. න්‍යෂ්ටික සුරක්ෂිතතාවයේ සාර්ථක ඵලයක් ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි සෘජු දායකත්වය සමග අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය මඟින් "TRACE" ලෙස නම් කල නව ගෝලීය ජංගම යෙදුමක් (mobile app) හඳුන්වා දී ඇත (Tool for Radiation Alarm and Commodity Evaluation). නියාමන පාලනයෙන් බැහැර විකිරණශීලි ද්‍රව්‍ය අනාවරණය කර ගැනීම සඳහා විකිරණ අනාවරක උපකරණ වලින් ජනනය වන අනතුරු ඇගවීම් කාර්යක්ෂමව තක්සේරු කිරීමට (assess) මෙම යෙදුම න්‍යෂ්ටික ආරක්ෂක ක්ෂේත්‍රයේ ඉදිරි-පෙළ නිලධාරීන් සඳහා අතිශයින් උපකාරී වේ.

CRP J02012 යටතේ, විකිරණශීලී සමස්ථානික හඳුනාගැනීමේ නවීන තාක්ෂණික උපකරණ 07 ක් පරිත්‍යාගයක් ලෙස ලැබී ඇති අතර, ඒවා රටේ න්‍යෂ්ටික/විකිරණ අනාවරණ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා භාවිත කළ හැකිය.

එසේම, සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ නිලධාරීන් ජාත්‍යන්තර මට්ටමින් න්‍යෂ්ටික සුරක්ෂිතතා සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වී ඇත.

ගනුදෙනුකරුවන් ගේ ඉල්ලීම පරිදි සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ නිලධාරීන් විසින් තාක්ෂණික සංචාරයන් (technical visit) සහ විශේෂඥ උපදේශන සේවා ලබා දීම ද මෙම වසර තුල සිදු කරන ලදී.

මේ හැරුණු විට රට තුළ න්‍යෂ්ටික සුරක්ෂිතතාවය පිළිබඳව වන අවධානය වැඩිවීමත් සමග, 2020 වර්ෂය තුළ සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශය විසින් ආරක්ෂක හමුදා සාමාජිකයින් සඳහා න්‍යෂ්ටික ආරක්ෂණ පුහුණු වැඩසටහන් 10 ක් පවත්වා, න්‍යෂ්ටික අනාවරණය සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ඉදිරි පෙළ නිලධාරීන් 161 ක් පමණ පුහුණු කර ඇත. ශ්‍රී ලංකා රේගුවේ ඉල්ලීම පරිදි, කොළඹ වාරයේ මෙගාපෝර්ට් අන්වේෂණ ඒකකය විසින් හඳුනාගත් අවස්ථා 10 ක් තහවුරු කිරීම සඳහා විශේෂඥ සහාය ලබා දී ඇත.

4.4.5 විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය

අලුතින් ඉදිකරන ලද "අභාවිත විකිරණ ප්‍රභව සඳහා වන මධ්‍යම ගබඩාව" (Central Disused Radioactive Source Storage/CDRSS) පසුගිය වසරේදී, නියාමන සභාව මඟින් නිල වශයෙන් මණ්ඩලය වෙත භාර දීමෙන් පසුව එසේම පිළිගත හැකි නිර්ණායක මෙන්ම අවශ්‍ය මෙහෙයුම් ක්‍රමවේද නිර්මාණය කර තිබේ. මේ වන විට, ඉල්ලීම මත ස්ථිර ගබඩා කිරීම සඳහා වාණිජ සේවාවන් සැපයීමට එම ගබඩාව සූදානම් කර ඇත.

4.4.6 විකිරණ හදිසි ආපදා පෙර සූදානම සහ විකිරණ අධීක්ෂණය

රටේ විකිරණ ආරක්ෂණය හා එම ප්‍රභව වල සුරක්ෂිතභාවය සම්බන්ධ අරමුණු කරා තව දුරටත් යොමු වීම සඳහා විකිරණ හදිසි ආපදා ප්‍රතිචාර වැඩසටහන සහ විකිරණ අධීක්ෂණ වැඩසටහන ස්ථාපිත කර

ඇත. 2020 වර්ෂයේ දී පහත සඳහන් පරිදි ක්‍රියාකාරකම් කිහිපයක් හරහා ක්‍රියාත්මක වේ. විකිරණ අධීක්ෂණය වැඩසටහන වාණිජ සේවාවක් ලෙස ශක්තිමත් කර ඇත.

4.4.6.1 න්‍යෂ්ටික ආපදා පූර්ව හඳුනාගැනීමේ අනාවරක පද්ධතිය

කලාපයේ සිදුවිය හැකි න්‍යෂ්ටික අනතුරක බලපෑම සාර්ථකව හඳුනාගැනීම සඳහා මෙම න්‍යෂ්ටික ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ස්ථාපිත කර ඇත. පද්ධතිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව පාලනය වන අතර එය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම පද්ධතියේ තත්වය හා නිවැරදි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා සමාසිකව ක්‍රමාංකනය කිරීම අවශ්‍ය වේ.

4.4.6.2 පාරිසරික විකිරණ අධීක්ෂණය

ජාතික අවශ්‍යතාවය ලෙස අවශ්‍ය මූලික විකිරණ දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම සඳහා පාරිසරික විකිරණශීලීතා අධීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ස්ථානීය ගැමා වර්ණාවලි විශ්ලේෂණය (In-situ Gamma Spectroscopy), පසුබිම් ගැමා විකිරණමිතිය (Ambient Gamma Radiation Surveys) සහ පාංශු රේඩෝන් මිනුම් (Soil Radon Measurements) භාවිත කරමින් මෙම විකිරණ දත්ත ගබඩාව සකස් කර තිබේ.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් පවත්වාගෙන යනු ලබන “අන්තර්ජාතික විකිරණ මිනුම් දත්ත පද්ධතිය” (International Radiation Measurement Information System/IRMIS) වෙත අඛණ්ඩව පාරිසරික විකිරණශීලීතා දත්ත ලබා දීමට අවශ්‍ය කටයුතු ද අංශය මඟින් සම්පාදනය කරගෙන යනු ලබයි.

4.4.6.3 වැඩබිම් අධීක්ෂණ වැඩසටහන

වැඩබිම් අධීක්ෂණය මඟින් විකිරණ යෙදුම් සහිත සේවා ස්ථාන වල විකිරණ මට්ටම් තක්සේරු කරනු ලබන අතර එමඟින් විකිරණ පාලන ප්‍රදේශ සහ සේවකයන් නිරාවරණය වන විකිරණ මාත්‍රා ඇස්තමේන්තු කිරීම සඳහා තොරතුරු සපයාගත හැකිය. එබැවින් මෙම සේවාව ක්‍රමානුකූලව ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සඳහා අංශය මඟින් කටයුතු කරන ලදී. සාමාන්‍ය විද්‍යාත්මක අංශය මඟින් 2020 දී වැඩබිම් අධීක්ෂණ සේවා 04 ක් පවත්වන ලදී.

4.4.7 තොරතුරු තාක්ෂණ සේවා

අභ්‍යන්තර සේවාවක් ලෙස කාර්යාල පරිපාලනය සහ විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවා සැපයීම මේ අංශය යටතේ සිදු කෙරේ. මුල්‍ය සැලසුම්කරණය, වාර්තා තබා ගැනීම සහ කුවිතාන්සි නිකුත් කිරීම, භෞතික බෙදාහැරීම්, සැපයුම් සහ පුද්ගලික වාර්තා පවත්වාගැනීම සම්බන්ධ කාර්යාල, ස්වයංක්‍රීයකරණ ක්‍රියාකාරකම් සඳහා මෙම අංශයෙන් සහය ලබා දේ. විද්‍යාත්මක වැඩසටහන් හා වැදගත් සිදුවීම් ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම දැනුම කළමනාකරණ සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් බෙහෙවින් උපයෝගී කර ගනු ලැබේ.

මෙම අංශය විසින් 2020 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


I. මණ්ඩලයේ නව වෙබ් අඩවිය නිර්මාණය කිරීම.
II. දෘඪාංග හා ජාල පහසුකම් පුළුල් කිරීම.
III. පරිගණක හා අදාල දෘඪාංග සඳහා අලුත්වැඩියා සහ නඩත්තු සේවා සැපයීම.

IV. විද්‍යුත් තැපැල් පහසුකම්, අන්තර්ජාල පහසුකම් සහ නිල වෙබ් අඩවියේ සාමාන්‍ය නඩත්තු කටයුතු

V. මෘදුකාංග ආශ්‍රිත සේවාවන් සැපයීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

වර්ෂය	2016	2017	2018	2019	2020
පුද්ගල විකිරණමිතික සේවාව (PMS)	1.68	2.86	5.66	12.10	13.67
ද්විතීයික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකන සේවාව (SSDL)	0.21	0.21	1.04	0.92	0.73
න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවා (NIL)	0.00	0.04	0.07	2.98	0.20
විකිරණ අධීක්ෂණ සේවා (RMS)	0.06	0.18	0.06	0.13	0.07
න්‍යෂ්ටික සුරක්ෂිතතා සේවා (NS)	0.12	0.14	0.06	0.00	0.36
Total (Rs. Mn.)	**2.08**	**3.43**	**6.89**	**16.13**	**15.03**

වගුව 2:සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශයේ වාර්ෂික ආදායම



12 රූපය: සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශයේ වාර්ෂික ආදායම

4.5 කර්මාන්ත යෙදවුම් අංශය

4.5.1 සමස්ථානික ජල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම්

4.5.1.1 මල්වතු ඔය ද්‍රෝණියේ සහ පහළ මහවැලි ද්‍රෝණියේ භූගත ජල පරීක්ෂණ

මෙම අධ්‍යයනය අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මඟින් එහි තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ සිදු කරන ලදී (SRL7006- ජාතික තාක්ෂණික සහයෝගිතා). භූගත ජලයේ ස්වාභාවික දූෂකකාරක හඳුනාගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් මල්වතු ඔය ද්‍රෝණියේ සහ පහළ මහවැලි ද්‍රෝණියේ තෝරාගත් පානීය ජල මූලාශ්‍ර පිලිබඳව අවධානය යොමු කරන ලදී.

2020 වර්ෂය තුලදී ඉහත ගංගා ද්‍රෝණි දෙකෙහිම ක්ෂේත්‍ර චාරිකා දෙක බැගින් සාර්ථකව නිම කරන ලදී. මෙහිදී රැස් කරන ලද ජල නියැදි ශ්‍රී.ල.ප.බ.ම-සමස්ථානික ජල විද්‍යා අංශයෙහි විද්‍යාගාර තුලදී රසායනික පරාමිතීන් සහ සමස්ථානික සඳහා විශ්ලේෂණය කරන ලදී. එම සාම්පල කට්ටලයම වැඩිදුර

පර්යේෂණ සඳහා චීනයේ Chinese Academy of Sciences (CAS) වෙත යැවීමට ද සූදානම් කෙරුණි. මෙම දත්ත CAS හි ආචාර්ය උපාධිය හදාරමින් සිටින සමස්ථානික ජල විද්‍යා අංශයේ විද්‍යාත්මක නිලධාරිනියක විසින් විශ්ලේෂණය කර ඇගයීමට ලක්කරනු ලබන අතර 2021 වසරේදී ව්‍යාපෘතිය අවසන් වනවිට අදාළ ව්‍යාපෘති වාර්තාව සහ සොයාගැනීම පිලිබඳ ජාත්‍යන්තර විද්‍යා සඟරා ප්‍රකාශනයක් නිකුත් කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියට අදාලව 2020 දී අන්ත¾ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මඟින් ජලයේ ඩියුටීරියම් (2-H) සහ 18-O විශ්ලේෂණය සඳහා ජල සමස්ථානික විශ්ලේෂකයක්, ට්‍රිටියම් (3-H) විශ්ලේෂණය සඳහා විශ්ලේෂකයක් සහ ජලයේ ට්‍රිටියම් සාන්ද්‍රණය වැඩි කිරීම සඳහා සම්පූර්ණ නියැදි සැකසුම් පද්ධතියක් සහ විද්‍යාගාර/ක්ෂේත්‍ර උපකරණ රාශියක් ප්‍රදානය කරන ලදී. ඉන්දියාවේ Noki Technology හි තාක්ෂණික විශේෂඥයෙකු 2020 දී , ට්‍රිටියම් විශ්ලේෂක යන්ත්‍රය ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පැමිණෙන ලදී.

4.5.2 සමස්ථානික සහ රසායනික ක්‍රම භාවිත කරමින් ශ්‍රී ලංකාවේ බටහිර ප්‍රදේශයේ කොළඹ සිට මීගමුව දක්වා නොගැඹුරු වෙරළ ජලධර පද්ධතිය දූෂණය වීමට ඇති අවදානම තක්සේරු කිරීම

බස්නාහිර වෙරළබඩ කලාපයේ කොළඹ සිට මීගමුව දක්වා නොගැඹුරු භූගත ජලධරය, ප්‍රදේශයේ ජනගහනයෙන් 90% කට වැඩි පිරිසක් අතීතයේ සිට මේ දක්වා පානීය, ගෘහාශ්‍රිත සහ වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කරති. මෙම ජලධර පද්ධතිය, පිරිසිදු ජල මූලාශ්‍රවලින් හටගන්නා එකක් වන බැවින් ද අගනුවර ට සමීපව පවතින බැවින් ද එය රටේ සංවර්ධනයට බෙහෙවින් වැදගත් වන බව හොඳින්ම පැහැදිලි වේ. තවද කොළඹ සිට මීගමුව දක්වා තිරයේ විවිධ නිෂ්පාදන සිදු කෙරෙන ක¾මාන්ත කලාප කිහිපයක් ද පිහිටා ඇත. 2020 වර්ෂයේදී ජල සම්පත් මණ්ඩලය සමඟ එක්ව ප්‍රදේශයේ ජල මූලාශ්‍ර පිලිබඳව අධ්‍යයනය ආරම්භ කරන ලද අතර මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ ජලධර පද්ධතියේ ඇති ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වන ජල දූෂණය පිළිබඳ අවබෝධ කර ගැනීම වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් , භූගත ජලය නැවත ආරෝපණය වීමේ යාන්ත්‍රනය , සම්භවය, භූගත ජලයේ වයස, මතුපිට ජලය සහ භූගත ජලය අතර අන්තර් ක්‍රියා, මුහුදු ජලය භූගත ජලය සමග මිශ්‍ර වීම සහ ජලයේ ගුණාත්මකභාවය පිලිබඳව, සමස්ථානික සහ රසායනික ක්‍රම භාවිතා කරමින් විශ්ලේෂණ කෙරේ.

එක් ක්ෂේත්‍ර චාරිකාවක් 2020 වර්ෂයේදී අවසන් කරන ලද අතර ඊට අදාල නියැදි විශ්ලේෂණ කටයුතුද නිම කරන ලදී. තවද ජල සම්පත් මණ්ඩලය සමඟ මේ පිලිබඳව සාකච්ඡා/රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

4.5.3 කලා ඔය ද්‍රෝණියේ වාරිමාර්ග කටයුතු සඳහා භූගත ජල විභවය පිලිබඳ අධ්‍යයනය

තිරසාර සංවර්ධනයට ජල සම්පත් කළමනාකරණය කිරීම උදෙසා කලාඔය ද්‍රෝණියේ වාරිමාර්ග කටුතු වෙනුවෙන් භූ ජල සම්පත තක්සේරු කිරීම අරමුණුකොට IAEA හි සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස 2018 සිට 2021 දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ රැස් කරන ලද ක්ෂේත්‍ර ජල නියැදි, 2020

වසරේදී සමස්ථානික සහ රසායනික පරාමිතීන් සඳහා විශ්ලේෂණය කරන ලද අතර මෙම දත්ත ඇගයීමෙන් පසු අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත. 2020 වසරේදී අදාළ පාර්ශවයන් සමඟ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

4.5.4 ශ්‍රී ලංකාව පුරා වර්ෂා ජලයේ සමස්ථානික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.

සමස්ථානික තාක්ෂනය මුල්කොටගත් ඕනෑම, ජල විද්‍යාත්මක, පාරිසරික සහ දේශගුණ අධ්‍යයනයක් සඳහා මූලික තොරතුරු ලෙස රට පුරා වර්ෂා ජලයේ සමස්ථානිකවල අවකාශීය සහ කාලීන විචලනයන් පිලිබඳව දත්ත තබාගැනීම අත්‍යාවශය වේ.

එබැවින් ශ්‍රී ලංකාවේ විවිධ භූගෝලීය ස්ථානවල වැසි ජලය එක්රැස් කිරීම වැදගත් වේ. මෙම සමීක්ෂණයේ පළමු අදියරය ලෙස 2012 සිට 2015 දක්වා කාලය තුළ උතුරු-මැද, නැගෙනහිර, මධ්‍යම සහ වයඹ පළාත්වල ඇතැම් ප්‍රදේශවල වර්ෂා ජලය මාසිකව එක්රැස් කිරීම අවසන් කරන ලදී. 2018 වසරේ දී, ඉහත සමීක්ෂණයේ 2 වන අදියරය ලෙස දකුණු, ඌව, සබරගමුව, බස්නාහිර සහ නැගෙනහිර සහ වයඹ පළාත්වල ඇතැම් ප්‍රදේශවල මාසික වර්ෂා නියැදි රැස්කිරීම ආරම්භ කරන ලදී.

වර්ෂ තුනක පමණ කාලයක සිට මාසික වර්ෂා නියැදි එකතු කිරීම සඳහා ඉහත පළාත්වල ස්ථාන 20 ක තාවකාලිකව ස්ථාපිත කරන ලද අතර වර් ෂා නියැදි එකතුකිරීමේ අටවුම් 2020 වසර අවසන් වන විට ඉවත් කරන ලදී එමෙන්ම රැස්කර තිබූ සියළු වර්ෂා නියැදි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත රැගෙන එනලදී. මෙම රැස්කළ වර්ෂා නියැදි වල කොටසක විශ්ලේෂණ කටයුතු 2020 වසර තුලදී නිමකරන ලදී.

එසේම, අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය විසින් මෙහෙයවන Global Network of Isotopes in Precipitation (GNIP) වැඩසටහන සඳහා සමස්ථානික ජල විද්‍යා අංශය මගින් කොළඹ, කටුගස්තොට සහ යාපනය යන ස්ථාන වල වර්ෂා ජල රැස්කිරීමේ උපකරණ ස්ථිර ලෙස ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය 2008 වසරේ සිට සම්බන්ධ වී ඇති මෙම වැඩසටහනට යටතේ වාර්ෂිකව අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය වෙත වැසි ජල සාම්පල යවනු ලැබේ. ජල විද්‍යාව, පරිසර විද්‍යාව සහ දේශගුණ විද්‍යාව පිළිබඳ කලාපීය සහ දේශීය අධ්‍යයනයන් සඳහා අවශ්‍ය වන දත්ත අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සියෙහි GINP දත්ත පදනමෙන් ලබාගත හැකිය. 2020 වසර සඳහා ද මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වය ලබාදෙන ලදී.

4.5.5. සමස්ථානික පරිසර විද්‍යා වැඩසටහන

ස්ථායී සමස්ථානික, ජීව විද්‍යාත්මක පද්ධතිවල තොරතුරු අනාවරණය සඳහා භාවිතා වේ. ජීවී පද්ධතිවල සිදුවන ක්‍රියාවලීන් සහ කාලයත් සමඟ එම පද්ධති වල වන වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා ස්ථායී සමස්ථානික යොදාගැනේ. මෙම ස්ථායී සමස්ථානික අධ්‍යයනයන් තුලින් ලබා ගන්නා තොරතුරු වඩා නිරවද්‍ය වීමත් වෙනත් ක්‍රම සමඟ එක්ව යොදා ගැනීමේ හැකියාවත් නිසා වර්තමානය වන විට පාරිසරික පර්යේෂණ සඳහා බහුලව යොදා ගනී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ‘‘ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සමස්ථානික විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් සීමිත ජල සම්පාදන තත්ත්වයන් යටතේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම’’ යන ව්‍යාපෘතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සමස්ථානික පරිසර විද්‍යා වැඩසටහනක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022-2023 වසර සඳහා ජාත්‍යන්තර පරමාණුක

බලශක්ති නියෝජිතායතනයේ ආසියා පැසිෆික් කලාපීය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියක් ලෙස මේ වන විට සංවර්ධනය වෙමින් පවතී.

<u>ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සමස්ථානික විශ්ලේෂණ ක්‍රම භාවිතා කරමින් සීමිත ජල සම්පාදන තත්ත්වයන් යටතේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම</u>

නිසියාකාරව ජල කළමනාකරණය සිදු නොකිරීම සහ දේශගුණික විපර්යාස, ගෝලීය ජල සම්පත ක්ෂයවීම සඳහා සෘජුවම බලපායි.

ලෝකයේ බොහෝ ප්‍රදේශවල මිරිදිය භාවිතය සැලකීමේදී 70% ක් පමණ වන ප්‍රමාණයක් දැක්වෙන්නේ වාරිමාර්ග සහ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් සිදු කරන පරිභෝජන ලෙසයි. කෘෂික ර්මාන්තයේ දී භූගත ජලය භාවිතයේ ලොව පුරාම වර්ධනය ක්‍රමයෙන් වැඩි වන අතර කෘෂිකර්මාන්තයේදී ජල පරිහරණයේ කාර්යක්ෂමතාව 50% ට වඩා අඩු මට්ටමක පවතී. බෝග ජල ඵලදායිතාව වැඩි කිරීම මගින් කෘෂිකාර්මික ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. ජල පරිභෝජන ඒකකයකට බෝගයේ ඵලදායිතාව ඉහල නැංවීම මෙමඟින් අදහස් කෙරේ.

වාෂ්පීකරණය හේතුවෙන් කෘෂිකර්මික පද්ධතිවල පාංශු ජලය ඉවත්වීම බෝග ජල ඵලදායිතාවයට අහිතකර ලෙස බලපායි. ජලයේ සහ ජල වාෂ්පවල ස්ථායී සමස්ථානික වන ^{18}O සහ ^{2}H වල සංයුති භාවිතය සහ අනෙකුත් ආශ්‍රිත ශිල්පීය ක්‍රම මගින් විද්‍යාඥයින්ට සෘජු පාංශු වාෂ්පීකරණය හා ශාකයෙන් පිටවීම හරහා සිදුවන ජල හානිය අතර වෙනස හඳුනා ගැනීමට හැකි වේ.

ස්ථායී සමස්ථානික අධ්‍යයනයන් තුලින් ලබා ගන්නා දැනුම, පාංශු ජල මිනුම් දත්ත හා දුරස්ථ සංවේද මගින් ලබා ගන්නා තොරතුරු සමග සසඳා වඩා සාර්ථක පාංශු හා ජල සංරක්ෂණ කළමනාකරණ පිළිවෙත් සඳහා යොමු විය හැකිය.

න්‍යෂ්ටික, සමස්ථානික සහ ඒ ආශ්‍රිත ශිල්පීය ක්‍රම භාවිතයෙන් පාංශු ජල ප්‍රමාණය නිරවද්‍යව මැනීම මඟින් ලබා ගත හැකි ප්‍රතිලාභ වන්නේ බෝග සඳහා ප්‍රශස්ත වාරි කාලසටහන් ස්ථාපිත කිරීම, ජල සම්පත් නිසියාකාරව කළමනාකරණය කරගැනීම, ගොවිපල පිරිවැය අඩු කරගැනීම සහ පාංශු පෝෂක රැක ගැනීම ආදියයි.

බෝගයකට අවශ්‍යවන වන ජල ප්‍රමාණය සහ පසෙහි පවතින ජල ප්‍රමාණය පිළිබඳව නිවැරදි තොරතුරු ද මෙම ක්‍රමවේද මඟින් ලබා දිය හැක. අවසානයේ පාලනය කල ජල සම්පාදන තත්ත්ව යටතේ බෝග ඔරොත්තු දීමේ හැකියාව හා ඵලදායිතාව වැඩි විම සිදු කරගත හැක.

යෝජිත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තෝරාගත් භෝගවල ජල පරිහරණ කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සඳහා දුරස්ථ සංවේදක චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් ජල ඵලදායිතාව සිතියම්ගත කිරීම ඇතුළුව න්‍යෂ්ටික, සමස්ථානික සහ ඒ ආශ්‍රිත ශිල්පීය ක්‍රම භාවිතා කරමින් ජලය සීමා කිරීමේ/පාලනය කිරීමේ තත්ඛයන් යටතේ බෝග ජල ඵලදායිතාව වැඩිදියුණු කිරීමට දායක වීමයි.

මෙම ව්‍යාපෘති සැලසුම අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය සමග එක්ව 2020 වසර තුලදී නිම කරන ලදී. සැලසුම් කරන ලද පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ 2022 වසර මුල වන අතර ඊට අදාල හරිතාගාර පහසුකම් හා වෙනත් පහසුකම් ප්‍රසම්පාදනය සහ සපයා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු 2020 වසර තුල සිදු කරන ලදී.

4.5.6 රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සිදු කරන ලද පර්යේෂණ

"සමස්ථානික ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ බෝතල් කළ / ඇසුරුම් කළ ජලයේ මූලාරම්භය සොයා ගැනීම" පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂණයකට අවශ්‍ය මාර්ගෝපදේශ සහ වෙනත් යටිතල පහසුකම් සැපයූ අතර එම ව්‍යාපෘතිය 2020 වසරේදී සාර්ථකව නිම කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ නාෂ්ටික විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යාවක විසින් මෙම අධ්‍යයනය සිදු කරන ලද අතර ඇය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි විද්‍යාත්මක නිලධාරිනියෙකි.

භූගත ජලයේ ඇති ස්වාභාවික අපවිත්‍රකම් අවබෝධ කර ගැනීම සඳහා පහළ මහවැලි ද්‍රෝණියේ මැදිරිගිරිය ප්‍රදේශය අවට භූගත ජලය තක්සේරු කිරීම පිළිබඳව 2020 දී උපාධි අපේක්ෂක පර්යේෂණයක් සිදු කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් කිහිප දෙනෙකුට ඔවුන්ගේ කාර්මික පුහුණු අවශ්‍යතා යටතේ සමස්ථානික ජල විද්‍යාව පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

4.5.7 2020 වසරේ පර්යේෂණ ප්‍රකාශන

ජාත්‍යන්තර සම-සමාලෝචනය (Peer Reviewed) කරන ලද සඟරාවල පර්යේෂණ ප්‍රකාශන දෙකක් සිදු කරන ලදී.

i. Senarathne, S., Jayawardana, J. M. C. K., Edirisinghe, E. A. N. V., &Chandrajith, R. (2021). Geochemical and isotope evidence for groundwater mineralization in a semi-arid river basin, Sri Lanka. *Applied Geochemistry*, *124*, 104799.

ii. Edirisinghe, E. A. N. V., Karunarathne, G. R. R., Tilakarathna, I. A. N. D. P., Gunasekara, J. D. C., &Priyadarshanee, K. S. G. S. (2020). Isotope and chemical assessment of natural water in the Jaffna Peninsula in northern Sri Lanka for groundwater development aspects. *Isotopes in Environmental and Health Studies*, *56*(3), 205-219.

4.5.8 පාසල් සඳහා නාෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය හඳුන්වාදීමේ වැඩසටහන

විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ගණිතය (STIM) විෂය ක්ෂේත්‍රයන්හි දියුණුව රටක තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ. නාෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය (NST) යනු STEM හි අංගයකි. රටක නාෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය භාවිතයන් අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වාදීම තුලින් අනාගත මානව සම්පත් අවශ්‍යතාවයට නිසි ප්‍රතිචාර දැක්වීමට හේතු වනු ඇත.

එබැවින් මීළඟ පරම්පරාවේ විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් ගොඩනැංවීම සඳහා නාෂ්ටික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සිසුන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, 2016 වසරේ ආරම්භ කරන ලද පාසල් සඳහා නාෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය හඳුන්වාදීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාව සමඟ තව දුරටත් ඉදිරියට සිදු කරගෙන යාමට තීරණය කර ඇති අතර, ඇති අතර තෘතියික අධ්‍යාපනික මට්ටම තෙක් වැඩසටහන පුළුල් කිරීමට අදාල කටයුතු සිදු වේ.

<u>4.5.8.1 ද්විතීයික පාසල් සිසුන් සඳහා නාෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ස්වයං අධ්‍යන පාඨමාලාව</u>

මෙම පාඨමාලාව මාර්ගගත සහ මාර්ගගත නොවන ආකාරයෙන් අධ්‍යනය කල හැකි ස්වයං අධ්‍යාපන පැකේජයක් ලෙස සංවර්ධනය වෙමින් පවතී. මෙය අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සංකල්පයක් අනුව ආරම්භ කරන ලදී.

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ මනා පුහුණුවක් ලැබූ ගුරුවරුන් පිරිසක් විසින් මෙහි අන්තර්ගතයන් මූලිකව සංවර්ධනය කිරන ලදී. මේ සඳහා සේවා සපයන ආයතය වන්නේ සවී පබ්ලිකේෂන් ආයතනයයි. සවී පබ්ලිකේෂන් ආයතනය සහ SLAEB විසින් ස්වයං-අධ්‍යාපන පැකේජ ආකෘතියට ගැලපෙන පරිදි අදාල අන්තර්ගතය තවදුරටත් සංවර්ධනය කරන ලදී. මෙම ස්වයං අධ්‍යන පාඨමාලාවේ සිංහල අනුවාදය Moodle මෘදුකාංගය ඔස්සේ සංවර්ධනය කරන ලද අතර කිහිප වතාවක් සංශෝධනය කරන ලදී. පසුව කොවිඩ් 19 සීමා කිරීම් මධ්‍යයේ හඬකැවීම් කටයුතු සිදු කෙරුණි. මෙහි සිංහල අනුවාදය පරිච්ඡේද පහකින් Moodle මෘදුකාංගය යොදා ගෙන අවසන් කර ඇති අතර සෑම පරිච්ඡේදයකම පාඨමාලා අන්තර්ගතය, ප්‍රශ්නාවලිය සහ සිසුන්ගේ උනන්දුව වැඩි කිරීම සඳහා ඇතුළත් කර ඇති සරල ක්‍රීඩාව ඇතුළත් වේ.

මෙය පරිච්ඡේද පහකින් සමන්විත වන අතර ඒවා සංවාද, ඉදිරිපත් කිරීම්, කතාන්දරය, කාටූන් සහ කරුණු දැක්වීම් ලෙස විවිධ ආකෘති පහකින් සමන්විත වේ. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියට ඔවුන්ගේ තෝරාගත් වීඩියෝ පට මෙම පාඨමාලාවට ඇතුළත් කිරීමට අවසර ලබා දී ඇත. මෙය න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම ද්විතීයික පාසල් ශිෂ්‍යයෙකු සඳහා හැදෑරීමේ අවස්ථාව සැලසෙන පාඨමාලාවක් ලෙස හඳුන්වා දීමට කටයුතු කරනු ලබයි. මෙම ස්වයං ඉගෙනුම් විද්‍යුත් මොඩියුලය විද්‍යා විෂය සඳහා විෂය බාහිර ක්‍රියාකාරකමක් ලෙස හඳුන්වා දීමට නියමිතය. මොඩියුලය සාර්ථකව නිම කළ සිසුන් සඳහා සහතිකයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.අන්තර්ගතයේ ඉංග්‍රීසි සහ දෙමළ පරිවර්තන අවසන් කර ඇති අතර එය ලබන වසර තුළ සම්පූර්ණ කර අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

.

4.5.8.2 අන්තර් ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය (IAEA) මගින් අධ්‍යාපන කටයුතු සිදුකිරීම සඳහා විකිරණ මිනුම් උපකරණ පරිත්‍යාග කිරීම

"න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ද්විතීයික සිසුන් සහ විද්‍යා ගුරුවරුන් දැනුවත් කිරීම" මත RAS0079 අංක දරන ශ්‍රී ලංකා අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය කලාපීය ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් යටතේ, ශ්‍රී ලංකා අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය විසින් ශ්‍රී ලංකාව සඳහා පහත සඳහන් උපකරණ පරිත්‍යාග කිරීමට කටයුතු යොදා ඇත.

ගුරුවරුන් සහ සිසුන් සඳහා අත්දැකීම් ලබා දීම විකිරණ අධ්‍යාපනයේ ප්‍රධාන අංගයකි. අපගේ සංවේදක ඉන්ද්‍රියයන් හරහා විකිරණ හඳුනාගත නොහැකි බැවින්, විකිරණ පිළිබඳව ඉගෙනීම සඳහා නිශ්චිත උපකරණ තිබීම අනිවාර්ය වේ. උපකරණ ලැබුණු පසු සිසුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා ඒවා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මුදලින් රු.4,922,623.00 ක පිරිවැයක් සහිත මෙම පරිත්‍යාගය RAS0079 ව්‍යාපෘතියේ තාක්ෂණික සහයෝගීතාවය යටතේ සිදු වේ. ලැබීමට නියමිත උපකරණ ලැයිස්තුව පහත දැක්වේ.

I. මූලික විකිරණ මාපක (Basic Radiation Monitors) – 12
II. විකිරණ පරීක්ෂණ කට්ටල (Radiation Experiment Kits) – 24
III. විකිරණ මාන (Survey Meters) – 12
IV. වියලි අයිස් යොදා ගන්නා වළා කුටීර (Dry Ice Cooled Cloud Chamber) - 12
V. විද්‍යුත් වළා කුටීර (Peltier Cooling (Electronic) Cloud Chamber) - 12

4.5.8.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ (MOE) විද්‍යා ශාඛාව සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම

MOE හි විද්‍යා ශාඛාව සමඟ න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ අධ්‍යාපන සහ ප්‍රවේශ වැඩසටහන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. විද්‍යා ශාඛාවේ අධ්‍යක්ෂ හා විද්‍යා ශාඛාවේ කාර්ය

මණ්ඩලය, SLAEB හි සභාපති, අධ්‍යක්ෂක ජනරාල් ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් 2020 සැප්තැම්බර් 16 වන දින අධ්‍යාපන අමාත්‍යාංශයේ රැස්වීමක් පැවැත්විණි. රැස්වීමේදී පසුගිය වසරවල ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය සාරාංශ කර ඉදිරි කටයුතු සඳහා සැලසුම් කරන ලදී.



13 රූපය – **අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති රැස්වීම**

4.5.8.4 වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන්

	වැඩසටහන් ආකාරය	වැඩසටහන	**දිනය**	සහභාගීත්වය
01	වැඩමුළු	කිරිබත්ගොඩ විහාරමහා දේවි විද්‍යාලය -පදාර්ථ හා විකිරණ	26.02.2020	300
02	වැඩමුළු	සමස්ථානික නිෂ්පාදනය හා භාවිතා	02.01.2020	50
03	විද්‍යාගාර චාරිකා	Institute of Chemistry ආයතනයේ සිසුන්	28.01.2020	50



14 රූපය – විද්‍යාගාර චාරිකාවේ අවස්ථාවක්

5. ජාත්‍යන්තර සහයෝගිතා අංශය

5.1 TC හරහා IAEA සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර ආයතන

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) ජාතික සම්බන්ධීකරණ කාර්යාලය ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ (SLAEB) ජාත්‍යන්තර සහයෝගිතා අංශය (ICD) ප්‍රධාන වශයෙන් එහි තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා IAEA සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. රටේ සමාජ ආර්ථික සංවර්ධනය කරා යොමු වන න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය දියුණු කිරීම සඳහා සහයෝගිතා (TC) වැඩසටහන සහ ද්විපාර්ශ්වික ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එය IAEA සාමාජික රටවල් සමඟ ගනුදෙනු කරයි.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ නියමයන්ට අනුකූලව IAEA පිළිගැනීම ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්යභාරය මෙම අංශය ඵලදායි ලෙස ඉටු කර ඇත. එනම් රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය ආශ්‍රිත යෙදුම් වැඩිදියුණු කිරීම සඳහා IAEA වෙතින් ලැබෙන සැලකිය යුතු ආධාර සහ විශේෂඥ උපදේශණ සේවා ලබා ගැනීම.

IAEA සිය සාමාජික රටවලට තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති යටතේ සාමාජිකත්ව, විද්‍යාත්මක චාරිකා, පුහුණු පාඨමාලා, න්‍යෂ්ටික ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරන විශේෂඥ මෙහෙයුමක් සහ ව්‍යාපෘතිවල සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය උපකරණ වැනි තාක්ෂණික සහාය ලබා දෙයි. අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය TC හරහා රටට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙම ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම ජාත්‍යන්තර සහයෝගිතා අංශයට පවරා ඇත. පහත සඳහන් භූගෝලීය පදනම අනුව ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති හරහා එවැනි තාක්ෂණික සහය ලැබේ.

- ජාතික තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (TC ව්‍යාපෘති).
- කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (ගිවිසුම්/ ගිවිසුම් නොවන ව්‍යාපෘති).
- අන්තර් කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති.

<u>වෙනත් ව්‍යාපෘති සහ වැඩසටහන්</u>

- පර්යේෂණ කොන්ත්‍රාත් වැඩසටහන (සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති - CRP).

    - න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් ව්‍යාපෘතිය (ලං.වි.ම සහයෝගීතාවයෙන්).
    - න්‍යෂ්ටික දැනුම කළමනාකරණ ක්‍රියාකාරකම්.
        - ක්‍රියාකාරකම් දින වැඩසටහන (න්‍යෂ්ටික දැනුම බෙදා හැරීම සහ ප්‍රාදේශීය ධාරිතාව ශක්තිමත් කිරීම).
        - LMS (ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය) සංවර්ධනය.
        - IoT (Internet of Things) ආදී වශයෙන් වෙයි.

මෙම අංශය න්‍යෂ්ටික තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා පහත සඳහන් අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය කරයි.

- ආසියා - පැසිපික් කලාපීය සහයෝගිතා සංවිධානය (RCARO).
- අධ්‍යාපන ක්‍රීඩා, සංස්කෘතික විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MEXT) ජපානය.
- ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JAICA).
- කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA).
- සෛද්ධාන්තික (Theoretical) භෞතික විද්‍යාව සඳහා වූ අන්තර්ජාතික මධ්‍යස්ථානය (ICTP) ට්‍රියස්ටේ, ඉතාලිය.

2020 වර්ෂය තුළ, IAEA හි අනෙකුත් කලාපීය සහ අන්තර් කලාපීය ව්‍යාපෘතිවලට සම්බන්ධ වෙමින් පහත සඳහන් ජාතික TC ව්‍යාපෘති දහතුනක් (13ක්) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, ශ්‍රී ලාංකේය විද්‍යාඥයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා අන්තර්ජාලය හරහා විශේෂඥ සහය කිහිපයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. විදේශීය පුහුණුවීම්, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ ආදියට සහභාගී වීමට අදාළ ජාතික ආයතනවල විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ පර්යේෂකයන් හට අවස්ථා අටක් (08) ලැබුණු අතර, IAEA හි කලාපීය සහ අන්තර් කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති යටතේ සංවිධානය කරන ලද එවැනි සිදුවීම් සඳහා ප්‍රායෝගිකව සහභාගී වීමට අපගේ විද්‍යාඥයින්ට අවස්ථා ද ලැබී ඇත.

ව්‍යාපෘතිවල සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදුකිරීමට අවශ්‍ය විවිධ වර්ගයේ වටිනා විද්‍යාත්මක උපකරණ මෙම ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන වෙත 2020 වසරේ දී ලැබී ඇත.

2020 දී ක්‍රියාත්මක වන ව්‍යාපෘති

	Project No	**Name of the Project**
1	SRL 5049	Supporting Control of Stomach Worm Infection in Goats
2	SRL5050	Supporting Genetic Improvement of Tea
3	SRL6037	Establishing a Medical Cyclotron Facility for the Production of Positron Emission Tomography Radiopharmaceuticals
5	SRL9011	Strengthening the Regulatory Infrastructure for the Control of Radiation Sources
6	SRL1009	Strengthening the National Centre for Non-Destructive Testing
7	SRL2010	Establishing a Roadmap for the Nuclear Power Programme
8	SRL5045	Establishing a National Centre for Nuclear Agriculture
9	SRL5046	Improving Livelihoods Through Dairy Cattle Production: Women Farmers' Empowerment
10	SRL5047	Establishing a National Centre for Research, Training and Services in Medical and Molecular Entomology for Vector-borne Disease Control
11	SRL5048	Strengthening National Capability for Food and Feed Safety
12	SRL6036	Establishing a Nuclear Medicine Unit (Radioimmunoassay Laboratory) at the Faculty of Medicine, University of Jaffna
13	SRL7006	Enhancing Water Resource Management

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සමඟ සාකච්ඡා කර රටේ ජාතික පාර්ශවකරුවන්ගේ ආයතන විසින් සකස් කරන ලද පහත සඳහන් ජාතික ව්‍යාපෘති යෝජනා අටක් (08) මීළඟ තාක්ෂණික සහයෝගිතා චක්‍රය 2022/23 සඳහා සලකා බැලීම සඳහා IAEA වෙත ඉදිරිපත් කරන ලදී. ඉදිරිපත්

කරන ලද සංකල්ප හත මූලික වශයෙන් IAEA විසින් සැලසුම් අදියර යටතේ වැඩිදුර සංවර්ධනය සඳහා පිළිගෙන ඇති අතර ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සංකල්ප අටෙන් ව්‍යාපෘති ගණනාවක් පිළිගැනීමට යටත්ව මෙම ව්‍යාපෘති හරහා තාක්ෂණික අනුග්‍රහය ලැබීමට නියමිතය. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2022 දී ආරම්භ කෙරේ.

2022/23 TC (චක්‍රය) සඳහා IAEA වෙත ඉදිරිපත් කරන ලද ජාතික ව්‍යාපෘති යෝජනා

අංකය	ව්‍යාපෘති මාතෘකාව	සම්බන්ධිත ආයතනය
1	පිළිකා රෝගී සත්කාර කළමනාකරණයේදී භාවිතා කරන අණුක රූපකරණ ශිල්පීය ක්‍රම සඳහා අවශ්‍ය රේඩියෝ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍ය සයික්ලොට්‍රෝන් පහසුකම ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම (අදියර II)	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සෞඛ්‍ය අමාත්‍යාංශය
2	ශ්‍රී ලංකාවේ රෝගීන් සහ සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා විකිරණ ආරක්ෂණ හැකියාවන් සහනික කිරීම මගින් ගුණාත්මක හා මුල් පිළිකා රෝග විනිශ්චය සහ විවිධ ප්‍රතිකාර ක්‍රම සඳහා සමාන ප්‍රවේශය වැඩි දියුණු කිරීම	ජාතික පිළිකා මර්දන වැඩසටහන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
3	විකිරණ සම්බන්ධ සායනික පරිචයන් සඳහා රෝගී ආරක්ෂණ වැඩසටහනක් ස්ථාපිත කිරීම.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB).
4	න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමේ ජාතික හැකියාවන් ශක්තිමත් කිරීම.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (AERC)
5	දේශගුණික කෘෂිකාර්මික භාවිතයන් හරහා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ධාරිතා ගොඩනැගීම.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
6	කාර්මික ඵලදායිතාව සඳහා උසස් විකිරණශීලී ක්‍රම සහ අනෙකුත් උසස් NDT ක්‍රම භාවිතය වැඩි කිරීම”.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය
7	ශ්‍රී ලංකාවේ භූදකලා පලතුරු සහ එළවළු නිෂ්පාදන ප්‍රදේශවල වඳ කෘමි තාක්ෂණය ඒකාබද්ධ කිරීම මගින් කොමඩු මැස්සන් (melon fly) ගහනය මර්දනය කිරීම.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
8	න්‍යෂ්ටික බල ව්‍යාපෘතිය සඳහා ජාතික මට්ටමෙන් යටිතල පහසුකම් දියුණු කිරීම.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

COVID-19 මත ලැබී ඇත ආධාර

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ, ශ්‍රී ලංකාවට IAEA වෙතින් PCR යන්ත්‍ර තුනක් (03) ලබා ගැනීමට හැකි වූ අතර, ඒවාට අදාළ අනෙකුත් ද්‍රව්‍ය සමඟ, මෙම යන්ත්‍ර කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සහ මහනුවර මහ රෝහලට බෙදා දෙන ලදී.

අසියා - පැසිපික් කලාපීය සහයෝගීතා සමුළුව (RCA)

RCA යනු IAEA හි අනුග්‍රහය යටතේ ආසියා සහ පැසිපික් කලාපය සඳහා වන අන්තර් රාජ්‍ය ගිවිසුමකි. ආසියා සහ පැසිපික් කලාපය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණයේ සාමකාමී යෙදීම් සඳහා පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන කලාපීය සමුපකාර ගිවිසුම (RCA) යනු දකුණු ආසියාවේ, අග්නිදිග ආසියාව, පැසිෆික් සහ ඈත පෙරදිග පිහිටා ඇති IAEA සාමාජික රටවල් අතර අන්තර් රාජ්‍ය ගිවිසුමකි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ RCA ව්‍යාපෘති සමාජ-ආර්ථික අවශ්‍යතා සපුරාලීමට සහ රටේ තිරසාර සංවර්ධනයට දායක වීමට න්‍යෂ්ටික තාක්ෂණයන් සපයයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ,

- කෘෂිකර්ම
- පරිසරය

- කර්මාන්තය
- මානව සෞඛ්‍ය සහ
- විකිරණ ආරක්ෂණය

ශ්‍රී ලංකාව දැනට ඉහත ක්ෂේත්‍රවල RCA ව්‍යාපෘති 14 කට සහභාගී වේ.

මෙම RCA ව්‍යාපෘති හරහා, ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ට COVID19 වසංගතය නොතකා IAEA විසින් සංවිධානය කරන ලද විවිධ ආකාරයේ රැස්වීම්, පුහුණුව, වැඩමුළු ආදියට අන්තර්ජාලය හරහා සහභාගී වීමට අවස්ථාව ලැබුණි. රට තුළ RCA ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපකරණ කිහිපයක් IAEA වෙතින් ඉල්ලා ඇති අතර ඒවා ලැබීමට නියමිතය.

ශ්‍රී ලංකාවේ මැදිහත්වීමෙන් පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධීකරණය(CRP).

2020 කාලය තුළ ශ්‍රී ලංකා විද්‍යාඥයින් සම්බන්ධ CRP ව්‍යාපෘති ලැයිස්තුව:

- D52038 - ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන සත්‍යාපනය කිරීමේදී සොයා ගැනීමේ පද්ධතියක් ලෙස ස්ථායී සමස්ථානික සහ බහු මූලද්‍රව්‍ය විශ්ලේෂණය භාවිතා කිරීම.
- D52040 - ශ්‍රී ලංකාව තුළ ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටිවල සත්‍යතාව, ආරක්ෂාව සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා වේගවත් පරීක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම.
- J02012 - පවතින රේඩියෝනියුක්ලයිඩ් හඳුනාගැනීමේ උපාංග (RIDs) හඳුනාගැනීමේ හැකියාවන් විමර්ශනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- F32007 - ගංගා සහ විල්වල නයිට්‍රජන් දූෂණය සහ Eutrophication සමස්ථානික අධ්‍යයනය කිරීම.
- J 02005 - භයානක බහාලුම්වල (Alarming Containers) විකිරණ හඳුනාගැනීමේ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- CRP K41016 - සමස්ථානික සහ න්‍යෂ්ටික මෙවලම් යෙදීමෙන් තෝරාගත් වෙරළබඩ ප්‍රදේශවල පරිසර දූෂණයේ තාවකාලික ප්‍රවණතා අධ්‍යයනය කිරීම.
- F23032 - "සංරක්ෂිත ද්‍රව්‍ය සහ සංස්කෘතික උරුම කෞතුක වස්තු සංරක්ෂණය කිරීම සඳහා විකිරණ ප්‍රතිකාර ක්‍රම සහ නව දුම්මල සූත්‍ර සංවර්ධනය කිරීම"
- K41015- "ශ්‍රී ලංකාවේ සමුද්‍ර පැලියෝ-චාර්තා වල දේශගුණික ප්‍රවණතා සහ විචල්‍යතා පිළිබඳ විකිරණ විශ්ලේෂණ හා සමස්ථානික අධ්‍යයනය"
- I12007 – “කුඩා හා මධ්‍ය පරිමාණ මාපාංකික ((Small & medium scaled) Small modular) ප්‍රතික්‍රියාකාරක (SMR) ව්‍යාපෘතිවල ආර්ථික තක්සේරුව: ක්‍රමවේද සහ යෙදුම්”

මානව සම්පත් සංවර්ධනය වැඩි දියුණු කිරීම මගින් කලාපීය ගැටළු විසඳීම සඳහා RCA වෙතින් ගිවිසුම් නොවන කලාපීය ව්‍යාපෘති සකස් කර ඇත. එම ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක විය; විකිරණ තාක්ෂණය භාවිතා කරන IAEA හි සාමාජික රටවල කර්මාන්ත, වෛද්‍ය සහ කෘෂිකර්ම යන ක්ෂේත්‍රවල විශිෂ්ටතා ඇති ආයතනවල පුහුණුවීම්, රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී වීමට දේශීය විද්‍යාඥයින්ට සහ අනෙකුත් නිලධාරීන්ට අවස්ථාව ලබා දීම සහ දෙවනුව විශේෂඥ සේවය සැපයීම සඳහා මානව සම්පත් සංවර්ධනය .

2020 වර්ෂය තුළ අන්තර් කලාපීය ව්‍යාපෘති තුනක් (03) ක්‍රියාවට නංවා ඇති අතර එක් කලාපයකට පමණක් නොව අනෙකුත් ප්‍රදේශවලට ද අදාළ පවතින ගැටලු විසඳීම සඳහා මෙවැනි ව්‍යාපෘති සංවර්ධනය කර ඇත.

ඉහත සඳහන් කළ ව්‍යාපෘති කාණ්ඩවල ක්‍රියාකාරකම් වලට අමතරව, IAEA විසින් න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරන එහි සාමාජික රටවලට නිලධාරීන්ට කලාපීය වශයෙන් පුහුණුවීම්, වැඩමුළුව, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණවලට සහභාගී වීමෙන් ජාත්‍යන්තර නිරාවරණය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙයි.

2020 වසර තුළ SLAEB හට පහත සඳහන් ආයතනවලින් මාර්ගගත ක්‍රමයට (virtual) පාදක දැනුම බෙදාගැනීමේ/පුහුණු අවස්ථා කිහිපයක් ලැබිණි. ජපානයේ අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MEXT), කොරියාවේ ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ දකුණු කොරියාවේ කලාපීය සමුපකාර ගිවිසුම් ප්‍රාදේශීය කාර්යාලය (RCARO) සහ ඉතාලියේ න්‍යායාත්මක භෞතික විද්‍යාව සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICTP) ආදිය. රටට ඉමහත් ප්‍රයෝජනවත් විය.

5.2 න්‍යෂ්ටික දැනුම කළමනාකරණය **(Nuclear Knowledge Management)**

දැනුම කළමනාකරණය මූලික කොටස් තුනකින් සමන්විත වේ: පුද්ගලයන්, ක්‍රියාවලි සහ තාක්ෂණය. දැනුම බෙදාගැනීම සහ භාවිතය උත්තේජනය කිරීම සහ පෝෂණය කිරීම සඳහා දැනුම කළමනාකරණය පුද්ගලයන් සහ ආයතනික සංස්කෘතිය කෙරෙහි අවධානය යොමු කරයි; දැනුම සොයා ගැනීමට, නිර්මාණය කිරීමට, ග්‍රහණය කර ගැනීමට සහ බෙදා ගැනීමට ක්‍රියාවලි හෝ ක්‍රම පිළිබඳව; සහ දැනුම ගබඩා කර තබා ගැනීමට සහ ප්‍රවේශ විය හැකි බවට පත් කිරීමට සහ මිනිසුන් එකට ස්ථානගත නොවුනත් එකට වැඩ කිරීමට ඉඩ සැලසීමට තාක්ෂණය මත. දැනුම කළමනාකරණය කිරීම මිනිසුන්ගේ දැනුම බෙදා ගැනීමට සහ නැවත භාවිතා කිරීමට ඇති කැමැත්ත මත රඳා පවතින බැවින් මිනිසුන් වඩාත් වැදගත් අංගයකි.

දැනුම කළමනාකරණ වැඩසටහන් සාමාන්‍යයෙන් ආයතනික අරමුණු සමඟ බැඳී ඇති අතර බෙදාගත් බුද්ධිය, වැඩිදියුණු කළ කාර්ය සාධනය, තරඟකාරී වාසි හෝ ඉහළ මට්ටමේ නවෝත්පාදන වැනි නිශ්චිත ප්‍රතිඵල අත්කර ගැනීමට අදහස් කෙරේ.

ජාත්‍යන්තර ඉසව්වලට සහභාගි වූ නිලධාරීන්ට තම දැනුම උනන්දුවක් දක්වන අනෙකුත් පිරිස් අතර බෙදා ගැනීමට හැකි වන පරිදි ක්‍රියාකාරකම් වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට අංශයට හැකි විය.

5.3 න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයනය සහ සැලසුම් වැඩසටහන - 2020

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සමඟ එක්ව විදුලිබල අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ "ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන සඳහා මාර්ගගත සිතියමක් ස්ථාපිත කිරීම" පිළිබඳ ව්‍යාපෘතිය දියත් කරන ලදී.

IAEA විසින් දේශපාලන, ආර්ථික, සමාජ විද්‍යාත්මක, තාක්ෂණික, පාරිසරික අධ්‍යයනය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය හා විශේෂඥ උපදේශ දැනටමත් ලබා දී ඇත.

මේ වන විට ශ්‍රී ලංකාව විදුලිය උත්පාදනය සඳහා සිය ජල සම්පත් උපරිමව යොදා ගෙන ඇති අතර, ඇති අතර රටේ විදුලි නිෂ්පාදනයෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයකට ළඟා වෙමින් විදුලිය නිෂ්පාදනය සඳහා ආනයනික පොසිල ඉන්ධන මත යැපීම සිදු වෙයි. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව 5-6% විදුලි ඉල්ලුම වැඩි වීම සහ රටේ අනාගත සංවර්ධන අපේක්ෂාවන් සමඟ, දිගුකාලීනව රටට තවත් බලශක්ති ප්‍රභවයන් අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ආනයනික පොසිල ඉන්ධන මත අධික ලෙස යැපීම වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා විකල්ප බලශක්ති සැපයුම් විකල්පයන් ගවේෂණය කිරීම

වේ. දේශගුණික විපර්යාස සඳහා විසඳුම් සෙවීමට සහ රටේ මෙන්ම කලාපයේ සමාජ-ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමේ විසඳුමක් ලෙස න්‍යෂ්ටික බලය වඩාත් වැදගත් වනු ඇත. ශ්‍රී ලංකාව දූපත් රාජ්‍යයක් බැවින් න්‍යෂ්ටික බලාගාර හඳුන්වාදීම සහ ඒවායේ පිහිටීම අසල්වැසි රටවල් අතර කලාපීය සහයෝගිතාවයේ එකඟතාව මත සිදු කල යුතුය.

තවද, ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා SLAEB පහත සඳහන් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විය.

- ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති සැලසුම් වැඩසටහන ඉදිරියට ගෙන යාම සඳහා සුදුසු ව්‍යක්තීයවේදීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් පිහිටුවීම.

- න්‍යෂ්ටික දැනුම දියුණුකිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කරමින් මහජන පිළිගැනීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම.

- න්‍යෂ්ටික බලශක්ති සැලසුම් ව්‍යාපෘතියට අදාළ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් ලබා දීමෙන් සහ ඉන්ජිනේරුවන්/විද්‍යාඥයින් සහ තාක්ෂණික පිරිස් අයත්වන පාර්ශ්වකාර ආයතනවලින් සුදුසු සහය ලබාගැනීම.

- ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන සැලැස්මට අනුව, න්‍යෂ්ටික බල සැලසුම් ව්‍යාපෘතිය පිළිබඳ යෝජනා ඉදිරියට ගෙන යාමට IAEA සහය හරහා ජාත්‍යන්තර සහයෝගිතාව ලබා ගන්න.

- න්‍යෂ්ටික විදුලිය උත්පාදනය සහ පුළුල් කිරීමේ සැලැස්ම.

- න්‍යෂ්ටික බලශක්ති ප්‍රභවයන් මත පදනම් වූ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය සන්නද්ධ කිරීම සහ ශක්තිමත් කිරීම.

SLAEB 2020 ජනවාරි මාසයේදී IAEA හි න්‍යෂ්ටික බලශක්ති දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකාව සඳහා ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචන (INIR) මෙහෙයුමක් නිල වශයෙන් ඉල්ලා සිටියේය. ඉන්පසුව, ස්වයං-ඇගයුම් වාර්තාව (SER) දැනටමත් IAEA වෙත 2020 මැයි මාසයේදී ඉදිරිපත් කර ඇති අතර IAEA දැනටමත් ශ්‍රී ලංකාව සඳහා අදියර 1 - INIR මෙහෙයුම අනුමත කර ඇත.

තවද, පූර්ව INIR මෙහෙයුම 2020 සැප්තැම්බර් 14 සිට 17 දක්වා සිදු කරන ලද අතර එය මාර්ගගත ක්‍රම ඔස්සේ සමාලෝචනය කරන ලදී.එම න්‍යෂ්ටික යටිතල පහසුකම් සංවර්ධන අංශය (NIDS, IAEA) විසින් IAEA විශේෂඥ සමාලෝචන අනුව සංශෝධිත ස්වයං-ඇගයුම් වාර්තාව ශ්‍රී ලංකාව වෙතින් ඉල්ලා සිටියේය. ඒ අනුව අවසාන සමාලෝචනය IAEA වෙත ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් හා ඉංජිනේරුවන් සමාලෝචන හා සංශෝධන ක්‍රියාවලියට සම්බන්ධ වීම සිදු විය. මීට අමතරව, IAEA විසින් වැඩමුළු කිහිපයක් පවත්වන ලද අතර ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයනය සහ සැලසුම් ව්‍යාපෘතියේ ප්‍රගතිය මාර්ගගත ක්‍රම ඔස්සේ සමාලෝචනය කරන ලදී.

2020 දී IAEA හි සහාය ඇතිව මාර්ගගත ක්‍රම ඔස්සේ පවත්වන ලද න්‍යෂ්ටික බල වැඩමුළු පිළිබඳ විස්තරය පහත දැක්වේ.

අංකය	වැඩසටහනේ නම	විශේෂඥයින්ගේ නම	රට	කාලය	සම්බන්ධීකරණය ආයතන/ය
1	පූර්ව INIR සහ ස්වයං ඇගයීම් වාර්තා සමාලෝචන වැඩමුළුව	ජෝස් බොස්ටෝස් මයා ෆ්‍රෙඩ්රික් බෝඩින් මයා	IAEA	14 -17 සැප්තැම්බර් 2020	CEB සහ SLAEB
		ජුලියෝ බාසිලෝ මයා	ස්පාඤ්ඤය (IAEA බාහිර විශේෂඥ)		

		කුන් මෝ නම් මයා	නිරීක්ෂක (IAEA)		
2	ශ්‍රී ලංකාව සඳහා වූ විස්තීරණ වාර්තාවේ සමාලෝචන ප්‍රතිඵල අධ්‍යයනය	මිල්කෝ කොවාචෙව් මයා ජෝස් බොස්ටෝස් මයා ෆ්‍රෙඩ්රික් බෝඩින් මයා කුන් මෝ නම් මයා	IAEA	13 නොවැම්බර් 2020	CEB සහ SLAEB
		ස්ටෙෆන් මෝටින් මයා	එක්සත් රාජධානිය (IAEA බාහිර විශේෂඥ)		

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සහ මෙහෙයුම් කමිටු රැස්වීම්

2019 මැයි 10 වන දින සිට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ "ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බල විකල්පය අධ්‍යයනය කිරීම සඳහා" ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර ශ්‍රී ලංකාවේ සන්දර්භය (Sri Lankan context) දැනට ක්‍රියාත්මක න්‍යෂ්ටික බලශක්ති යටිතල පහසුකම් සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක නියාමන සභාව ඇතුළු ආයතනවලින් සැදුම්ලත් ක්‍රියාකාරී කණ්ඩායම් 09 ක් පිහිටුවා ඇත. IAEA සන්ධිස්ථාන ප්‍රවේශ ක්‍රමවේදයට අනුව ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා 2020 වර්ෂයේදී ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වන ලදී.

	රැස්වීමේ නම	සහභාගී වන ආයතන	ස්ථානය	දිනය
1	ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම	CEB, AEB, AERC	ශ්‍රවණාගාරය, SLAEB	2020.01.08
2	ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම	CEB, AEB, AERC	ශ්‍රවණාගාරය, SLAEB	2020.03.10
3	ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම	CEB, AEB, AERC	ශ්‍රවණාගාරය, SLAEB	2020.08.13
4	"න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් ව්‍යාපෘතියේ ප්‍රගතිය" විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත පිළිගන්වන ලදී.	MoPE, CEB, AEB, AERC	ශ්‍රවණාගාරය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	2020.07.08
5	ක්‍රියාකාරී කණ්ඩායම් 09 විසින් ප්‍රගතිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී	MoPE, CEB, AEB, AERC	ශ්‍රවණාගාරය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	2020.09.19
6	"න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් ව්‍යාපෘතියේ ප්‍රගතිය" විදුලිබල අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත පිළිගන්වන ලදී.	MoPE, AEB	ශ්‍රවණාගාරය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	2020.09.16

6.0 පරිපාලන, මානව සම්පත් හා ප්‍රසම්පාදන අංශය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය රටේ සහ රජයේ යහපත උදෙසා පරිපාලනය කිරීමේ වගකීම පරිපාලන අංශය සතු වන අතර එය ස්ථාපිත කර ඇති පනතේ නීතියට සහ රජයේ අදාළ වෙනත් නීතිමය අවශ්‍යතා හා රෙගුලාසි වලට අනුකූල වේ. කාර්යාල හා කාර්යාල පද්ධතිවල කාර්යක්ෂමතා කළමනාකරණය, සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රසම්පාදනය මෙම අංශයේ විෂය පථයට අයත් ප්‍රධාන ක්ෂේත්‍ර වේ. වාර්ෂික පරිපාලන වාර්තා පිළියෙල කිරීම, මානව සම්පත් සංවර්ධනය, විද්‍යාත්මක නොවන උපකරණ හා ගොඩනැගිලි නඩත්තු කිරීම, සේවක යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කිරීම, ප්‍රාග්ධන අයවැය යාවත්කාලීන කිරීම් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම, නිශ්චිත ලේඛන, වාර්තා සකස් කිරීම සඳහා සහාය වීම මෙම අංශය විසින් වගකීම දරයි. ඉහළ බලධාරීන්, කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන පද්ධති ස්ථාපිත කිරීම, උපයෝගිතා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, උපයෝගිතා සේවා කළමනාකරණය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි විද්‍යාත්මක හා විද්‍යාත්මක නොවන අංශ විසින් ඉල්ලා සිටින වෙනත් උපකාරක සේවාවන් ලබා දීම වේ.

6.1. පරිපාලන, මානව සම්පත් හා ප්‍රසම්පාදන අංශය සේවක සංඛ්‍යාව

අධ්‍යක්ෂක	: 01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	: 01
පරිපාලන නිලධාරී	: 01
කළමනාකරණ සහකාර	: 12
විදුලි නඩත්තු ශිල්පී	: 01
රියදුරු	: 05
කාර්යාල සහායක	: 06
රියදුරු	: 05

6.2. 2020දෙසැම්බර් 31 දින වන විට SLAEB හි සමස්ත සේවක තොරතුරු:

තනතුර	වැටුප් කේතය	සේවා මට්ටම	**AEB** සඳහා අනුමත සේවක සංඛ්‍යාව			**SLGC** සඳහා අනුමත කාර්ය මණ්ඩලය			**NCNDT** සඳහා අනුමත කාර්ය මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව		
			අනුමත	පවතින	පුරප්පාඩු	අනුමත	පවතින	පුරප්පාඩු	අනුමත	පවතින	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල්	HM 2-3	4	1	1							
අධ්‍යක්ෂ - සාමාන්‍ය විද්‍යාත්මක අංශය	HM 1-3	4	1	1							
අධ්‍යක්ෂ - ජෛව විද්‍යාත්මක අංශය	HM 1-3	4	1	1							
අධ්‍යක්ෂ - කර්මාන්ත යෙදවුම් අංශය	HM 1-3	4	1	1							
අධ්‍යක්ෂ - නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය	HM 1-3	4							1	1	
අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය	HM 1-3	4				1		1			
අධ්‍යක්ෂ - ජාත්‍යන්තර සහයෝගිතා අංශය	HM 1-3	4	1	1							
අධ්‍යක්ෂ - පරිපාලන	HM 1-3	4	1	1							
අධ්‍යක්ෂ - මූල්‍ය	HM 1-3	4	1	1							
පිරියත මෙහෙයුම් කළමනාකරු	HM 1-1	4				1	**1**				
නියෝජ්‍ය අධ්‍යක්ෂ - කර්මාන්ත යෙදවුම් අංශය	AR 2	4	1		1						
නියෝජ්‍ය අධ්‍යක්ෂ – නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය	AR 2	4							1		1
නියෝජ්‍ය අධ්‍යක්ෂ- ජෛව විද්‍යාත්මක අංශය	AR 2	4	1	1							
නියෝජ්‍ය අධ්‍යක්ෂ – සාමාන්‍ය විද්‍යාත්මක අංශය	AR 2	4	1	1							
නියෝජ්‍ය අධ්‍යක්ෂ -ජෛව විද්‍යාත්මක අංශය	AR 2	4	1	1							
නියෝජ්‍ය අධ්‍යක්ෂ	AR 2	4	1		1						
ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී, විද්‍යාත්මක නිලධාරීන්	AR-1	4	20	20		6	6		16	16	
සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍ය හා සැපයුම්	MM 1-1	4	1	1							

සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණය	MM 1-1	4	1	1							
සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සහයෝගීතාව)	MM 1-1	4	1		1						
අභ්‍යන්තර විගණක	MM 1-1	4	1	1							
මණ්ඩල ලේකම් / නීති නිලධාරී	MM 1-1	4	1	1							

තනතුර	වැටුප් ක්‍රමය	සේවා මට්ටම	**AEB** සඳහා අනුමත සේවක සංඛ්‍යාව			**SLGC** සඳහා අනුමත කාර්ය මණ්ඩලය			**NCNDT** සඳහා අනුමත කාර්ය මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව		
			අනුමත	පවතින	පුරප්පාඩු	අනුමත	පවතින	පුරප්පාඩු	අනුමත	පවතින	පුරප්පාඩු
පරිපාලන නිලධාරී (පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ)	JM 1-2	3	1	1							
පරිපාලන නිලධාරී	JM 1-2	3				1	1				
මුදල් නිලධාරී	JM 1-2	3				1	1		1		1
අභ්‍යන්තර විගණන නිලධාරී	JM 1-2	3	1	1							
තාක්ෂණික නිලධාරී	JM 1-2	3	1	1							
අධ්‍යක්ෂ ජනරාල්ගේ පුද්ගලික සහකාර *	JM 1-1	3	1		1						
සභාපතිගේ ලේකම් *	JM 1-1	3	1		1						
පුස්තකාලයාධිපති සහ තොරතුරු නිලධාරී	MA 5-2	3	1	1							
තාක්ෂණික සහකාර	MA 2-2	2	12	9	3	6	6		11	9	2
පොත් තබන්නා	MA 2-2	2	1	1							
කළමනාකරණ සහකාර	MA 1-2	2	26	26		3	3		6	6	
විදුලි කාර්මික / නඩත්තු කාර්මික ශිල්පී	PL 3	1	1	1		4	4				

පරිගණක දෘඩාංග කාර්මික ශිල්පී	PL 3	1	1	1							
රියදුරන්	PL 3	1	5	5		4	3	1	1	1	
විද්‍යාගාර සහායක	PL 1	1	6	5	1	3	3		6	6	
කාර්යාල සහයක	PL 1	1	6	6		8	7	1	3	2	1
මුළු කාර්ය මණ්ඩලය			**101**	**92**	**9**	**38**	**35**	**3**	**46**	**41**	**5**

*** කොන්ත්‍රාත් පදනම**

අනුමත සම්පූර්ණ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව : 185
කාර්ය මණ්ඩලය 2020.12.31 දින : 168
පුරප්පාඩු 2020.12.31 දින : 17

සේවා මට්ටම:

ජ්‍යෙෂ්ඨ මට්ටම :4
තෘතියික මට්ටම :3
ද්විතීයික මට්ටම :2
ප්‍රාථමික මට්ටම :1

6.3 මාණ්ඩලික බඳවා ගැනීමේ ලැයිස්තුව - 2020

	නම	තනතුර	පත්වීම් දිනය
01	තිළිණි අමල්කා මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.11
02	ජී.ඩබ්ලිව්.සී. වමෝදි රන්දිකා මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.11
03	ජේ.කේ. කනකරත්න මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.11
04	එස් අරුලානන්දන් මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.11
05	පී.එම්.ආර්.එල්. පෙරේරා මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.11
06	එච්.ජී.අයි.එස්. විජේන්ද්‍ර මයා	තාක්ෂණික නිලධාරී	2020.05.11
07	එම්.බී.එම්. චතුරංග මයා	තාක්ෂණික නිලධාරී	2020.05.11
08	ජී.එස්.පී. ප්‍රනාන්දු මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.13
09	ඩී.එන් ලියනගේ මිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.13
10	අයි.ජී.එන්.පී. සේනානායක මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.13
11	ඒ.අයි.එච්.ඩබ්ලිව්. සුරේන්ද්‍ර මයා	විද්‍යාත්මක නිලධාරී	2020.05.13
12	එස්.ඒ.රාජපක්ෂ මිය	තාක්ෂණික සහකාර	2020.05.13
13	එස්.එම්.එන්.කේ. තිලකරත්න මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.19
14	එල්.කේ. චතුරංග මයා	තාක්ෂණික සහකාර	2020.05.20
15	අයි.එච්.ටී.පී. ගුණසිංහ මයා	තාක්ෂණික සහකාර	2020.06.08
16	ඩබ්ලිව්.එම්.ජී.එස්. විජේසූරියමෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.06.15
17	එස්.ඒ.සී. විමර්ශී මෙනෙවිය	තාක්ෂණික සහකාර	2020.06.22
18	ජේ.ඩී. මදනායක මෙනෙවිය	විද්‍යාත්මක නිලධාරී	2020.07.01
19	ජී.ආර්.එන්.එන්. වෛද්‍යරත්න මිය	විද්‍යාත්මක නිලධාරී	2020.07.06

6.4 මණ්ඩලයේ විශ්‍රාම ලැයිස්තුව -2020

	නම	තනතුර	විශ්‍රාම ගිය දිනය
1	ඒ.කේ .රත්නායක මිය	අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය	2020.11.18

6.5 මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමේ ලැයිස්තුව - 2020

	නම	තනතුර	ඉල්ලාඅස්වීමේදිනය
1	ලියනගේ ඩී.එන් මිය	විද්‍යාත්මක නිලධාරී	2020.05.27
2	එස්.ඒ.රාජපක්ෂ මිය	තාක්ෂණිකසහකාර	2020.10.29
3	එස්.ඒ.සී.විමර්ශී මෙනෙවිය	තාක්ෂණිකසහකාර	2020.06.23
4	අනීතා මුණසිං හමෙනෙවිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සහයෝගිතා අංශය)	2020.08.31
5	ජී.ඩිපෙරේරා මෙනෙවිය	කාර්යාල කාර්ය සහයක	2020.02.02

6.7 මානව සම්පත් සංවර්ධනය

කෙටිකාලීන දේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 දෙනෙකු සහභාගී විය.

මීට අමතරව කාර්යාල පද්ධතිය සහ සාමාන්‍ය පරිපාලනය, මූල්‍ය නියාමනය සහ ගිණුම්කරණ පද්ධතිය, මූලික ප්‍රසම්පාදනය සහ ස්ථාපිත ක්‍රියා පටිපාටිය පිළිබඳ කාර්ය මණ්ඩලයේ මූලික දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් කණ්ඩායම් පුහුණු වැඩසටහන් 04ක් සංවිධානය කරන ලදී.

ඉහත ක්‍රියාකාරකම් සඳහා මුළු වියදම රුපියල් 752,000.00 කි.

6.8. පුනරාවර්තන වියදම් වලින් ලබාගත් ප්‍රාග්ධන අයිතම සහ සේවා ප්‍රසම්පාදනය-

i) Industrial Application Division

No	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Fume Cupboards (02 No's)	IAD	4,837,592.16		
2	Laboratory Interior (F 02, F 03, F 25, F 25a, F 26)	IAD	8,354,124.00		✓
3	Consumables – Laboratory	IAD	481,844.38	✓	
4	Alkyde Resins	IAD	23,544.00	✓	
5	Vacuum Cleaner	IAD	17,928.00		✓
6	Photocopy Machine	IAD	210,600.00		✓
7	LWIA Repair	IAD	$7,611		✓
8	Cryogenic Container	IAD	140,200.00		✓
9	Water Heater	IAD	25,920.00		✓
10	Laboratory Jacks	IAD	76,800.00		✓
11	HD Stapler Machine	ICD	2,730.00	✓	
12	Laser Printer	ICD	25,250.00		✓

ii) General Scientific Division

No.	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	3D Printer	GSSD	228,000.00		✓
2	3D Printer Filament	GSSD	45,150.00	✓	
3	Barcode Scanner	GSSD	31,500.00		✓
4	BASCOM AVR Software	GSSD	€ 125.84		
5	Calibration	GSSD	29,910.00	✓	
6	Computer Accessories	GSSD	96,500.00	✓	
7	Computer Accessories	GSSD	48,650.00		✓
8	CsI	GSSD	$540	✓	
9	Development, Installation, Verification of Software for PMSL Management System	GSSD	680,000.00		✓
10	Digital Portable Thermometer	GSSD	24,000.00		✓
11	Dry Nitrogen	GSSD	72,385.44	✓	
12	Insurance – Freight / Ion Chamber	GSSD	$1,553.38		
13	Laboratory Interior (F 18)	GSSD	3,741,552.00		✓
14	Liquid Nitrogen	GSSD	73,007.74	✓	
15	Medical Surveillance – Radiation Workers	GSSD	1,257,766.00	✓	
16	Router	GSSD	5,750.00		✓
17	Silicon Photomultiflier	GSSD	76,588.74	✓	
18	TLD Envelopes	GSSD	30,000.00	✓	
19	Uniforms	GSSD	13,156.00	✓	
20	X Ray Tube	GSSD	£13414.00		✓

iii) Life ScienceDivision

No.	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Accomadation – Foreign Experts	LSD	32,760.00	✓	
2	Argon Gas	LSD	71,091.00	✓	
3	Consumables – Laboratory	LSD	1,426,157.17	✓	
4	Fume Cupboard (01 No)	LSD	2,875,253.76		✓
5	Gloves	LSD	2,376.00	✓	
6	Helium Gas	LSD	204,760.24	✓	
7	Helium Gas / Nitrogen Gas	LSD	221,537.00	✓	
8	Lab. Coats	LSD	57,800.00	✓	
9	Laboratory Interior (F 10, F 40)	LSD	5,724,216.00		✓
10	Laptop Computer	LSD	201,895.00		✓
11	Laser Printer	LSD	25,250.00		✓
12	Liquid Nitrogen	LSD	652,644.06	✓	
13	Printer Ribbon	LSD	2,106.00	✓	
14	Printing – Brouches / Leaflets	LSD	353,970.00	✓	
15	Safety Items	LSD	28,920.00	✓	

16	Vacuum Filteration Setup	LSD	50,000.00		✓

iv) Administration, Human Resources & Procurement Division

No	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Air Ticket	DG	50,650.00	✓	
2	400kVA Generator Service	Admin	113,400.00	✓	
3	ATS Panel Repairing	Admin	27,965.00	✓	
4	Attendance Management Software	Admin	290,000.00		✓
5	Audio System - KH 3630	Admin	25,000.00		✓
6	Building Maintenance	Admin	96,426.40		✓
7	Desktop Computer	Admin	182,900.00		✓
8	Digital Thermometer	Admin	6,500.00	✓	
9	Face Mask	Admin	80,420.00	✓	
10	Generator Batteries	Admin	67,485.00	✓	
11	Hand Sanitizer	Admin	18,011.26	✓	
12	Hand Sanitizer / Gloves	Admin	22,728.00	✓	
13	Hand Wash / Soap	Admin	6,155.00	✓	
14	Ink Cartridge	Admin	29,750.00	✓	
15	Laptop Computer	Admin	201,895.00		✓
16	Lunch	Admin	37,130.00	✓	
17	Maintenance - Waste Water Plant	Admin	58,645.62	✓	
18	Mask / Handwash	Admin	41,425.00	✓	
19	Office ID	Admin	8,280.00	✓	
20	Printer Drum	Admin	29,202.00	✓	
21	Stationery & Office Consumables	Admin	15,120.00	✓	
22	Surgical Gloves / Sanitizer	Admin	21,152.00		
23	Toner	Admin	123,012.00	✓	
24	Uniforms – Materials	Admin	568,451.00	✓	
25	Vehicle Repair	Admin	60,740.00	✓	

v) Finance Division

No	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Calculator	Finance	1,598.40	✓	
2	Stationery & Office Consumables	Finance	31,500.00	✓	
3	Laptop Computer	Finance	201,895.00		✓
4	Laser Printer	Finance	25,250.00		✓
5	Stationery & Office Consumables	Stores	717,939.25	✓	
6	Toner	Stores	464,484.00	✓	

vi) Internal Audit Unit

No.	Item	Division	Cost (LKR)	Recurrent	Capital

1	Laptop Computer	Internal Audit	201,895.00		✓
2	Desktop Computer	Internal Audit	182,900.00		✓

vii) SLGC

No.	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Laptop Computer	SLGC	201,895.00		✓

viii) NCNDT

No.	Item	Division	Cost (LKR)	Recurrent	Capital
1	Partitioning	NCNDT	836,468.00		
2	Cash Box	NCNDT	3,937.50		
3	ET Cables-Capital	NCNDT	146,880.00		✓
4	Image Quality Indicators-Capital	NCNDT	45,350.00		✓
5	Image Quality Indicators-Capital	NCNDT	104,220.00		✓
6	Photocopy Machine-Capital	NCNDT	510,600.00		✓
7	Probe caples-Capital	NCNDT	83,811.74		✓
8	Rebound Hammer-Capital	NCNDT	649,728.00		✓
9	A/C 03 Unit-Capital	NCNDT	115,140.00		✓
10	A/C Compressor Unit-Capital	NCNDT	437,400.00		✓
11	Gas System for Welder Unit-Capital	NCNDT	43,600.00		✓
12	Solar Panel Router-Capital	NCNDT	2,900.00		✓
13	Stop Watch-Capital	NCNDT	1,100.00		✓
14	Tab for Online Course-Capital	NCNDT	16,900.00		✓
15	Welder Unit Document-Capital	NCNDT	198,500.00		✓
16	Welder Unit Tools-Capital	NCNDT	14,072.00		✓
17	Welder Unit Tools-Capital	NCNDT	22,160.00		✓
18	Welder Unit Tools-Capital	NCNDT	29,680.00		✓
19	Welder Unit Tools-Capital	NCNDT	36,926.00		✓
20	Welder Unit Tools-Capital	NCNDT	105,000.00		✓
21	Lab consumables	NCNDT	1,800.00	✓	
22	Lab consumables	NCNDT	2,400.00	✓	
23	Lab consumables	NCNDT	7,600.00	✓	
24	Lab consumables	NCNDT	12,250.00	✓	
25	Lab consumables	NCNDT	52,500.00	✓	
26	Lab consumables	NCNDT	88,800.00	✓	

27	Lab consumables	NCNDT	159,600.00	✓	
28	Lab consumables	NCNDT	198,100.00	✓	
29	Lab consumables	NCNDT	264,940.00	✓	
30	Lab consumables	NCNDT	476,200.00	✓	
31	Lab consumables	NCNDT	809,676.00	✓	
32	Repair & Maintainance	NCNDT	465.00	✓	
33	Repair & Maintainance	NCNDT	690.00	✓	
34	Repair & Maintainance	NCNDT	1,160.00	✓	
35	Repair & Maintainance	NCNDT	1,800.00	✓	
36	Repair & Maintainance	NCNDT	2,268.00	✓	
37	Repair & Maintainance	NCNDT	2,500.00	✓	
38	Repair & Maintainance	NCNDT	3,000.00	✓	
39	Repair & Maintainance	NCNDT	4,500.00	✓	
40	Repair & Maintainance	NCNDT	4,800.00	✓	
41	Repair & Maintainance	NCNDT	4,900.00	✓	

42	Repair & Maintainance	NCNDT	4,950.00	✓	
43	Repair & Maintainance	NCNDT	5,143.00	✓	
44	Repair & Maintainance	NCNDT	5,285.00	✓	
45	Repair & Maintainance	NCNDT	5,645.00	✓	
46	Repair & Maintainance	NCNDT	6,825.00	✓	
47	Repair & Maintainance	NCNDT	6,920.00	✓	
48	Repair & Maintainance	NCNDT	7,684.25	✓	
49	Repair & Maintainance	NCNDT	7,715.00	✓	
50	Repair & Maintainance	NCNDT	8,772.52	✓	
51	Repair & Maintainance	NCNDT	10,010.00	✓	
52	Repair & Maintainance	NCNDT	11,125.00	✓	
53	Repair & Maintainance	NCNDT	12,765.00	✓	
54	Repair & Maintainance	NCNDT	12,797.66	✓	
55	Repair & Maintainance	NCNDT	13,755.00	✓	
56	Repair & Maintainance	NCNDT	16,038.00	✓	
57	Repair & Maintainance	NCNDT	17,100.00	✓	
58	Repair & Maintainance	NCNDT	19,940.00	✓	
59	Repair & Maintainance	NCNDT	31,023.00	✓	
60	Repair & Maintainance	NCNDT	44,740.00	✓	
61	Stationery & Office Consumables	NCNDT	2,500.00	✓	
62	Stationery & Office Consumables	NCNDT	2,800.00		
63	Stationery & Office Consumables	NCNDT	2,800.00		
64	Stationery & Office Consumables	NCNDT	6,048.00		
65	Stationery & Office Consumables	NCNDT	12,540.00		
66	Stationery & Office Consumables	NCNDT	15,600.00		
67	Stationery & Office Consumables	NCNDT	15,885.00		
68	Stationery & Office Consumables	NCNDT	31,300.00		
69	Stationery & Office Consumables	NCNDT	73,224.00		
70	Stationery & Office Consumables	NCNDT	80,744.04		
71	Stationery & Office Consumables	NCNDT	134,379.65		
72	Stationery & Office Consumables	NCNDT	177,120.00		
			5,467,090.86		

7.

මූල්‍ය වාර්තාව -2020



ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

මෙම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ විගණන සම්මත වලට (SLPSAS) අනුකූලව වන ආකාරයට හා SLPSAS මඟින් ආවරණය නොවන අයිතම සඳහා සුදුසු ප්‍රතිපත්ති යොදා ගනිමින් පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම මත පිළියෙල කර ඇති අතර මුළු කාලපරිච්ඡේදය සඳහාම විගණන ප්‍රතිපත්ති නිරන්තරයෙන් යොදාගනිමින් මුදල් ප්‍රවාහ සඳහා ප්‍රකාශය හැරුණු කොට අනෙකුත් විගණන උපචිත පදනම මත පිළියෙල කරමින් සකස් කර හඳුනාගැනීම, ඇගයුම් ඉදිරිපත් කිරීම හා හුවමාරු කිරීමේ දී පැහැදිලි කිරීම් අවශ්‍ය වූ විට හා සාමාන්‍ය වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල අවශ්‍යතාවයන් සපිරෙන ලෙස පිළියෙල කර ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය

(සියළුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් වේ.)

	සටහන්	2020		Restated 2019	
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් හා මුදල් හා සමාන දෑ	**3**	135,268,410		19,188,365	
ලැබිය යුතු දෑ	**4**	30,441,815		31,156,249	
ඉන්වෙන්ටරි	**5**	18,885,647		15,939,918	
පෙර ගෙවීම්	**6**	6,899,824		7,923,243	
වෙනත් ජංගම වත්කම්	**7**	198,708,072	390,203,768	196,281,869	270,489,644
ජංගම නොවන වත්කම්					
නොනිමි වැඩ	**8**	4,863,143		32,141,809	
දේපල පිරියත හා උපකරණ	**9**	828,820,106		821,039,065	
අස්පෘශ්‍ය වත්කම්	**9.1**	3,565,949		3,761,178	
ඉඩම් සහ ගොඩනැගිලි	**9.2.1**	922,424,970		902,667,831	
භාවිතයට ගතනොහැකි අයිතම	**10**	31,850	1,759,706,017	31,850	1,759,641,733
මුළු වත්කම්			**2,149,909,786**		**2,030,131,376**
බැරකම්					
ජංගම බැරකම්					
ගෙවිය යුතු දෑ	**11**	86,825,842	86,825,842	94,122,781	94,122,781
ජංගම නොවන බැරකම්					
විශ්‍රාම දීමනා ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම	**12**	38,836,936		33,380,685	
Co-60 වසාදැමීමේ ගාස්තුව	**13**	5,413,174	44,250,111	5,155,404	38,536,089
මුළු බැරකම්			**131,075,952**		**132,658,870**
මුළු ශුද්ධ වත්කම්			**2,018,833,833**		**1,897,472,507**
ශුද්ධ වත්කම් හා ස්කන්ධ					
ප්‍රාග්ධන හා සංචිත					
රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන	**14**	1,900,845,119		1,794,795,981	
සමුච්චිත අරමුදල	**15**	190,774,857		179,350,567	
ඌණතාවය	**16**	(72,786,143)		(76,674,040)	1,897,472,507
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ		2,018,833,833	**2,018,833,833**		**1,897,472,507**

පිටු අංක 01 - 40 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය වාර්තාවල අත්‍යවශ්‍ය අංගයකි. ශ්‍රී ලංකා පර්මාණුක බලශක්ති මණ්ඩලයේ පහත අත්සන් තබා ඇති අප වන අධ්‍යක්ෂ ජනරාල් හා මූල්‍ය අංශයේ අංශ ප්‍රධාන, මෙම මූල්‍ය වාර්තා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව සහතික කරමු.

.....					
අධ්‍යක්ෂ -මූල්‍ය				**අධ්‍යක්ෂ ජනරාල්**	

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන අතර 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් (පසුගිය වසර හා සැසඳීම් සමග) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

....

සභාපති **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

(සියළුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් වේ.)

	Notes	2020	Restated 2019
අයභාරය	**17**	174,139,707	190,814,840
උපදවන ලද ලද ආදායම්	**18**	131,754,231	143,087,580
වෙනත් අයභාර	**19**	10,444,095	12,693,906
මුළු ආදායම		316,338,033	346,596,326
සේවකයන් ගේ වේතන, වැටුප් හා ප්‍රතිලාභ	**20**	(152,979,068)	(131,897,954)
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	**21**	(31,834,932)	(38,412,399)
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම්	**22**	(70,222,274)	(70,056,980)
දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීම්	**23**	(6,055,753)	(5,026,013)
වෙනත් පුණරාවර්තන වියදම්	**24**	(51,323,375)	(70,052,866)
මූල්‍ය පිරිවැය	**25**	(22,934)	(34,841)
මුළු වියදම		(312,438,336)	(315,481,052)
වසර සඳහා අතිරික්තය/ (ඌණතාවය)		**3,899,697**	**31,115,274**

අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව 2020 වසරේ දී පහත සඳහන් අයිතම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2020 වසරේ ප්‍රසම්පාදන සැලැස්මට ඒවා ඇතුලත් කරන ලදි. කෙසේ වෙතත් 2020 වසරේ අවසාන භාගයේ දී ආරම්භ කරන ලද සමහර කොන්ත්‍රාත්තු වසර අවසානයට පෙර සම්පූර්ණ කල නොහැකි විය. ඉල්ලා ඇති අරමුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (TOD) විසින් නිකුත් කර ඇත.

2020 වර්ෂය සඳහා පවතින ප්‍රතිපාදන කාලය තුළ මෙම කොන්ත්‍රාත්තුවල හිඟ මුදල පියවිය හැක.

	අයිතමය	මුදල රු.
1.	Cobalt 60 Radioactive Material	96,525,000
2	NaI Scintillation Detector + MCA - 2020	7,985,000
3.	Vacuum Cleaner	25,000
4.	De-humidifier	175,000
5.	Nitrogen Gas Cylinder	20,000
6	Netgate Network Router	40,000
		<u>104,770,000</u>

Cobalt 60 විකිරණශීලී ද්‍රව්‍ය– source loading at SLGC

2020 ජනවාරි 1 වන දිනට Cobalt-60 මූලාශ්‍රයේ ආරම්භක ක්‍රියාකාරකම් 193kCi විය. පවතින පාරිභෝගිකයින්ගෙන් වැඩිවන ඉල්ලුමත් සමඟ, SLGC විසින් 2020 වසර තුළදී එහි ප්‍රභවයේ ශක්තිය තවත් 250kCi කින් වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත.

But due to global pandemic situation, SLAEB was unable to complete the international bidding process to procure the source and considering the circumstances and the urgency of need, Cabinet of Ministers have approved to purchase the source directly from Board of Radiation and Isotope India (BRIT India), with the involvement of Line Ministry and the Indian High Commission of Colombo under Government-to-Government basis. This procurement could not be completed during 2020 due to lock down situation in India. All precautions have been taken to complete this source loading during early 2021.

Capital budget allocated in order to procure the above source during 2020 was obtained from the Department of Treasuryin September 2020. Since the procurement not being completed in 2020, the amount allocated was brought forward for 2021 with the consent of the Line Ministry and the Treasury.

10. **අවසන්කල මූලික විමර්ශන**

10.1 Magistrate Court Case No.MC/31796/2020

පැමිණිලි අංකය	පෙත්සන්කරුවන්	වර්තමාන තත්ත්වය
22/04/2020	**මානෙල් චන්ද්‍රසේකර මහත්මිය** **අධ්‍යක්ෂ, පරිපාලන** ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB)	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතු ඇතැම් භාණ්ඩ හා උපකරණ සොරුන් විසින් සොරාගෙන ගොස් ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නීති නිලධාරිනිය විසින් මූලික විමර්ශනය සිදු කර ඇති අතර එහිදී ඇය පෙන්වා දී ඇත්තේ එම අවස්ථාවේදී ආරක්ෂක අංශයේ බරපතල නොසැලකිල්ල සහ අතපසුවීම ඔප්පු වී ඇති බවයි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇති අතර දැන් මෙම නඩුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවතී. (case No.MC/31796/2020). පොලිසිය පරීක්ෂණ සිදුකර සොරුන් සොයාගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත. එම නඩුව 2020/08/20 දින කැඳවූ අතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙනුවෙන් නීති නිලධාරී සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්) මෙම නඩුවට පැමිණ ඇත.

		තවද, මෙම නඩුව 2020/10/22 දින කැඳවන ලද අතර, පොලිසිය මෙම නඩුව මෙහෙයවා ඇත. තවමත් නඩුව සිදුවෙමින් පවතින අතර මීළඟ දිනය 2021/02/18 වේ.

10.2 කම්කරු දෙපාර්තමේන්තුවේ නඩු

පැමිණිලි අංකය	පෙත්සන්කරුවන්	වර්තමාන තත්ත්වය
27/01/2020	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරි රුවන් ද සිල්වා මහතා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට එරෙහිව මෙම පැමිණිල්ල කළේය.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට එරෙහිව තමන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත් එම කාලය තුළ වැටුප් ලබා ගැනීම ප්‍රතික්ෂේප කළ බවත් රුවන් ද සිල්වා මහතා සිය පැමිණිල්ලෙන් පෙන්වා දුන්නේය. නඩු විභාගයෙන් පසු ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් රුවන් ද සිල්වා මහතාට නියමිත වැටුප් ගෙවා සේවක අර්ථසාධක අරමුදලේ සේවක දායකත්වය වෙනුවෙන් 10%ක් රුවන් ද සිල්වා මහතාට ගෙවන ලෙස දන්වා ඇත. කෙසේ වෙතත්, එම ගෙවීමට තමාට කිසිදු වගකීමක් නොමැති බවත්, එම ගෙවීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය බැඳී සිටින බවත් රුවන් ද සිල්වා මහතා පෙන්වා දී තිබේ. තවද, මෙම පැමිණිල්ල 2020/07/29 සහ 2020/09/07 යන දිනවලදී කැඳවා සාක්ෂි සහ ප්‍රකාශ සටහන් කර ගන්නා ලදී. තවමත් මෙම කාරණය සිදුවෙමින් පවතී.

11 MOU/Agreements Signing

The SLAEB has initiated an establishment of Cyclotron based Radio Pharmaceutical Production Centre in Sri Lanka.

Accordingly, SLAEB has signed Memorandum of Understanding regarding the Establishment of Cyclotron Based Radiopharmaceutical Production Centre in Sri Lanka with the Kothalawala Defiance University and the Medical Supplies Division on 13th January, 2021 at the SLAEB.

11.1 Tripartite Agreement Signing

The SLAEB has initiated Pilot project on Geochemical Approach to Verification of the Origin of 'Ceylon Tea' with the Sri Lanka Tea Board (SLTB), and the Tea Research Institute of Sri Lanka (TRI).

Accordingly, SLAEB has signed Tripartite Agreement regarding the above-mentioned pilot project with the SLTB and TRI on 02-02-2021.

12. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගිණුම් ශේෂයන් පිළිබඳව විශ්ලේෂණය

1969 අංක 19 දරණ පරමාණුක ශක්ති අධිකාරි පනත මගින් පිහිටුවන ලද පරමාණුක ශක්ති අධිකාරිය 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක ශක්ති පනත මගින් අහෝසිකර 2015 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය නමින් නව ආයතනයක් පිහිටුවන ලදි.

2014 අංක 40 දරණ පනතේ 4 වන කොටසෙහි 14 වන පර්ච්ඡේදයේ 90 වන උප වගන්තියට අනුව පරමාණුක ශක්ති අධිකාරියට අයත් වූ සියළුම කාර්යය මණ්ඩල, සියළු වංචල හා නිශ්චල දේපල, වත්කම්, බැදීම්, ණය, වගකීම් යන මුල්‍ය කාර්යයසාධන හා තත්ත්ව ගිණුමේ සමුච්චිත ශේෂය ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරියට අයත් ඉහත සඳහන් සියළු දෑ 2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පරමාණුක බලශක්ති මණ්ඩලයට පවරන ලදි.

2014-12-31 දිනට පවතින ශේෂය සහ ආයතන දෙක අතර වෙන් කර ඇති මුදල පහත පරිදි විය;

වටිනාකම රුපියල් වලින්

විස්තර	AEA ශේෂය 2014-12-31 දිනට	SLAEB	SLAERC	AEA හි රඳවා ගත් මුදල
වර්තමාන වත්කම්	65,081,652	63,344,562	1,647,936	89,154
ජංගම නොවන වත්කම්	874,108,147	860,064,717	14,043,430	-
වර්තමාන වගකීම්	64,919,502	59,187,950	5,626,391	105,161
ශුද්ධ වත්කම්	**874,270,297**	**864,221,329**	**10,064,975**	**(16,007)**
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රාග්ධනය සහ සංචිත	910,207,208	903,676,072	6,531,136	-
ප්‍රාග්ධනය ලාභයක්	1,187,150	1,187,150	-	-
සමුච්චිත අරමුදල	86,390,208	78,877,912	7,512,296	-
හිඟය	(123,514,269)	(119,537,507)	(3,976,762)	-
සමුච්චිත ප්‍රාග්ධනය	**874,270,297**	**864,221,329**	**10,064,975**	**(16,007)**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්වා ඇති පහත ගිණුම්වල ශේෂ විශ්ලේෂණය සඳහා පහතින් අනාවරණය කර ඇත්තේ සමුච්චිත ප්‍රාග්ධනයේ චලනයන්ය. මෙය මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය සහ සාධාරණ දැක්ම පවත්වා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ගේ වඩා හොඳ අවබෝධය සඳහා ය.

වටිනාකම රුපියල් වලින්

විස්තර	**2015 ජනවාරි 01 වන දිනට SLAEB ආරම්භක ශේෂය**	**2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ SLAEB මුදල චලනය**	**SLAEB මූල්‍ය ප්‍රකාශන ශේෂය 31.12.2020**
හිඟ /අතිරික්ත ගිණුම	(119,537,507)	46,772,150	(72,765,357)
ප්‍රාග්ධන සහ සංචිත ගිණුම	903,676,072	997,169,047	1,900,845,119
සමුච්චිත අරමුදල	78,877,912	112,518,878	191,396,790
ප්‍රාග්ධන ලාභය	1,187,150	(1,187,150)	-
සමුච්චිත ප්‍රාග්ධන	**864,221,329**	**1,155,272,925**	**2,019,476,552**

AEA සහ SLAEB යන ආයතන දෙකට අදාළ වන හිඟ/අතිරික්ත ගිණුම, ප්‍රාග්ධන සහ සංචිත ගිණුම සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ඉදිරි ශේෂයන් පහත වගුවල වෙන වෙනම පෙන්වා ඇත.

ගිණුම්වල ශේෂයන් ගේ අතිරික්තය/ ඌණතාවය විශ්ලේෂණය - වටිනාකම රුපියල් වලින්

ආයතනය	වසර	ආරම්භක ශේෂය	කරන ලද ගැලපුම්	වර්ෂය සඳහා ශේෂය	අවසාන ශේෂය
පරමාණුක ශක්ති අධිකාරිය	2015.01.01 දිනට ශේෂය	-119,537,507			-119,537,507
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	වර්ෂය - 2016	-119,537,507	-32,399,202	-20,985,772	-172,922,481
	වර්ෂය - 2017	-172,922,481	65,252,274	3,864,974	-103,805,233
	වර්ෂය - 2018	-103,805,233	-3,482,800	1,456,454	-105,831,579
	වර්ෂය -2019	-105,831,579	- 1,544,036	-413,699	-107,789,314
	වර්ෂය - 2016	-107,789,314	-	31,115,274	-76,674,040
	වර්ෂය -2020	-76,674,040	-11,800	3,899,697	-72,786,143

සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂ වී විශ්ලේෂණය වටිනාකම රුපියල් වලින්

ආයතනය	වර්ෂය	ආරම්භක ශේෂය	කරන ලද ගැලපුම්	වර්ෂය සඳහා ශේෂ	අවසාන ශේෂය
පරමාණුක ශක්ති අධිකාරිය	2015.01.01ට ශේෂය	78,877,912			78,877,912
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	වසර - 2015	78,877,912	-16,682,969	4,826,752	67,021,695
	වසර - 2016	67,021,695	53,561,571	21,245,807	113,828,953
	වසර - 2017	113,828,953	-8,711,212	20,831,489	125,949,230
	වසර - 2018	125,949,230	-8,163,174	81,229,155	199,015,211
	වසර -2019	199,015,211	-27,359,796	7,695,153	179,350,567
	වසර -2020	179,350,567	34,211,940	-22,787,649	190,774,857

ප්‍රාග්ධන හා සංචිත ගිණුමේ ශේෂ විශ්ලේෂණය වටිනාකම රුපියල් වලින්

ආයතනය	වර්ෂය	ආරම්භක ශේෂය	කරන ලද ගැලපුම්	වර්ෂය සඳහා ලැබීම්	අවසාන ශේෂය
පරමාණුක ශක්ති අධිකාරිය	2015.01.01ට ශේෂය	903,676,072			903,676,072
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	වසර - 2015	903,676,072	-47,852,050	1,109,388,733	1,965,212,755
	වසර- 2016	1,965,212,755	-93,528,253	35,211,544	1,906,896,046
	වසර- 2017	1,906,896,046	117,632,925	22,627,145	1,811,890,266
	වසර- 2018	1,811,890,266	-89,527,047	61,985,570	1,784,348,789
	වසර -2019	1,784,348,789	-61,604,808	72,052,000	1,794,795,981
	වසර - 2020	1,794,795,981	-56,925,862	162,975,000	1,900,845,119

8.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/B/SLAEB/FA/2020 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 ජූලි 24 දින

950
28 JUL 2022

ගොඩනැඟිලි
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒවාහි හෙළිකිරීම් හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ශ්‍රීමත් විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණනාධිපති වාර්තාව

යටෙහිත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.විජේරත්න
විගණකාධිපති

මිටපත: 1. ලේකම්, ප්‍රකාර්ජනනීය විදුලිබල වාණිජ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.පි.

2. ලේකම්, මූල්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.පි.

Ms. Pidurchi | MA
1) Original - DG File.
2) Copy - I.A. 28/7/2022
3) Copy - D|F 28/07/2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/B/SLAEB/FA/2020 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ජූනි ෂ්‍ර දින

සභාපති
ශ්‍රී ලංකා පරිමාණුක බලශක්ති මණ්ඩලය

ශ්‍රී ලංකා පරිමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එවකත් මහාමන්ත්‍රීතුමා හා නියාමන අධ්‍යක්ෂක ජිළිබඳව 2018 අංක 19 දරන ගණික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිගේ වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාරෝපණය කළ මතය**

ශ්‍රී ලංකා පරිමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ඉදිරි වෙන්කිරීමේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් නිලුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වැවස්ථාව සමඟ සංසෝධිතව කියවිය යුතු 2018 අංක 19 දරන ගණික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මූදල් පනතේ විධිවිධාන ප්‍රකාර මගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මගේ වාර්තාව යවා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මගේ වාර්තාවේ තත්ත්වාරෝපණය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මගින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රජය අංශයේ නිලුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සහය හා සංවරණ තත්ත්වයක් පිළිබිඳු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නෙත්ත්වයෙන්කෙනය කළු මිනය සඳහා පදනම

(අ) මංජිර ගංවර්ධන අධිකාරියේ විශේෂ විගණනයක් යටතේ රු. 922,379,607 ක් වැනත් මූදී කරන ලද නව නොවැනිලි කාණ්ඩිකය 2019 වර්ෂයේදී මණ්ඩලය වෙත භාර දී තිබුණි. මණ්ඩලය විසින් භාවිතා කරනුත් පැවති මෙම වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය ආය නිලුම්කරණ ප්‍රමිත 7 හි 14(අ) ඡේදය ප්‍රකාරව වත්කම් ලෙස නිලුම්කරන කර නොතිබුණි. එසේම, ඊට අදාල ඉඩම හා විදුයාගාරවල ඇතිවිට පැවති රසායනික දූවිය නොගය අයිතම 16 ක නිවැරදියද අගය කර නිලුම්කරන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට නොනිවුල අගය ගුනය වූ නිවැරදිය රු. 63,978,139 ක් වූ වත්කම් අයිතම 1,335 ක් පවතුරවත් භාවිතා කරනුත් පැවති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ආය නිලුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, අගේක්ෂා කරන තත්ත්වයන් ඇත්තෙන්ම්නුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය ආය නිලුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය වෙත පවතායා ලෙස ලැබී තිබූ රු. 37,313,102 ක් වූ විදුයුත්මික උපකරණවල වටිනාකම් ශ්‍රී ලංකා රාජ්‍ය ආය නිලුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූලික ප්‍රකාශනවල අයකරය ලෙස සඳුනාගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද නව නොවැනිලිල්ල, විසිරණයිලි අඩුවීම ගණිවාව සහ එම ගණිවාව තුළ ස්ථාපිත කර තිබූ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතියෙහි විවිධය සහ නව නොවැනිලිල්ල සිහිවී ඉඩම හා විසිරණයිලි අඩුවීය ගණිවාව සිහිවී ඉවතේ තත්ත්වයේ වටිනාකම් සිළුබඳ නොරතුරු, නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු. 188,663,837 ක ශේෂය නොවූ බව සිහිවී සඳහා වන ශේෂ නොවූ බව සිහිවී, රු. 16,666,225 ක් වූ නොගෙ සම්බන්ධතයෙන් ගෙවයුත්තෙහි වර්තා හා සම්බන්ධතාරණ සවිශේෂණ වාපසේ සඳහා ලද රු. 19,510,902 ක අවශ්‍යදේ ගෙදු නොගය නොවූ බව නොවෙන උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) ගංගම නොවන වත්කම් වර්ග 06 ක් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලියා තත්ත්ව ප්‍රකාශනය අනුව වූ ශේෂය හා මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන් ශේෂය අතර රු. 3,469,170ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම්වලට හේතු විගණනයට සැපයිලි නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූලික ඡ්‍යායන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් උපයොගත කළ විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වර්ෂීය වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට නියමිතෙන්තු වන මණ්ඩලයේ 2020 වර්ෂීය වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූලික ඡ්‍යායන සහ ඒ සම්බන්ධව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකාරණය වගකිව යුතුය.

මූලික ඡ්‍යායන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මෙම ඒ සම්බන්ධ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මාගෙන් ප්‍රකාශ නොකරමි.

මූලික ඡ්‍යායන සම්බන්ධ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත සඳහන්ගත් අනෙකුත් තොරතුරු ලබා ගත් පැනි වූ විට කියවීම සහ එසේ කිරීමෙදී අනෙකුත් තොරතුරු මූලික ඡ්‍යායන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම් අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වර්ෂීය වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මත නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය භාරව සිටින පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව ද්‍රව්‍යමත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුකුම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියට ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූලික ඡ්‍යායන සම්බන්ධ කළමනාකාරණයේ සහ පාලනය භාරව සිටින පාර්ශවයන්ගේ වගකීම

මෙම මූලික ඡ්‍යායන ශ්‍රී ලංකා රාජ්‍ය ආංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සිදුකෙරෙන බවට සහතික කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූලික ඡ්‍යායන සිදුකෙරෙන බවට සහතික වීමට අවශ්‍ය අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරණයේ වගකීම වේ.

මූලික ඡ්‍යායන සිදුකෙරෙන විට, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර

කිරීමට අදාළ කරුණක් නම් හෝ වෙනත් වියදුල්ලයක් නොවැටී වීට දී මෙමෙහෙයුම් කැඩැත්තීමට කටයුතු කරන්නේ නම් හැර අමණ්ඩ ගැඩැත්මේ ගදනම් මත ගිණුම් කැමිම හා මණ්ඩලයේ අමණ්ඩ කැඩැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය ව්‍යවහාරය ක්‍රියාවලිය මනාසේ පවත්නා බවට සහතික වීරීමේ වගකීම, පාලනය කරන ආයතනයක් වශයෙන් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සිද්ධියෙල් කිරීමට හැකිවන පරිදි නිවැරදි ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

අරමුණක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සහාර බවට සාධාරණ සහතිරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය මිදු කිරීමේදී එය හැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන සහතිරුව කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සංයුක්ත ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පාරිභෝගිකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකළිලුසිවීන් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවදාවත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වීය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවට්ටිකව උචිත විගණන පරියාථි පැරැස්සුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් මියුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් මියුවන බලපෑමට වඩා වංචාවකින් මියුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයන්, වියාජ ලේඛන සැකසීමෙන්, හේතුකාත්මක මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ දෙලදාසිත්වය මඟහරවා ගැනීම සඳහා නිවැරදි නොවූවද, අවම වාරණවෝවත් උචිත විගණන පරීක්ෂා භාවිතයේ නිරත වීම මඟින් අභ්‍යන්තර පාලනය මඟහරවා ගැනීම අවම මට්ටමක් දක්වා පහත හෙළා ඇත.

- සංවිධාන කරන ලද නිෂ්ක්‍රීයකරණ ප්‍රතිපත්ති වල උච්චතාවය, නිෂ්ක්‍රීයකරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධීකෘත වෙළඳාවට නිරීක්ෂණ අවශ්‍ය වේ.

- මිද්ධින් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලයේ අභිමතය ඇවැත්ම මඟින් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිසාවද යන්න සම්බන්ධයෙන් උමාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිෂ්ක්‍රීයකරණය සඳහා ආයතනයේ අභිමතය ඇවැත්ම මඟින් පදනම් කොට ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මගේ මතය විකරණය කළ යුතුය. නොමැති වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අභිමතය ඇවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වැදගත් හා අන්තර්ගතය සඳහා පාදක වූ හේතුදෙතු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්මත ප්‍රදීපනත් කිරීම අගයන ලදී.

මගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රටවලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරවී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් විෂයන් හැර විගණනය සඳහා අවශ්‍ය මියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් උමා ගන්නා ලද අතර, මගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිති මූල්‍ය වාර්තා මාණ්ඩලය සම්පාදනය කොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අතුරුත් වර්ෂය සම්බන්ධ අනුරාධ වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අතුරුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද මෙම වාර්තාවේ 1.2 (අ) සහ (ආ) ඡේදවල සඳහන් කිරීමේදයන් හැර වෙනු කිරීමේදයන් ඉදිරිවත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාපිළිවෙල සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රතිඵලාත්මක කරුණුවලට ඕනෑ කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව ඒ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාරයකින් සම්බන්ධ වියහැකිවන තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කිරීම්කරණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් ආඥා හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට අනුකූල නොවූවා	විස්තරය
(අ) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත	
82 (1) වගන්තිය	මණ්ඩලයේ සැම කමිටුවක, උපදේශක කමිටුවක හා අභියාචනා කමිටුවක සාමාජිකයකු සහ සෑම විශේෂඥයකු, බලපත්‍රලාභී පරීක්ෂකයකු සහ මියගිය නිලධාරියෙක් හෝ කාර්ය හාරධාරීව හෝ මණ්ඩලයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වූ මියගිය කරුණු පිළිබඳ සම්පූර්ණ රහසායනව රඳාගිය බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් කළ යුතු වුවත් මණ්ඩලය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 260	සහතික කරන ලද වවුචර්වලක් සඳහා ගෙවීම් කිරීමේ දී වවුචර්වල නම් සඳහන් කැනැත්තන්ට හෝ ඔහුගේ නීතයානුකූල නියෝජිතයන්ට පමණක් මුදල් ගෙවූ බව සැක සැර දැන ගැනීම සඳහා අවශ්‍ය ඔබේ විමසීමෙන් පොදානත ලැබූ වුවත්, රු. 1,509,453 ක් වටිනා වවුචර්වලින් 76 කින් රු. 357,710 ක් වටිනා වවුචර්වලින් 32 කට අදාළව ගෙවීම් සිදු කිරීමේ දී එසේ කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
II වැනි පරිච්ඡේදයේ 15:1(ix)	නියමිත දිනට කාර්යක්ෂමතා කඩතුරු සැලැස්වීම සඳහා පත්කිරීම් බලධරයා ද/ පරිපාලන බලධරයා ද/ ආයතනික ප්‍රධානියා ද යම් වගකීමකට බැඳී සිටියි. ඒ අනුව මණ්ඩලයේ බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය පවතී නැතැයි තහනුරු සඳහා වැරදීමකට හෝ අවධානයෙන් ඇති වූ විට කාර්යක්ෂමතා කඩතුරු වියාග සැලැස්විය යුතුව තිබුණ ද මණ්ඩලය විසින් එලෙස කටයුතු කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සිදුකළ යුතු බව එම කටයුතු අවශ්‍යතාය සහ ඇතැම් සඳහා මාර්ගෝපදේශ සහිත ලිපියක් මගින් දැනුම් දුන් වුවත් මණ්ඩලය විසින් එවැ අනුගතව කටයුතු කර නොතිබුණි.
(ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
(i) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මාණ්ඩලික නිලධාරීයෙකුගේ සහ අධීක්ෂණය යටතේ සේවය කරන ඕනෑම නිලධාරීයෙකුට සුළු වියදම් සඳහා රු. 25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අතුරු අග්‍රිම ලබා දීමට හැකි වුවත් මණ්ඩලය විසින් එම මාර්ගෝ

	ඉක්මවා අවස්ථා 19 කදී එකතුව රු. 862,385 ක් වූ මුළු මුදල් අතර අවම ලකා දී නිබුණි.
(iii) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2020 වර්ෂයේ ආණ්ඩු ගණිත්ත්‍ය වාර්තාව 2021 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පරිපාලන වලයක්ති මණ්ඩලයේ 2020 වර්ෂීය ආණ්ඩු ගණිත්ත්‍ය වාර්තාව එහි වාර්තාවට දිනය වන තෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ම) රාජ්‍ය මිණුම් චක්‍රලේඛ

1994 ජූලි 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය මිණුම් චක්‍රලේඛය	වේදිකා අධීක්ෂක කමිතුමාට සියලු ගනුදෙනු මෙන් ආණ්ඩුකාරයේ වේදිකා කමිටුවේ සභාපතිතුමාවූ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කළ යුතු වේ. එසේත් වට අනුගත නොවී මණ්ඩලය විසින් සම්පාදනය වර්ෂය තුළ සිදුකළ රු.40,949,996 ක් වූ වේදිකා ප්‍රදාන ලැබීම් ආණ්ඩුකාරය වෙත ලබා දෙන අවංකවාත සහතිකය මේ ආයතනය වෙත ලබා දෙන නිබුණි. මීත් රු.3,636,894 ක් මුදල් ප්‍රදාන වශයෙන් ද රු.37,313,102 ක් ආණ්ඩු ප්‍රදාන වශයෙන් ද ලැබී නිබුණි.

(ඇ) රාජ්‍ය වියදම් චක්‍රලේඛ

2003 ජූනි 02 දිනැති අංක 853/12 දරන රාජ්‍ය වියදම් චක්‍රලේඛය

(i) 5.1ඡේදය	මුදල් වර්ෂය අවසන් වීමට දින 15 කට පෙර ඉදිරි වර්ෂ 03 සඳහා යාවත්කාලීන කරන ලද මාසික ඇල්ලුම් සැලසුම් මණ්ඩලය අනුමත කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් එවැ අනුගතව නවයුතු කර නොතිබුණි.
(ii) 6.5.1 ඡේදය	නිණුම් වර්ෂය අවසානයේ සිට දින 60 ක් ඇතුළත මුදල් ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලයේ මුදල් ප්‍රකාශන දින 118 ක් ප්‍රමාද වී පසුව 2021 ජූනි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(iii)9.8 ඡේදය	මෙම ඡේදයෙන් ආවරණය නොවන අනෙකුත් දීමනා ලබා ගැනීම සඳහා රාජ්‍ය වියදමත් අදාළ කාර්යමණ්ඩලවලින් සහ මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපත්තියට පොහොත් මෙවැදෑ නිවාඩු මත දීමනාව වශයෙන් රු.7,032,661 ක් ගෙවා තිබුණි. මෙම දීමනාව ඉතුරු වර්ෂවලදී ද ගෙවා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(උ) වත්කම් කළමනාකරණ වනුලේඛය

2017 ජූනි 28 දිනැති 01/2017 දරන වත්කම් කළමනාකරණ වනුලේඛය	2018 වසරේ මිට පිලදී ගන්නා ලද වත්කම් සම්බන්ධව සහාපතුරු අදාළ කාර්තුව අවසානයේ කොමිසම්ලාරිව ස්ථානගත වෙන අදිසියක් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ මිට 2020 වර්ෂය දක්වා මිලදී ගන්නා ලද රු.297,544,655 ක් වටිනා වත්කම් (මෙහායන ලෙස ලද රු. 146,730,744 ක් වටිනා වත්කම් ද ඇතුළත්ව) සිදුකිරීම සඳහා සහාපතුරු කොමිසම්ලාරිව ස්ථානගත වෙන අදිසියක් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කාර්යය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සමහර සාමාජිකවරු වෙත, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලමිතියෙන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රගතිසාධනය කර ගැනීමට කර නොමැති බව.

(ඇ) නිවිතාගෙන පරීක්ෂණ ජාතික ඔටොස්ථාන හොඩානැගීල්ල ඉදිකිරීමේ අතිරික්ත වැඩ සඳහා වෙන් කළ යුතු රු. 38,258,027 ක් සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රකාශයක් සමිපු අනුමැතිය මෙම වාර්තාවේ දිනය වන තෙක් ලබා ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගැමි ඔටොස්ථානයේ බහුකාර්යය ගැමි ප්‍රවේශිකණ යන්ත්‍රාගාරයේ උපරිම වාර්තාවය 3000kcl වුවත්, වර්තමානය වනවිට එම ප්‍රමාණයේ මෙහෙය 177kcl විය. තව ද කොමෝල්ට් 60 ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා 2020 අගෝස්තු 30 දින

කාණ්ඩාගාරයෙන් රු. මිලියන 96.525 ක් ලැබී තිබුණි. එහෙත් ප්‍රකාශිතයන සටහනෙහි නිසියාකාරව ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම ප්‍රකාශිතයන සටහනෙහි 2021 අගෝස්තු 21 දින දක්වා ප්‍රමාද වී තිබුණි.

(ඇ) ආයතනයේ ආරක්ෂණ සේවාව හා වෙනුකා සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් මණ්ඩලය විසින් අදාළ ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම්වල කාලය ඉකුත් වී තිබුණ ද, නව ලංඝු කැඳවීමකින් තොරව අදාළ සැපයුම්කරුවන්ගේ සේවාව අඛණ්ඩව ලබාගෙන තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2020 දෙසැම්බර් 31 දිනට පැවති සමාප්ත ණයකරු ශේෂය රු. 18,088,997 ක් වූ අතර, එය රු. 17,396,257 ක් වූ වෙළඳ ණයකරුවන්, රු. 545,122 ක් වූ වෙනත් ලැබිය යුතු ශේෂයන් හා රු. 147,618 ක් වූ සේවක ණයකරුවන්ගෙන් සමන්විත විය. මෙම වෙළඳ ණයකරු ශේෂය තුළ එකතුව රු. 846,967 ක් වූ ණයකරු ශේෂයන් වර්ෂ 02 සිට 07 දක්වා කාලයක සිඟව පැවතුණි.

(ආ) වසර දෙකකට අධික කාලයක් තිස්සේ පැවත එන රු. 92,750 ක් වූ සේවක ණයකරු ශේෂයක් හා එකතුව රු. 226,282 ක් වූ වෙනත් ණයකරු ශේෂ 11 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට ණයකරු හා උපචිත වැඩවල රු. 49,672,438 ක් වූ අතර, එයින් එකතුව රු. 30,552,838 ක් වූ ණයකරු ශේෂ 14 ක් වසරකට වඩා අධික කාලයක සිට පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) නාගරික ආ-වර්ධන අධිකාරියට අයත් 99 අවුරුදු බදු ඉඩමක් මත ලබාගත් ඉඩමක පරමාණුක බලශක්ති මණ්ඩලයේ පුර්වගාමී ආයතනය වූ පරමාණුක බලශක්ති අධිකාරිය සිමිටා තිබුණි. නව කැලණි පාලම ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා උක්ත ඉඩම් පවරාගැනීම සඳහා මාළඹෙ ප්‍රදේශයේ නාගරික ආ-වර්ධන අධිකාරියේ විකල්ප ඉඩමක් මණ්ඩලය වෙත ලබාගැනීමෙදී 2017 මාර්තු 07 දිනැති අමාත්‍යාංශ මණ්ඩල තීරණය පුකාරව නාගරික ආ-වර්ධන අධිකාරිය වෙත ඉදිරියට ගෙවීම් කරන ලද බදු කුලිය වූ රු. 7,663,837 ක් අඩු කර ගෙවීම් කර නොතිබුණි. එසේම විකල්ප ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු.116,000,000 ක් ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු. 75,500,000 ක් ද වූ රජයේ තක්සේරුව නොසලකා රු. 181,000,000 ක් ගෙවා තිබුණි. වැනකින දිනය දක්වා ඉඩමේ අයිතිය පරමාණුක බලශක්ති මණ්ඩලයට හෝ වෙනිය අමාත්‍යාංශය වෙත හෝ පවරා ගැනීමද කර නොතිබුණි.

(ඉ) මාලනේ ඉඩම් කෝරාගැනීමට අදාළ විටිමක් සකසනා අධ්‍යයනයක් සිදු කර නොතිබුණු අතර, ඔහෙන විගෝධනා නීතා ඉදිකිරීම් 2015 යුනී මග ඕට ගම්පුර්ණයෙන් නවතා තිබුණි. එසේවත්, ජාතික ආයුතීකරණ හා කාර්මික පුහුණු තිරීමේ අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් අවශ්‍ය 30 කට බදු ලබා ගත් ඉඩමක් මණ්ඩලය ස්ථාපිත කිරීම සඳහා යොදා ගැනීමට පරිමාණුක බලපෑම් මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික ආයුතීකරණ හා කාර්මික පුහුණු තිරීමේ අධිකාරිය අතර ලේඛනාරක්ෂිත අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඉඩම්වල අයිතිය සහාට කරවාගැනීමෙන් තොරව ගිවිසුම් ගත වී තිබුණු අතර මෙම ඉඩම් නාගරික සංවර්ධන අධිකාරියට අයිති නොමැති බවත් ඉඩමක් බව තොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් මණ්ඩලය වෙත පසුව දන්වා තිබුණි. නීදහස් දිවනා පත්‍රයක් තිමින් රජයේ ඉඩමක් ලබාගැනීමට නවයුතු තිරීමෙන් තොරව අයිත ප්‍රදේශත් වැසෙනා බදු සඳහාත් ඉඩම් ලබාගැනීම අනාරක්ෂිත විශේෂයක් බව නිරීක්ෂණය විය.

(ඊ) මෙහෙවීම වර්ෂය තුළ ක්‍රියාකාරී පැලැන්ම අවු තිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී පරිමාණුක බලපෑම් මණ්ඩලයේ පමණට කාර්යසාධනය සියයට 48 ක පමණ මහළ අගයක පැවති බව නිරීක්ෂණය විය. තවද, ක්‍රියාකාරී සැලැන්ම තුළ ඇතුළත් ක්‍රියාකාරකම් අතුරින් ගම්භීරතාවය අල්ප විදහා දැක්වෙන් කාර්යසාධනය ද, ප්‍රගතිසාධන සැලැන්ම ක්‍රියාත්මක කිරීමේ සහ දර්ශීය පාසල් සඳහා නාෂ්ටික විදහාව හා තාක්ෂණය යොදා ගැනීමේ කාර්යසාධනය ද අතා අඩු මට්ටමක පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(උ) ගම්පොරවීමෙරණ පරිශ්‍රණ වාහනේ සඳහා 2020 වර්ෂයේ තිබූ මුල අයවැදුල් ප්‍රතිඥය රු. 23,760,068 ක් වූ අතර, 2020 වර්ෂය තුළ ඉන් රු. 616,882 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව එම වාහනවල මුලා කාර්යසාධනය සියයට 2.66 ක පමණ අඩු අගයක පැවති බව නිරීක්ෂණය වූ අතර, 2020 වර්ෂය තුළ එම වාහනේ 11 න් 03 ක් කිසිදු ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණි.

(ඌ) 2020 වර්ෂය සඳහා නිමිලෙස අයවැය ප්‍රලෝකනය නොකිරීම හේතුවෙන් වැය ශීර්ෂයන් 02 ක විෂයේ සිමාව ඉක්මවා ගෙවීම් කර තිබුණු අතර, පුනරාවර්තන වැය ශීර්ෂයෙන් 15 ක අයවැයෙන ප්‍රතිපාදන හා සතය වියදම් අතර සියයට 30 සිට සියයට 100 දක්වා වූ විචලතාවක් නිරීක්ෂණය විය.

(ඇ) තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන තත්‍යලෝවනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් තත්‍යලෝවන වර්ෂය අවසානයට මණ්ඩලයේ සොයාගෙන තිබෙන්නේ පුරප්පාඩු 05 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 03 ක් ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 05 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් ද වශයෙන් පුරප්පාඩු 17 ක් පැවතුණි.

ඩබ්ලිව්.බී.සී.විතුමරත්න
විගණකාධිපති

9.

<u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා කලමනාකරණ පැහැදිලි කිරීම් හා පිළිතුරු</u>

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ඉඩම, ගොඩනැගිල්ල සහ රසායනික ද්‍රව්‍ය තොග අයිතමයන් 2021 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කලද නිවැරදි පිරිවැය හඳුනාගැනීම, ව්‍යාපෘති භාරව කටයුතු කල RDA ආයතනයේ සහය ඇතිව සිදුකරමින් පවතී. ඉඩම සම්බන්ධ ගැටළු නිරාකරණය කරගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කෙටුම්පත් කල නමුත් රේඛීය අමාත්‍යාංශය මඟින් පෙන්වා දී ඇති පරිදි අදාල සියළුම පාර්ශවකරුවන් අයත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීමක් කැඳවා ඉදිරි තීන්දු තීරණ ගැනීමට නියමිතය. මේ සඳහා මේ වන විට ඉල්ලීම් සිදු කර ඇත.

(ආ)මෙම අයිතම ප්‍රත්‍යාගණනය කොට ගිණුම්ගත කිරීමට (ශ්‍රී.ලං.ගි.ප්‍ර 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීම් සහිතව) කටයුතු කරමින් පවතී.

(ඇ)2021 වර්ෂයේ සිට මණ්ඩලය වෙත ලැබෙන IAEA පරිත්‍යාග ශ්‍රී.ලං.ගි.ප්‍ර 11 ප්‍රකාරව අයභාරයක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇත.

(ඈ) මාලඹේ ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද රු.මිලියන 181ක් හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පැරණි ගොඩනැගිල්ල පිහිටි නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමේ ඉතිරි බදු කාලය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් නැවත අයකරගත යුතු රු.7,663,837ක මුදල් වල එකතු වන රු මිලියන 188.6 න් ඉඩම සඳහා ගෙවූ රු.මිලියන 181 හි ගෙවීම තහවුරු කිරීමේ වවුචර් හා නාගරික සංවර්ධන අධිකාරියෙහි රිසිට්පත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම ලැබිය යුතු මුදල්වල ශේෂ සනාථ කරගැනීම 2022 වර්ෂයේ ගිණුම් වාර්තා සැකසීමේදී සිදු කිරීමට කටයුතු කරමි.

- නව ගොඩනැගිල්ල සහ එම ඉඩම සම්බන්ධව වර්තමාන තත්වය 1.2 (අ) හි පැහැදිලි කර ඇත.
- රු.16,666,225ක් වූ තොග - වර්ෂ අවසානයේ අදාල අංශ වලට නිකුත් කරන ලද රසායනික ද්‍රව්‍ය තොග ශේෂයන් සම්බන්ධයෙන් සත්‍යාපන වාර්තාවක් 2022 වර්ෂයේ සිට ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
- රු.19,510,902 අදාල වර්ෂය සඳහා අයවැය වාර්තා අනුව ව්‍යාපෘතියට ලැබෙන මූල්‍ය ආධාර එම ව්‍යාපෘති යටතේ වෙන වෙනම ගිණුම්ගත කරනු ලබන අතර අදාල වියදම් තහවුරු කිරීම සඳහා වන ලියකිලිවල ද වෙන වෙනම වවුචර්පත් වලට අමුණා ඇත. තවද 2020 සැප්තැම්බර් මස සිට මෙම ලැබීම් වෙනම ජංගම ගිණුමකට බැර කිරීමට කටයුතු කර ඇති අතර එම වර්ෂ අවසන් ශේෂය රු.මිලියන 03 කි. 2020 වර්ෂයට පෙර ලැබීම් හා වියදම් විධිමත්ව ගිණුම්ගත නොවීම හේතුවෙන් සිදු වී ඇති මෙම දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය වියදම් හඳුනාගැනීමට පියවර ගනිමින් පවතී.
- මධ්‍යම අපහරිත විකිරණශීලී ප්‍රභව ගබඩාව.(central disused radioactive source stores) හි භෞතික ආරක්ෂණ පද්ධතිය ඇමරිකා එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාව අතර ඇති එකඟතාවයක් මත පරිත්‍යාගයක් ලෙස ලැබී ඇත.

එම දෙපාර්තමේන්තුව මගින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු වන සර්ටිස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් භෞතික ආරක්ෂණ පද්ධතිය සවි කර ඇත. භෞතික ආරක්ෂණ පද්ධතිය සවිකිරීම මෙන්ම 2020 ජනවාරි මාසයේ සිට අවුරුදු තුනක සම්පූර්ණ කොන්ත්‍රාත් කාලයක් සඳහා නඩත්තුව කොන්ත්‍රාත්තුවක් ලෙස සර්ටිස් ලංකා ආයතනයට ලබා දී ඇත.

කොන්ත්‍රාත් කාලය අවසන් වන විට භෞතික ආරක්ෂක පද්ධතිය මණ්ඩලය සතු වන බැවින් එම තොරතුරු 2023 ජනවාරි මස සිට ඉන්වෙන්ට්‍රි ගතකිරීමට කටයුතු කරමි. මෙම ප්‍රභව ගබඩාව සහිත

ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන ඉදිරි වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන අතර මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය සන්තකයේ තබාගෙන භුක්තිය සඳහා පමණක් පරමාණුක බලශක්ති මණ්ඩලයට ලබා දී ඇත.

(ඉ) අදාල වෙනස ගිණුම් ප්‍රකාශන වල ආයතනය ආරම්භයේ සිටම පවතින අතර මෙම වෙනස නිවැරදි කිරීමට මේ දක්වා උත්සහ කර ඇතත් එම වෙනස තහවුරු කිරීම සඳහා වෙන්වෙන්ව ස්ථාවර වත්කම් ලේඛනයේ අයිතමයන් හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.

2.වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.2.2

(අ) 2021 වසරේද මණ්ඩලයේ සේවකයින්ගෙන් මෙම වගන්තියට අදාල ප්‍රතිඥාව ලබා ගැනීමට කටයුතු කර ඇත. ලබානොදුන් නිලධාරීන්ට මේ සඳහා සිහිකැඳවීම් කිරීමෙන් අනතුරුව අදාල ප්‍රතිඥාව ලබාගැනීමට කටයුතු කර ඇත.

(ආ) මුදල් රෙගුලාසි 260

මින් වවුචර්පත් 18 ක් ප්‍රවාහන දීමනා වෙනුවෙන් නිකුත් කර ඇති අතර එම වවුචර්පත් වල අමුණා ඇති ගෙවීම් පතෙහි මුදල් බාරගත් බවට අත්සන් කර ඇත.

අංක 655,657,668,673,675,684,700,715,716 දරණ වවුචර්පත් මුදල් අත්තිකාරම් වෙනුවෙන් අභ්‍යන්තර නිලධාරීන්ට නිකුත් කර ඇත. මුදල් බාරගත් බවට මුදල් අත්තිකාරම් පෝරමයෙහි අත්සන් කර ඇත. ඉදිරියේදී නිවැරදි තැනැත්තන්ට පමණක් ගෙවීම් සිදුකරන බව තහවුරු කරගැනීමට අවශ්‍ය ආරක්ෂක විධිවිධාන යොදාගැනීමට පියවර ගනිමි.

(ඇ) 2019 වසරේ සිට අඛණ්ඩව අදාල පරිදි කාර්යක්ෂමතා කඩඉම්/ පරීක්ෂණ සිදුකර ඇත.

(ඈ) පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම අවසන් කර ඇත. එම කටයුතු අධීක්ෂණය හා ඇගයීම් සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගනිමි.

(ඉ)

(i) සුළු මුදල් අතුරු අග්‍රිම ලබාදීම 3/2015 අනුව සිදුකරන අතර අවස්ථා 19කදී එකතුව රු.862,385ක් ලෙස දක්වා ඇත්තේ සුළු මුදල් අතුරු අග්‍රිම ලබාදීමක් නොව ලබාදෙන ලද මුදල් අත්තිකාරම්ය. අදාල මුදල් අත්තිකාරම් කාර්ය නිම වූ පසු පියවා ඇත.

(ii) 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය රටතුල පැවති වසංගත තත්වය හමුවේ රට වරින්වර වසා දැමීම හා ආයතනයට සේවකයින් ගෙන්වීම සීමා කිරීම යනාදි කරුණු නිසා අදාල දිනයන්ට නිමකිරීමට නොහැකි විය. අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021.12.29 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර විගණනය සඳහා ලබාදෙන ලදී. සමීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කමිටු පත්කොට අදාල ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී.

(ඊ) මේ සඳහා සකස් කල ක්‍රමවේදයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ තවදුරටත් සාකච්ඡා කිරීමට මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත (විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක) මහතාගේ සහයෝගයෙන් කටයුතු කරමි.

(උ)

(i) 2018-2020 වර්ෂ සඳහා අනුමත සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර 2020 වර්ෂයේ ගෝලීය කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2020 -2022 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇත. නමුත් 2021-2023 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කොට අදාල අනුමැතීන් ලබාගෙන ඇත. ආයතනයේ සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී එහි ව්‍යාපාර මෙහෙයුම් කටයුතු

අධීක්ෂණය කරමින් ආයතනය ස්වයං තිරසාරත්වය සඳහා ගෙනයාමට අවශ්‍ය ක්‍රමෝපයන් අනුගමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී ඇත.

(ii) 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට ගිණුම් අංශයේ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොවීම (ප්‍රසූත නිවාඩු ලබාගැනීම් හා සේවයෙන් ඉවත්වීම හේතුවෙන්) ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාදවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත. මෙම අසීරු තත්වය පෙරාතුව අදාල බලධාරීන් වෙත දැනුම් දුන්නද ඒ සඳහා අවශ්‍ය අවස්ථාවේදී නිසි පියවර නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද විය. (පොත් තබන්නාගේ පුරප්පාඩුව මේ වන විටද සම්පූර්ණ කර නොමැත.)

මෙයට අමතරව කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2022 පෙබරවාරි මස අග සිට අවම කාර්ය මණ්ඩලයක් සේවයට කැඳවීම සහ වරින් වර රට වසා තැබීම හා සංචරණ සීමා පැනවීමද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ප්‍රමාදවීමට බලපාන ලදි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් විගසම එනම් 2021.06.29 දින මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

(iii) පිළිගනිමි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සේවකයන් අභිප්‍රේරණය කිරීමේ දිරි දීමනාවක් ලෙස ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා 2020 වර්ෂය දක්වා ගෙවීම් සිදු කරන ලදි. නමුත් 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ගෙවීම් සඳහා අනුමැතිය ඉල්ලුම් කලද 2022-03-11 දිනැති ලිපියෙන් උක්ත දීමනාව ගෙවීම සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බව දන්වා ඇත. ඒ අනුව 2021 වර්ෂය සඳහා උක්ත ගෙවීම් සිදුකර නොමැත.

(ඌ) කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්ෂිකව අදාල තොරතුරු චක්‍රලේඛය අනුව ලබාදෙනු ලැබේ. අදාල තොරතුරු විද්‍යුත් තැපෑල මගින් ඉල්ලුම් කරන අතර එම තොරතුරු නොපමාව ලබාදී ඇති අතර ආයතනයේ පත්කල බලධාරියාට ඉල්ලා සිටින තොරතුරු ලබාදීම ප්‍රමානවත් බව වාචිකව දන්වන ලදි.

2.2.4

(අ) නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ අතිරික්ත වැඩ සඳහා ගෙවිය යුතු ගෙවීම් ගැන සොයා බැලීම සඳහා තාක්ෂණික කමිටුවක් රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත පත්කරන ලදී. මෙම කමිටුව එම ගොඩනැගිලි ඉදිකිරීමේ සියළුම වියදම් අධීක්ෂණය කොට ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය වෙත 2022.02.28 දින ඉදිරිපත් කරන ලදී. එම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් ලබාදුන් නිර්දේශ අනුව නැවත සකස් කල වාර්තාව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර ඇත. නමුත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් වෙනස්වීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය මෙතෙක් ලැබී නැත.

(ආ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය වර්තමානයේදී ප්‍රධාන වශයෙන්ම සේවාව සපයනු ලබන්නේ ගිවිසුම්ගත ලලාන් රබර් පුද්ගලික සමාගමට වන අතර කුඩා පරිමාණ සැපයුම්කරුවන්ටද අපගේ සේවය ලැබේ. විකිරණ ප්‍රභව ක්ෂය වන බැවින් අවශ්‍යතාවයක් නොමැතිනම් වැඩි විකිරණ ප්‍රභව සක්‍රියතාවක් මිලදී ගැනීම මුදල් නාස්ති කිරීමකි. ගැමා මධස්ථානයේ විකිරණ කුටිරය 3000 kCi ධාරිතාවකට සරිලන සේ ඉදිකර ඇත්තේ අනාගතයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදිය. හේතුව, විකිරණ ධාරිතාව වැඩිකිරීම සඳහා පසුකාලීනව ගැමා කුටිරය (ගොඩනැගිල්ල) වෙනස් කිරීම ප්‍රයෝගික නොවීමයි.

මේ වනතෙක් විශාල වශයෙන් භාණ්ඩ සපයන සැපයුම්කරු වන ලලාන් රබර් පුද්ගලික සමාගමේ අවශ්‍යතාව මත, ගැමා ප්‍රභවයේ ධාරිතාව වැඩිකරනු ඇත. එම ආයතනය 2020 මැයි මස සැපයුම වැඩි කරන බව දැන්වූ හෙයින් අප විසින් 2020 ජනවාරි මස ප්‍රභවය ප්‍රසම්පාදනය ආරම්භ කල නමුත් 2019 වසරේ පැවති ජනපතිවරණයෙන් පසු රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කිරීම් නවතා තිබූ හෙයින් 2020 මාර්තු මස වන තෙක්ම මෙම මිලදීගැනීමට මුදල් වෙන් වූයේ නැත. 2020 මාර්තු මස ලන්සු කැඳවූ නමුත් කොවිඩ් 19 ගෝලීයව ව්‍යාප්තව යෑම නිසා කිසිදු ලන්සුවක් 2020 අප්‍රේල් අග වන විට ලැබී තිබුනේ නැත. 2020 වසරේ පැවති වසංගත තත්ත්වය මත ඉන්දියානු නිෂ්පාදන ආයතනය (Board of Radiation and Isotope Technologies)-BRIT) වසා තිබුනි. මේ තත්වය මත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් රාජ්‍ය මැදිහත්වීමකින් (දෙරටේ තානාපති කාර්යාල මැදිහත්වීමකින්), ප්‍රභවය මිලදී ගැනීමට කටයුතු සිදු කරගනයනලදී. මෙම කටයුතු ප්‍රමාද වීමට මූලික හේතුව වූයේ ඉන්දියානු රජයේ

අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය ලබාදී ඉඩ ලැබෙන පරිදි අපනයනය සඳහා ගැමා ප්‍රභව නිෂ්පාදනය කිරීම ඔවුන්ගේ ප්‍රතිපත්තියයි.

එම සැපයුම් සමාගමෙන් 2021-02-19 දින ලද ඉන්වොයිසියට අනුව අපගේ ඇනවුම 2021-02-22 ලබා දී ඇත. මීට අමතරව අධික විකිරනශීලිතාවයකින් සමන්විත ප්‍රභවයක් මෙරටට ආනයනය කිරීමේදී, රටතුල ප්‍රවාහනය කිරීමේදී සහ ස්ථාපිත කිරීමේදී විවිධ බාහිර රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධවී පහත සඳහන් අවසරයන් ලබාගත යුතුව තිබිණ.

1. ප්‍රභවය ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ලබාදෙන සහතිකය.
2. අපනයන සහ ආනයන පාලන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ආනයන අවසරය.

(මෙහිදී ඉන්දියානු නිෂ්පාදන සමාගමෙන් Proforma ඉන්වොයිසිය ලබාගැනීමේ සැලකියයුතු ප්‍රමාදයක් සිදුවිය.)

තවද ඉහත අවසරය ලබාගැනීමේදී, ප්‍රභවය රේගුවෙන් නිදහස්කරගැනීමට අදාළ ලියකියවිලිද බාරදීමෙන් පසු අදාළ ගෙවීම සිදුකල යුතුය.

3. ශ්‍රී ලංකා රේගුව වෙත ලබාදෙන දැනුම්දීම සහ අවසරය
4. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබාදෙන දැනුම්දීම සහ අවසරය
5. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ එහි ආරක්ෂක සමාගම වෙත ලබාදෙන දැනුම් දීම සහ අවසරය
6. විකිරණ ප්‍රභවය වරායේ සිට ගැමා මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහනයට අදාලව ශ්‍රී ලංකා පොලිසිය සහ ත්‍රිවිධ හමුදා දැනුවත් කර අදාළ සහය ලබාගැනීම සඳහා වන අවසරය

ඉහත කාරණා සියල්ල සපුරා තිබීමද මෙම ප්‍රසම්පාදන කටයුත්ත සඳහා අත්‍යාවශ්‍ය අංග බැවින් ඒ සඳහා සැලකියයුතු කාලයක් අවශ්‍ය වී තිබිණ.

තවද විකිරණ ප්‍රභවය ඉන්දියාවේ සිට ප්‍රවාහනය සඳහා ලංකා නැව් සමාගමට භාරදී තිබූ අතර (ඇණවුම් දිනය-2021 මාර්තු 11) අදාළ කාලසීමාව තුල ප්‍රවාහන සැපයුම්කරුවන් (ගැමා ප්‍රභවය ප්‍රවාහනය සඳහා බලය ලත් තෙවැනි පාර්ශවයේ නැව් සමාගම්) සොයාගැනීමට අපහසුවීම නිසා තවත් සැලකියයුතු කාලයක ප්‍රමාදයක් සිදුවිය.

(ඇ) 2020/2021 වසරවල Covid-19 අතරතුර පැවති Lock Down තත්වය යටතේ ප්‍රසම්පාදන කටයුතුවලට පැවති බාධාවන් හේතුවෙන් මාසයකට දෙකකට දීර්ඝ කලද මේ වන විට යථා තත්වයකට පත්ව ඇත. නිවැරදි කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) ණය පදනම සිදුකරන සේවාවල ණය නොගෙවූ සේවාලාභීන් සඳහා වරින් වර සිහිකැඳවීම් ලිපි යොමු කිරීම, දුරකථනය,විද්‍යුත් තැපෑල මගින් දැනුම්දීම මත ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබයි.

(ආ)එම ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය උත්සාහයන් ගනිමින් පවතී.

(ඇ) වසරකට වඩා අධික ණයගිමි ශේෂ 14න් රු.30,318,354 ක් ගෙවිය යුත ශේෂ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අතිරේඛ වැඩ සඳහා වෙන් කල ගෙවීම් වේ.

මෙම ගෙවීම් සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා වාර්තාව (විස්තරාත්මක) අමාත්‍යාංශයට යොමුකර ඇත. වර්ෂයට අඩු ශේෂ එකතුව රු.19,354,084 ගෙවීම සඳහා අදාල ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඈ) විගණකාධිපති වාර්තාවේ 2.3. (ඇ) විමසුමේ සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදුන් දිනය 2014-03-07 ලෙස නිවැරදි විය යුතුය. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කිරීමට ආයතනය අපොහොසත් වී ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය සමග අත්සන් කර ඇති අංක 769 දරණ 99 අවුරුදු බදු ගිවිසුමෙන් භුක්ති නොවිඳ ඉතිරි වූ අවුරුදු 77 සඳහාද බදු වටිනාකම ගෙවා ඇති බැවින් එම බදු අයිතිය වෙනුවෙන් පරමාණුක බලශක්ති මණ්ඩලයට වන්දි ලබා ගැනීමට හිමිකමක් ඇත.

2014.01.03 දිනැති ලිපියෙන් පරමාණුක ශක්ති අධිකාරිය විසින් අධිකාරිය ස්ථානගත කිරීම සඳහා ලබාදීමට එකඟ වූ මාලඹේ පිහිටි ඉඩමේ තක්සේරු ලබාදෙන ලෙසට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇතත් එම දෙපාර්තමේන්තුව 2014.04.21 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත්තේ,ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පවරා ගැනීමක් අනාගතයේදී සිදුවන බැවින් එම අවස්ථාවේදී තක්සේරුව ලබා දිය හැකි බවත් මෙම අවස්ථාවේදී තක්සේරුවක් කිරීම අවශ්‍ය නොවන බවත්ය.

කෙසේ වෙතත් 2014.08.14 දිනැති ලිපියෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගැනීමේ වියදම මත පදනම්ව එම අධිකාරිය විසින් ගණනය කල ඉහත කී මාලබේ ඉඩමේ වටිනාකම වශයෙන් රු.මිලියන 181 ක් වන බවත් ඉන් මේ වන විටත් ගෙවා තිබූ රු.මිලියන 50 ට අමතරව මාස 06 ක් ඇතුලත ඉතිරි ගෙවීම (රු.මිලියන 131) ගෙවීම් කර ඉඩමේ භුක්තිය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත ප්‍රාදේශීය ලේකම් මඟින් භාරගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා ඇත. ඒ අනුව 2014 සිට 2015 දක්වා වවුචර් 5 කින් රු.මිලියන 181 ගෙවීම් කර 2015.06.17 වන දින ඉහත කී මාලබේ ඉඩමේ අයිතිය එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ(මූල්‍ය) විසින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙනුවෙන් අත්සන් කර භාරගෙන ඇත.

එවකට පරමාණුක ශක්ති අධිකාරියේ රේඛීය අමාත්‍යාංශය වන තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් 2014.02.24 වන දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය(2014.03.10) සමඟ වන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිර්ක්ෂණ (ආ) යටතේ යෝජනා කර ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිලදීගැනීමට නියමිත මාලඹේ තොරතුරු තාක්ෂණ උද්‍යානය තුල පිහිටි ඉඩම සඳහා ගෙවීම් කිරීමේදී පරමාණුක ශක්ති අධිකාරිය එවකට ස්ථාපනය කර ඇති ඔරුගොඩවත්ත පිහිටි 99 අවුරුදු බදු පදනම යටතේ නාගරික සංවර්ධන අධිකාරියෙන් (UDA) ලබාගත් ඉඩමේ ඉතිරි බදු කාලයට අදාල බදු කුලී ප්‍රමාණය (පරමාණුක ශක්ති අධිකාරිය වෙත ආපසු ගෙවිය යුතු) අඩු කිරීම සුදුසු බවයි.

මීට අමතරව 2015/03/16 දින පරමාණුක බලශක්ති මණ්ඩලයේ සභාපති විසින් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති වෙත ලිපියක් යොමු කරමින් ඔරුගොඩවත්තේ පිහිටි ඉඩමට අදාල ඉතිරි වන බදු කාලයට අදාල බදු කුලිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආපසු ගෙවිය යුතු සේ සලකා එකී මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිලදී ගැනීමට නියමිත මාලබේ පිහිටි ඉඩම සඳහා ගෙවීම් සිදු කිරීමේදී අඩුකර ගන්නා ලෙස දන්වා ඇත.

ඉහත ලිපියෙන් කරන ලද ඉල්ලීම ඉටුකල නොහැකි බව දන්වමින් 2015/04/02 වන දින UDA වෙතින් පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත ලිපියක් එවා ඇත.එවක් පටන් අද දක්වාම අප ආයතනය විසින් ලිඛිතව අදාල ආයතනයන් වෙත ඉල්ලීම් සිදු කලද කිසිදු යහපත් ප්‍රතිචාරයක් අද වෙන තෙක් ලැබී නොමැත.

මෙම ඉඩම් සම්බන්ධව ගැටළු නිරාකරණය කරගන්නා තෙක් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය සහ එයට අදාල මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණ පරිදි ඉතිරි අවුරුදු 77 ක් සඳහා වූ නැවත අයවිය යුතු බදු මුදල රු.7,663,837 ත් ලැබිය යුතු මුදලක් ලෙස 2018 වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත.

නව කැළණි පාලම ඉදිකිරීම ව්‍යාපෘති කාර්යයන් සඳහා අත්කර ගනු ලැබූ මු.පි.කොට.9605 හි කැබලි අංක 2 හා 3 හි හිමිකම් සම්බන්ධව ඇතිවී ඇති ගැටළුවට අදාලව ඉහත පරිදි ගරු නීතිපතිතුමා වෙත නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද ලිපි වලට පිලිතුරු වශයෙන් නීතිපති දෙපාර්තුමේන්තුවේදි 2021.12.22 දින සාකච්ඡාවක් සඳහා කැඳවන ලදි.

ඒ සඳහා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරීන් 05 දෙනෙකු හා මා.ස. හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් තිදෙනෙකු ද සහභාගි විය. පහත (ඉ) කොටසේ විස්තර

කර ඇති පරිදි නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් පරිදි මෙම ගැටළු විසඳා ගැනීම සඳහා ඉහත ආයතන අදාල අමාත්‍යාංශ ලේකම්තුමන් සමඟ සාකච්ඡා කිරීමට හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීම සිදුකරමින් පවතී.

(ඉ) මණ්ඩලය ප්‍රතිස්ථාපනය සඳහා 30 අවුරුදු බදු පදනමින් ඉඩමක් යොදාගැනීමට අත්සන් කර තිබූ ත්‍රෛපාර්ශවික අවබෝධතා ගිවිසුම 2017-02-02 දිනෙන් ආරම්භ වී මාස 18 ක කාලයකට බලපැවැත් වූ අතර එහි වලංගු කාලය අවසන් වී ඇත.
ඉඩම් ගැටළුව නිරාකරණය කර ගැනීමට ආයතනය පහත සඳහන් පරිදි කටයුතු කරමින් සිටී.

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ප්‍රශ්නගත ඉඩම් වලට අදාල මු.පි. 9605අනුව යමින් CO/KLN/2018/797 නමැති පිඹුර රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් අනුරේඛනය කරවා ගන්නා ලදි. ඒ අනුව දැනට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම රජයේ ඉඩමක් බව තහවුරු කර ගන්නා ලදි (පිඹුරේ පිටපතක් ඇත).

- ඉන් අනතුරුව එකී ඉඩම රජයේ ඉඩමක්ද යන්න කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් වෙතින් තහවුරු කර ගැනීමක් සිදුකර ගන්නා ලදි.

- අනතුරුව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය ආදී අදාල ආයතන සමඟ මෙකී ගැටළුව නිරාකරණය කර ගැනීමට ප්‍රයත්න දැරූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අප ආයතනයේ ඉල්ලීම මත 2020.08.10 දිනැති ලිපිය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් මුලික පිඹුර 9605 හි කැබලි අංක 2, 3 හි හිමිකම් සම්බන්ධව ඇතිවී ඇති ගැටළු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලීම හා පසුව 2021-03-23 දින මාර්ග සංවර්ධන අධිකාරිය ගරු නීතිපතිතුමා වෙත සිහිකැඳවීමක් යවා ඇත. ඒ සඳහා පිළිතුරක් නොලද හෙයින් මෙම ඉඩමේ සද්භාවයේ ගැණුම්කරු වන පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ඉහත කාරණා පදනම් කරගෙනම 2021/11/05 වන දින ගරු නීතිපතිතුමා වෙත ලිපියක් යොමුකරමින් නීතිපති උපදෙස් ඉල්ලා ඇත.

- නව කැලණි පාලම ඉදිකිරීම ව්‍යාපෘති කාර්යයන් සඳහා අත්කර ගනු ලැබූ මු.පි.කෝ. 9605 හි කැබලි අංක 2 හා 3 හි හිමිකම් සම්බන්ධව ඇතිවී ඇති ගැටළුවට අදාලව ගරු නීතිපතිතුමා වෙත නීතිපති උපදෙස් සඳහා යොමු කල ලිපි වලට පිලිතුරු වශයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේදි 2021.12.22 දින සාකච්ඡාවක් සඳහා කැඳවන ලදි.

ඒ සඳහා අප ආයතනයෙන් අධ්‍යක්ෂ ජනරාල්තුමා, අධ්‍යක්ෂ/මූල්‍ය, අභ්‍යන්තර විගණක, නීති නිලධාරිනි හා නියෝජ්‍ය අධ්‍යක්ෂ/පරිපාලන හා මා.ස. හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් තිදෙනෙකු ද සහභාගි විය.

- එකී සාකච්ඡාවෙන් අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවන ලද උපදෙස් අනුව 2018-05-22 දිනැති සහ අංක 18/විවිධ (019) දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි පියවර ගැනීම සඳහා 2022/01/06 දින රේඛීය අමාත්‍යාංශයට යොමුකල ලිපිය මගින් ඉඩමට අදාල පවතින නෛතික ගැටලුව විසඳාගැනීම සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවක් ඉල්ලුම් කල අතර 2022.02.08 වන දින ඒ සම්බන්ධයෙන් රැස්වීමක් කැඳවන බව දන්වා තිබුණද එම රැස්වීම එදින නොපැවැත්විණි.

- අනතුරුව 2022.09.05 දිනැති රේඛීය අමාත්‍යාංශ ලිපියකින් දැනුම් දුන් පරිදි පරිදි මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ නීති නිලධාරිනිය සමඟ 2022.09.08 දින රැස්වීමක් පවත්වනු ලදුව, එකී

රැස්වීමේදී අමාත්‍යාංශය විසින් ලබාදුන් උපදෙස් පරිදි මෙකී ඉඩම් ගැටළුව නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත 2022.09.20 වන දින යොමු කරන ලදි.

- නැවත රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් මත අදාල අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් රැස්වීමක් කැඳවීම සඳහා 2023.01.30 දිනැති ලිපියෙන් ඉල්ලුම් කරන ලදි.

(ඊ) සමස්ථානික ජල විද්‍යා අංශයේ කටයුතු සහ එහි ප්‍රගතිය රැඳී පවතිනුයේ අදාළ ව්‍යාපෘති වල ක්ෂේත්‍ර කටයුතු සහ ඊට අනුගාමිව සිදුවන නියැදි විශ්ලේෂණ (විද්‍යාගාර කටයුතු) වල ප්‍රගතිය මත වන අතර 2020 වසර තුල පැවති කොවිඩ් වසංගත තත්වය තුල, ආයතන වසා තිබීම, රට අගුලු දමා තිබීම, ප්‍රවාහන සීමා පැනවීම ඇතුළු කරුණු හේතුවෙන් ඉහත අවශ්‍යතා සපුරාලීමට නොහැකි වී ඇත. විශේෂයෙන් පළාත් අතර ගමන් කිරීම වසංගත තත්වය හේතුවෙන් නතර කර තිබූ බැවින් දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලට ගොස් ක්ෂේත්‍ර කටයුතු සිදුකිරීමට හා නවාතැන් පහසුකම් දුෂ්කරතා මෙම තත්වයට බෙහෙවින් බලපා තිබිණ.

වසංගත තත්වය හමුවේ දිවයිනේ පාසල් දීර්ඝකාලීනව වසා තැබීම නිසා ත්‍යෂ්ටික තාක්ෂණය පිලිබඳ පාසල් වැඩමුළු ආදියද සිදුකල නොහැකි තත්වය පැවතුනි. මෙම කාලපරිච්ඡේදය තුල විදේශ පුහුණු පාඨමාලා මාර්ගස්ථ ක්‍රමයට පැවති අතර බොහෝ පාඨමාලා කල්දමන ලදි.

(උ) CRP ව්‍යාපෘති සඳහා අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මගින් අරමුදල් ලබා දෙන්නේ එම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරන ඉල්ලීමෙහි සඳහන් වියදම් සඳහා ය.

මෙම ව්‍යාපෘතිවලට අදාල පර්යේෂණ කණ්ඩායම් ඒ සඳහා දක්වන දායකත්වය මත ගෙවීමක් කරන ලෙස ඉල්ලීම් කර ඇතත් CRP ව්‍යාපෘතිය යටතේ පර්යේෂණවල යෙදෙන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා අදාල අධිකාරීන්ගෙන් අනුමැතියක් ලැබී නොමැත.

මේ අනුව ආයතනය විසින් පර්යේෂණ කණ්ඩායම් වෙත අදාල දීමනා ලබාදීමට සුදුසු ක්‍රියාපටිපාටියක් සකස් කරමින් පවතී.

CRP ව්‍යාපෘති වල ප්‍රගති වාර්තාවක් සෑම වසරකම එම ව්‍යාපෘති ප්‍රධානියා අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය වෙත ලබාදීම සිදුකරයි. එම ප්‍රගතිය මත පදනම්ව ව්‍යාපෘතිය සඳහා ඉතිරි අරමුදල් ලබා දීම සිදු කරයි.

CRP ව්‍යාපෘති ප්‍රගතිය නිර්ණය කිරීම සඳහා එම ව්‍යාපෘතිය මගින් ඉටු කරන ලද කාර්යයන්, පරිත්‍යාග ලෙස ලැබී ඇති උපකරණ වටිනාකම්, තාක්ෂණික දැනුම හා ව්‍යාපෘතිය මගින් ලැබී ඇති ප්‍රතිදානයන් යන සියල්ල පිළිබඳ විමර්ශනය කිරීම සුදුසු වේ.

CRP ව්‍යාපෘති සඳහා අදාල කාර්යයන් ඉටු කර ගැනීමට සඳහා රාජකාරි පැවරීම මත සේවයෙහි යොදවා ගන්නා බාහිර සහායකයන් වෙත දීමනාවක් ලෙස ගෙවීම් ක්‍රමවේදයක් සකසා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියට යවා ඇත.

ජෛව විද්‍යා අංශයට අයත් CRP 18066 ප්‍රතිපාදන ලැබීම් 2018 වසරෙන් අවසන් විය. එහි ඉතිරි වී ඇති මුදල් දැනට ක්‍රියාත්මක IRMS විද්‍යාගාරයේ සාම්පල විශ්ලේෂණයට අවශ්‍ය කරන රසායනික ද්‍රව්‍ය හා එහි ඇතැම් Consumables මිලදී ගැනීම් සඳහා යොදවයි. තවද ජෛව විද්‍යා අංශයට අවශ්‍ය කරන විද්‍යාත්මක උපකරණ මිලදී ගැනීම් සඳහා 2022 වසරේ යොදවා ඇත.

SRL 21090 ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලැබීම් 2022 වසරින් අවසන් වේ. දැනට ව්‍යාපෘති මුදල් යොදවා ගනිමින් පර්යේෂණ කටයුතු කරගෙන යයි.

කර්මාන්ත යෙදවුම් අංශය 2020 වසරේදී එක් ව්‍යාපෘතියක් සඳහා සහභාගී වී ඇති අතර එය 2020 දෙසැම්බර් මස අවසානයේදී සාර්ථකව නිමකර ඇත.

(ඌ) වැය ශීර්ෂ 01/03B හා 03/27 සඳහා අයවැය ප්‍රතිපාදනය සිදුකර ඇතත් අනපේක්ෂිතව ඉටුකිරීමට සිදුවූ අත්‍යාවශ්‍ය වැය හේතුවෙන් විචල්‍යන් සිදුවී ඇත.

වැය ශීර්ෂයන් 8 ක් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත කාර්යන් ඉටුකරවා ගැනීමට නොහැකිවීම සේවක මණ්ඩලය සාමාන්‍ය පරිදි රාජකාරි සඳහා නොකැඳවීම යනාදී හේතුමත විචල්‍යන් සිදුවී ඇත.

මීට අමතරව පහත සඳහන් වැය ශීර්ෂයන්වල අපේක්ෂිත වියදම් 2020 ගිණුම් වර්ෂයට අදාල වුවද පහතින් දක්වා ඇති හේතූන් මත මෙම විචල්‍යන් සිදුවී ඇත.

03/03- රු 354,149/-ක මුදලක් ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය පාරිභෝගික ද්‍රව්‍ය වැයකර ඇති නමුත් 2020-12-31 දින වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ නොවී ඇති හෙයින් නොපියවූ මිලදී ගැනීමේ අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කර ඇත.

මෙයට අමතරව ,2020 වසර තුලදී ආනයනය කරන ලද TLD අයිතමවල 2020.12.31 දිනට ඉතිරි තොග ශේෂය රු.7,770,997/-ක් අවසාන තොගය වශයෙන් ජංගම වත්කමක් යටතේ ගිණුම්ගත කර ඇත.

09/07-2020 වසර සඳහා ආදායම් බදු සඳහා බැරකමක් ඇති වී නොමැත.

ඉදිරියේදී හැකිතාක් ප්‍රතිපාදනයන් හා තත්‍ය වියදම් අතර විචල්‍යතාවයන් අවම වන පරිදි කටයුතු කිරීමට උපදෙස් අදාල අංශ ප්‍රධානීන්ට ලබාදී ඇත.

(එ) පිලිගනිමි. ආයතනය සඳහා (SOR) බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරගන්නා තුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අදාල පුරප්පාඩු පිරවීම තාවකාලිකව නවත්වන ලෙසට දන්වන ලදි. 2021-12-31 වන දින SOR සඳහා අනුමැතිය ලබාගත්තද 2021/2022 වසරවල පුරප්පාඩු පිරවීමට අයවැය දෙපාර්තමේන්තු 3/2022 චක්‍රලේඛ හා PED 3/2022 පරිදි ගැටළුකාරී වී ඇත.

පවතින කාර්ය මණ්ඩලය මඟින් රාජකාරී කලමනාකරණය කරගන්නා ලෙසටත් පුරප්පාඩු පිරවීම මෙම වසරවල සිදු නොකරන ලෙසට ලිපියේ පිටපතක් 2022-06-21 දිනැති DMS/1725/VOll.V ලිපියෙන් MSD ආයතනය දැනුම් දී ඇත.



.....

සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය